# 01

# ක්‍රි. ව. 11 වන සියවසේ සිට ක්‍රි. ව. 15 වන සියවස දක්වා ඓතිහාසික තොරතුරු



**හැඳින්වීම**

**අනුරාධපුර රාජධානිය බිඳ වැටීමට බලපෑ හේතු සාධක, පොළොන්නරු රාජධානියේ ආරම්භය, එහි දේශපාලන, සමාජ හා ආර්ථික තොරතුරු හා බිඳ වැටීම, රාජධානිය නිරිත දිග ප්‍රදේශවලට සංක්‍රමණය වීම, එම රාජධානිවල දේශපාලන, සමාජ හා ආර්ථික තොරතුරු මෙම පාඩමෙන් ඔබට ඉගෙනගත හැකිය.**

## 1.1 අනුරාධපුර රාජධානියේ බිඳවැටීම

අනුරාධපුරය සියවස් 15ක් පමණ කාලයක් තුළ ලංකාවේ පාලන මධ්‍යස්ථානය විය. මෙහි ආරම්භක පාලකයා පණ්ඩුකාභය රජු ලෙස සැලකෙන අතර අවසන් පාලකයා වූයේ පස්වන මිහිඳු රජු ය.

මෙම රාජධානියේ පරිහානියට හා බිඳවැටීමට බලපෑ හේතු සාධක ගණනාවක් ඇති බව මූලාශ්‍රය පරිශීලනයෙන් හෙළි වේ. ඒවා අතර පහත සඳහන් කරුණු ප්‍රධාන වේ:

- ❖ සිංහාසනය සඳහා මෞර්ය (මෝරිය) හා ලම්බකර්ණ වංශ දෙක අතර ඇති වූ යුද්ධ
- ❖ අනුරාධපුර රාජධානියේ අග භාගයේ සිහසුනට පත් පාලකයන්ගෙන් බොහෝ දෙනෙකු දුර්වලයන් වීම
- ❖ අනුරාධපුර රාජධානියේ අග භාගයේ පාලකයින් අනුගමනය කළ විදේශීය ප්‍රතිපත්තිය
- ❖ වාරි කර්මාන්තය හා කෘෂිකර්මාන්තය බිඳ වැටීම
- ❖ බිඳවැටීමට ආසන්නතම හා ප්‍රධානතම හේතුව ලෙස සැලකෙන්නේ චෝළ ආක්‍රමණය යි.

අනුරාධපුර සිංහාසනය සඳහා මෞර්ය හා ලම්බකර්ණ වංශ දෙක අතර නිරන්තර අරගල පැවතිණ. එක් පෙළපතකට හෝ දීර්ඝ කාලයක් සිංහාසනය හිමි කර ගෙන කටයුතු කළ නොහැකි විය. එම නිසා දීර්ඝ කාලයක් එක් පෙළපතක් බලයේ රැඳී සිටිමින් තම ප්‍රතිපත්ති ඉදිරියට පවත්වාගෙන යාමට නොහැකි විය. ඇතැම් අවස්ථාවල එක් පෙළපතක් බලයෙන් පහ කිරීම පිණිස අනෙක් පෙළපත ඉන්දීය කුලී හමුදාවන්ගේ සේවාව ලබා ගත්තේ ය. මෙලෙස ඉන්දීය ආධාරයෙන් මෙරට බලයට පත් පළමු පාලකයා ඉලනාග ය. මෞර්ය වංශයට එරෙහිව ලම්බකර්ණ වංශිකයන් පළමුවරට නැගී සිටින්නේ මේ රජුගේ රාජ්‍යය කාලයේ දී ය. එම නිසා සිංහාසනය අතහැර ඉන්දියාවට පලා යාමට ඉලනාගට සිදු විය. එසේ ම පළමුවන මුගලන් රජු හා මානවම්ම වැනි පාලකයින් ද ඉන්දීය කුලී හමුදාවන්ගේ ආධාර ලබා ගෙන ඇත. මෙසේ ඉන්දීය කුලී හමුදාවන්ගේ සහාය ලබා ගැනීම මෙම රාජධානිය කෙරෙහි අනර්ථකාරී ලෙස බලපෑවේය. ලංකාවට පැමිණි කුලී හමුදා සේනාංක ඇතැම් විට ලංකාව අතහැර නොගොස් උතුරු ප්‍රදේශවල පදිංචි වූහ. ඒ සමගම උතුරු ප්‍රදේශවල දෙමළ ජනාවාස බිහි විය. ඉන්දීය ආක්‍රමණ එල්ල වූ අවස්ථාවන්හි මෙම දමිළයන්ගේ සහාය, ලාංකික පාලකයාට නොව ආක්‍රමණිකයන්ට ලැබුණු අවස්ථා දක්නට ලැබේ. මේ තත්වය හේතු කොට ගෙන අනුරාධපුර රාජ්‍යය දුර්වල වන්නට විය.

අනුරාධපුර යුගයේ අවසන් වැදගත් පාලකයා හතරවන මහින්ද රජු ලෙස සැලකිය හැකිය. මොහුගෙන් පසු බලයට පත් වූ පස්වන සේන හා පස්වන මිහිඳු යන රජවරු දුර්වල පාලකයෝ වූහ. මෙම පාලකයින් තම වගකීම් හරිහැටි අවබෝධ කර ගෙන නොසිටි බව විවිධ කරුණුවලින් අනාවරණය වේ. මෙකල ඈත ප්‍රදේශවල ජනයා බදු ගෙවීමෙන් පවා වැලකී සිටියහ. රාජ්‍යයක් පවත්වාගෙන යාමේ දී ජනතාවගෙන් අය කර ගන්නා බදු වැදගත් වේ. ජනතාව බදු ගෙවීම පැහැර හැරිය විට රාජ්‍යය ද පරිහානියට පත් වෙයි. දුර්වල පාලකයින් බලයට පත් වීම මගින් මධ්‍යම රාජ්‍ය පාලනය ද පරිහානියට පත් වේ. එවිට ප්‍රාදේශීය පාලනය බලවත් වේ. මෙම තත්වය ද රාජ්‍ය පරිහානියට හේතු විය.

අනුරාධපුර රාජධානියේ අවසන් සියවස් දෙක තුළ පාලකයින් අනුගමනය කළ විදේශීය ප්‍රතිපත්තිය ද රාජධානියේ පරිහානියට බලපෑ බව පෙනේ. දකුණු ඉන්දියාව තුළ ලාංකේය පාලකයන්ගේ හිතවත් ම පිරිස වූයේ පල්ලවයන් ය. පාණ්ඩ්‍යයන්ට හා චෝළයන්ට විරුද්ධව ලංකාවේ රජු පල්ලවයන්ට උදව් කර ඇත. මෙය අනර්ථකාරී ප්‍රතිඵලද ගෙන දුන්නේ ය. මානවම්ම දකුණු ඉන්දියාව තුළ පල්ලවයන් හා එක් ව පාණ්ඩයන්ට එරෙහිව සටන් කළ බැවින් පාණ්ඩ්‍ය අධිරාජයෙකු වූ ශ්‍රී මාර ශ්‍රී වල්ලභ ලංකාව ආක්‍රමණය කළේ ය. පාණ්ඩ්‍ය පාලකයෙකු වූ දෙවන වරගුණවර්මන් රැගෙන ආ පාණ්ඩ්‍ය රාජ කකුධ භාණ්ඩ ආරක්ෂා කිරීම සඳහා හතරවන දප්පුල රජ මෙහි තබා ගත්තේය. එම නිසා චෝළ පාලකයෙකු වූ පරන්තක, පාණ්ඩ්‍ය රාජ කකුධ භාණ්ඩ රැගෙන යාම පිණිස ලක්දිව ආක්‍රමණය කර ඇත. මෙම තත්වය ද අනුරාධපුර රාජධානිය පිරිහීමට හේතු වී ඇත.

ඕනෑම රාජ්‍යයක ශක්තිමත් බව රඳා පවතින්නේ ආර්ථික ශක්තිය මත ය. අනුරාධපුර රාජධානියේ ආර්ථිකය ගොඩනැගී තිබුණේ කෘෂිකර්මාන්තය පදනම් කරගෙනයි. මෙරට කෘෂිකර්මාන්තය, වාරිමාර්ග පද්ධතිය සමඟ බැඳී පවතින්නකි. සාමාන්‍ය ජනතාව පාලකයාගෙන් බලාපොරොත්තු වූයේ වාරි කර්මාන්ත ඉදි කරමින් ආර්ථිකයට අනුග්‍රහයක් දැක්වීමයි. වසභ, මහසෙන් හා ධාතුසේන වැනි පාලකයින් වැව්, ඇළ මාර්ග හා අමුණු ඉදි කරමින් රාජ්‍ය අනුග්‍රහය ලබා දුන් අතර අවසන්වරට අනුරාධපුර රාජධානියෙහි වාරි කර්මාන්තයක් ඉදි කළ බවට තොරතුරු දක්නට ඇත්තේ හතරවන මහින්ද රජුගේ කාලයේ දී ය. ඉන් පසු වාරි කර්මාන්ත ඉදි කළ බවට හෝ ප්‍රතිසංස්කරණය කළ බවට සාක්ෂ්‍ය දක්නට නොමැත. වාරිමාර්ග පද්ධතිය රජරට ජීවනාලිය බඳු ය. මෙම වාරිමාර්ග පද්ධතිය නොසලකා හැරීම රටේ ආර්ථිකය බිඳ වැටීමට ඉවහල් වූ කරුණකි.

අනුරාධපුර රාජධානිය පරිහානියට සහ බිඳ වැටීමට බල පෑ ප්‍රධානතම හේතු සාධකය ලෙස රාජධානියේ අවසන් ශතවර්ෂයේ ඇති වූ දකුණු ඉන්දීය ආක්‍රමණ සැලකිය හැකි ය. රාජධානියේ මුල් භාගයේ සිට ම දකුණු ඉන්දීය ආක්‍රමණ එල්ල විය. ලංකාව දකුණු ඉන්දියාවට ආසන්න වීමත් දුර්වල පාලකයින් බලයට පත් වීමත් ලංකාවේ ආර්ථික සමෘද්ධියත් දකුණු ඉන්දීය ආක්‍රමණ මෙරටට එල්ල වීම කෙරෙහි බල පෑ මූලික සාධක ලෙස සැලකිය හැකි ය.

## 1.2 රජරට චෝළ පාලනය

ක්‍රි. ව. 10 වන ශතවර්ෂය පමණ වන විට චෝළයෝ දකුණු ඉන්දියාවේ අධිරාජ්‍යයක් ගොඩනගමින් සිටියහ. මහා රාජරාජ, තම අධිරාජ්‍යය උතුරු දෙසින් තුංග භද්‍ර නදිය දක්වා ද නැගෙනහිරින් මහා නදිය දක්වා ද ව්‍යාප්ත කළේ ය. මොහු ලංකාවේ එකල පැවැති දේශපාලන අර්බුදවලින් ප්‍රයෝජන ගෙන 993 දී පමණ රජරට කොල්ල කෑවේය. අනුරාධපුරය විනාශ කර එය අල්ලාගත් අතර, තම පාලන මධ්‍යස්ථානය පොළොන්නරුවට ගෙන ගොස් එයට ජනනාථපුරම් යන නම තැබීය. 1017 දී රජරට ආක්‍රමණය කළ ඔහුගේ පුත් පළමුවන රාජේන්ද්‍ර රජු විසින් පස්වන මිහිඳු රජ සිරකරුවෙකු ලෙස ඉන්දියාවට රැගෙන යන ලදී. මුන්මුඩි චෝළ මණ්ඩලම් යනුවෙන් එකල හැඳින් වූ ලංකාව මෙලෙස චෝළ අධිරාජ්‍යයට යටත් විය.

චෝළ අධිරාජ්‍යයෙහි පාලකයා වෙනුවෙන් රජරට ප්‍රදේශය පාලනය කළේ චෝළ අධිරාජයා පත් කර එවනු ලැබූ ප්‍රතිරාජයෙකු විසිනි. ඔහු හමුදා සේනාපතියෙකි. චෝළයන් යටතේ රජරට පාලන තන්ත්‍රය තුළ ඉහළ තනතුරු සඳහා පත් කරනු ලැබුවේ දමිළ නිලධාරීන් යැයි විශ්වාස කළ හැකි ය. චෝළයින් මෙරට වස්තු සම්පත් ඉන්දියාවේ ප්‍රයෝජනය සඳහා ගෙන ගොස් තිබේ. පළමුවන රාජරාජ රජු ලංකාවේ ගම්බිම් කිහිපයක් දකුණු ඉන්දියාවේ පිහිටි දේවාලයකට ගම්වර ලෙස ප්‍රදානය කිරීම උදාහරණයක් ලෙස දැක්විය හැකිය. රජරට චෝළ පාලකයින් තම ආගමික අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සඳහා මෙරට විවිධ ප්‍රදේශවල දේවාල ඉදි කොට තිබේ. පොළොන්නරුව, කන්තලේ, මන්නාරම යන ප්‍රදේශ ඒ අතර ප්‍රධාන වේ. මේවා වර්තමානය දක්වාම ආරක්ෂිතව පවත්නා වාස්තු විද්‍යාත්මක නිර්මාණ ලෙස සැලකිය හැකි ය. චෝළයින් බෞද්ධ විහාරයකට ද තම අනුග්‍රහය දක්වා ඇත. එය රාජරාජ පෙරුම්පල්ලි ලෙස හැඳින්වේ. එය ත්‍රිකුණාමලයේ පිහිටි වෙල්ගම් වෙහෙර යි. චෝළ පාලකයින් යටතේ රජරට ප්‍රදේශය 1017 සිට 1070 දක්වා පමණ පාලනය විය.

## 1.3 පොළොන්නරු රාජධානිය (1017 - 1215)

### 1.3.1 පොළොන්නරු රාජ්‍යයේ ආරම්භය

අනුරාධපුරය රාජධානිය බිඳ වැටීමෙන් පසු ආරම්භ වූ රාජධානිය පොළොන්නරුව වේ. එය ශත වර්ෂ දෙකකට සීමා විය.

පොළොන්නරු රාජධානිය පුලතිසිපුර, කඳවුරු නුවර, ජනනාථපුරම් ආදී නම් වලින් ද හඳුන්වා ඇත.


අනුරාධපුර යුගයේ සිටි පාලකයින් කිහිප දෙනෙකු තම අවසන් කාලය පොළොන්නරුවේ ගත කළත් එය පාලන මධ්‍යස්ථානයක් ලෙස තෝරා ගනු ලැබුවේ චෝළයන් විසින් ය.

### 1.3.2 චෝළයින් පොළොන්නරුව රාජ්‍ය මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීමට තුඩු දුන් හේතු

- ❖ රෝහණයත්, අනුරාධපුරයත් අතර ගමන් මාර්ගයේ පිහිටා තිබීම
- ❖ පොළොන්නරුව මහවැලි ගඟ ආශ්‍රිතව පිහිටි නගරයක් වීම
- ❖ චෝළ ආධිපත්‍යයට එරෙහිව රෝහණයෙන් එල්ල විය හැකි විරෝධතා පාලනය කිරීමේ පහසුව
- ❖ කෘෂිකර්මාන්තය අතින් වැදගත් සශ්‍රීක ප්‍රදේශයක් වීම
- ❖ චෝළ අධිරාජ්‍යයට අයත් සමුද්‍රාශ්‍රිත ප්‍රදේශ පාලනය කිරීමට පහසු ගෝකණ්ණ වරාය අසල පිහිටා තිබීම

### 1.3.3 පොළොන්නරු රාජධානිය පාලනය කළ ශ්‍රේෂ්ඨ පාලකයන් තිදෙනෙක් වෙති.

- ❖ පළමුවන විජයබාහු
- ❖ පළමුවන පරාක්‍රමබාහු
- ❖ කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල




**සිතියම 1.1**

**උපුටා ගැනීම: කුඩාවැල්ලේ කල්‍යාණවංශ ධීරානන්ද හිමි, ශ්‍රී ලංකාවේ ඓතිහාසික භූමි සිතුවම්.**

### 1.3.4 පළමුවන විජයබාහු රජු (1055 - 1110)

චෝළ අධිරාජ්‍යය සමග යුද්ධ කොට ස්ව ශක්තියෙන් ශ්‍රී ලංකාව ඒකච්ඡත්‍ර කළ අභිමානවත් රජෙකි. මෙම රජතුමාගේ පාලන කාලය අවධි දෙකකින් යුක්ත ය.

- ❖ රෝහණයේ පාලකයා ලෙස කටයුතු කළ අවධිය
- ❖ සමස්ත දිවයිනම පාලනය කළ අවධිය

පළමුවන විජයබාහු රජු රාජ්‍යයට පත්වීමට පෙර හැඳින්වූයේ කිත්ති නමිනි. ඔහු ලංකාවේ සිංහාසනයට උරුමයක් තිබූ අයෙකි. මොහුගේ පියා වන මොග්ගල්ලාන සාමි හෙවත් මුගලන් අනුරාධපුරයේ මානවම්ම රජ පෙළපතට අයත් පුද්ගලයෙකි. මව ලෝකිතා නම් වූ අතර ඇය අනුරාධපුරයේ දාඨෝපතිස්ස පෙළපතට අයත් වූවා ය.

මෙතුමා ඉන්දියාවේ කාලිංග දේශයෙන් තිලෝකසුන්දරී නමැති කුමාරිකාවක විවාහ කර ගත්තේ ය. ඇයට සුභද්දා, සුමිත්තා, ලෝකනාථ, රත්නාවලී හා රූපවතී යනුවෙන් දියණිවරුන් පස් දෙනෙක් ද වික්‍රමබාහු යනුවෙන් පුතෙක් ද වූහ. මෙම රජුගේ සහෝදරිය වූ මිත්තා කුමරියට මනාභරණ, කිත්තිරිමේඝ හා සිරිවල්ලභ යනුවෙන් පුතුන් තිදෙනෙක් වූහ.

සතුරන්ගෙන් ආරක්ෂා කරමින් ළාබාල කිත්ති කුමරු හා පියා වූ මුගලන් ඇතුළු රජ පවුලට උපකාර කළ බුදල්නා හෙවත් බුද්ධරාජ නම් රුහුණු ජන ප්‍රධානියෙකු පිළිබඳ තොරතුරු පනාකඩුව තඹ සන්නසෙන් අනාවරණය වේ. විජයබාහු රජුගේ ළමා කාලය පිළිබඳව ද තොරතුරු ඇතුළත් මෙය ඉතා වැදගත් අභිලේඛනයකි.

#### 1.3.4.1 පළමුවන විජයබාහු හෙවත් කිත්ති කුමරුගේ දේශපාලන කාර්ය සාඵල්‍යය

රුහුණු කතරගම ප්‍රදේශයේ ලෝකේශ්වර නම් වූ ප්‍රාදේශීය නායකයෙක් බලයට පත් ව සිටියේ ය. මොහුගෙන් පසු කේශධාතු කාශ්‍යප නමැත්තෙක් බලයට පත් වූයේ ය. මුල දී ඉහත සඳහන් බුද්ධරාජ මොහුට සේවය කළේය. ඔවුන් දෙදෙනා අතර ඇති වූ මතභේදයකින් බුද්ධරාජ, කිත්ති කුමරුට එක් විය.

චෝළ හමුදාවක් කේශධාතු කාශ්‍යපට පහර දුන් අතර එම අවස්ථාව උපයෝගී කර ගෙන බුද්ධරාජ හා කිත්ති කුමරු කාශ්‍යප පරාජය කර මුළු රුහුණු ප්‍රදේශය ම එක්සත් කළහ. කිත්ති කුමරු මහානාගහුල පාලන මධ්‍යස්ථානය කර ගනිමින් රුහුණු දේශයේ ආදිපාද තනතුරට පත් විය.

මෙම තත්වය නොඉවසූ චෝළ පාලකයා ශක්තිමත් සේනාවක් කැටුව රුහුණ ආක්‍රමණය කළේ ය. චෝළ හමුදාව පරාජය කළ නොහැකි බව දැනගත් කිත්ති සතුරාට මුහුණ නොදී කඳුකරයට (මලය දේශයට) පසු බැස්සේ ය.

මෙසේ වරින් වර චෝළ සේනාවට මුහුණ දෙමින් ආරක්ෂිත ස්ථාන කරා පසු බසිමින් කිත්ති සාර්ථක ලෙස චෝළ සේනාවට පහර දීමේ ක්‍රියාවලියක් ඇරඹීය. මේ අතර ඉන්දියාවේ චෝළ බලය පිරිහීමේ ප්‍රවණතාවක් ඇති විය. රජරට ද චෝළ විරෝධී කටයුතු ඇරඹිණි. දිවයිනෙහි උත්සන්න වෙමින් පැවති චෝළ විරෝධය පිළිබඳ තොරතුරු දැන ගත් චෝළ අධිරාජයා එය මැඩ පැවැත්වීමට වරින් වර ප්‍රබල හමුදාංක මෙරටට එවීය. මෙසේ විවිධ දුෂ්කරතා මධ්‍යයේ කිත්ති කුමරු මහානාගහුල සිට රජරටට පහර එල්ල කිරීමට සමත් විය. එක් බල ඇණියක් දක්ඛිණදේශය හරහා අනුරාධපුරයට හා මහාතිත්ථයට යැවී ය. අනෙක් බල ඇණිය නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශ ඔස්සේ ගමන් කර පොළොන්නරුවට පහර දීමට යෙදෙව්වේය. තෙවන බල ඇණිය මාගම හා බුත්තල පසුකොට මහවැලි ගඟ ඔස්සේ ගමන් කොට දහස්තොටින් එගොඩ වී පොළොන්නරුවට පහර දුන්නේ ය. මෙය කිත්ති විසින්ම මෙහෙයවන ලදී.

මහාතිත්ථ වරාය යටත් කර ගැනීමට පළමුවන බලඇණිය සමත් වූ නිසා චෝළ දේශයෙන් ආධාර සේනා ඒම වැළැක්විය හැකි විය. අනුරාධපුරය බලා ගමන් ගත් සේනාව අනුරාධපුරය යටත් කර ගත්හ.

වසර 53ක් පමණ (1017 - 1070) කාලයක් චෝළයින්ට යටත් ව පැවති රජරට මෙසේ නිදහස් කොට එක්සත් කිරීමට විජයබාහු රජ සමත් වූයේ ය.

අනුරාධපුරයේ තාවකාලික ව ඉදි කරන ලද රාජ මාලිගයක දී විජයබාහු රජ තම අභිෂේක මංගල්‍යය පැවැත්වුවත් රාජ්‍ය මධ්‍යස්ථානය ලෙස තෝරා ගත්තේ පොළොන්නරුවයි.

අනුරාධපුරය නොසලකා හැර පොළොන්නරුව තෝරා ගැනීමට හේතු වූයේ පහත සඳහන් කරුණු ය.

- ❖ රෝහණය ඇතුළු සියලු ප්‍රදේශ පාලනය කිරීම පහසු වීම
- ❖ අඩසියවසකට වැඩි කාලයක් අනුරාධපුර ප්‍රදේශය වල්බිහිවී තිබීම




**සිතියම 1.2**

**උපුටා ගැනීම: කුඩාවැල්ලේ කල්‍යාණවංශ ධීරානන්ද හිමි, ශ්‍රී ලංකාවේ ඓතිහාසික භූමි සිතුවම්.**

- අනුරාධපුරය හා ඒ අවට දෙමළ ජනාවාස බිහිවී තිබීම
- පොළොන්නරුව ආශ්‍රිතව ගෝකණ්ණ වරාය පිහිටීම
- අනුරාධපුර නගරය නටබුන් ව තිබූ අතර පොළොන්නරුව අගනුවරක් වශයෙන් දියුණු ව පැවතීම

පළමුවන විජයබාහු රජු තමාගෙන් පසු සිංහාසනය සඳහා ගැටුමක් ඇති නොවන ආකාරයට සහෝදරයින්ට තනතුරු බෙදා දුන් බව පෙනේ.

ඊට අනුව, මහාදිපාද (යුවරාජ) තනතුර ද දක්ඛිණ දේශයේ පාලනය ද කනිටු සොහොයුරු වීරබාහුට ලබා දුන්නේ ය. ආදිපාද ධුරය සමගින් රෝහණයේ පාලනය බාලම සොහොයුරා වූ ජයබාහුට භාර කළේය.

**1.3.4.2 පළමුවන විජයබාහු රජු දවස පරිපාලනයේ පහසුව සඳහා පාලන ඒකක තුනක් තිබුණේ ය**

- රජරට
- දක්ඛිණදේශය
- රෝහණය

**1.3.4.3 පළමුවන විජයබාහු රජුගේ ආර්ථික සංවර්ධනය**

- අඩසියවසකට වැඩි කාලයක් ප්‍රපාතයට වැටී තිබූ ප්‍රදේශවල ආර්ථිකය ගොඩනැගීම
- මහකනදරාව, නාච්චදූව, මාළුළිය, ඉනාමලුව, වලාහස්ස, මින්නේරිය, පණ්ඩවාපී ආදී වැව් ප්‍රතිසංස්කරණය කිරීම
- වැව් හා ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කොට වාරිමාර්ග පද්ධතිය පුනරුත්ථාපනය කිරීමට උත්සාහ දැරීම
- බුදුගුණ වැව නමින් අභිනවයෙන් වැවක් තැනීම
- වෙළෙඳාම දියුණු කිරීම සඳහා විදේශීය ප්‍රතිපත්තියක් හඳුන්වා දීම
- බුරුමයේ අනුරුද්ධ රජු සමග ආර්ථික සම්බන්ධතා ඇති කිරීම
- භාණ්ඩාගාරය ශක්තිමත් කිරීම සඳහා අයබදු රැස් කිරීම විධිමත් කිරීම

### 1.3.4.4 පළමුවන විජයබාහු රජුගේ ආගමික කටයුතු

- උපසම්පදාවට අවශ්‍ය ගණ පූරණය නොතිබූ නිසා උපසම්පදාව නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා බුරුමයේ අනුරුද්ධ රජුගෙන් අවශ්‍ය ආධාර පළමුවන විජයබාහු රජු විසින් ඉල්ලා සිටින ලදී. ඊට අනුව බුරුමයෙන් වැඩමවාගත් භික්ෂූන් වහන්සේලා ලවා නැවත ලක්දිව උපසම්පදාව පිහිටුවීම.

- මහාබෝධි විහාරය, දඹකොළ විහාරය, ගිරිදණ්ඩන විහාරය, ජම්බුකෝළ ලෙණ (දඹුල්ල) මණ්ඩලගිරිය (මැදිරිගිරිය), මහියංගණය, කාසගල්ල විහාරය ආදී විහාර ප්‍රතිසංස්කරණය කිරීම.

- ග්‍රාමවාසී නිකායට මෙන් ම වනවාසී නිකායට ද මෙතුමා අනුග්‍රහය දැක්වීය. (සිරිමණ්ඩගල්ල ග්‍රාමය, සංඝාට ග්‍රාමය, අන්තර විට්ඨි ග්‍රාමය යන ගම් වනවාසී නිකායට පූජා කොට තිබේ)

- පොළොන්නරුවෙහි දළදා මැදුරක් ඉදිකොට වාර්ෂිකව දළදා පූජෝත්සවය පැවැත්වීම

## 1.4 පළමුවන විජයබාහු රජුගෙන් පසු දේශපාලනය

පළමුවන විජයබාහු රජතුමාගේ මරණින් පසුව පළමුවන ජයබාහු රජරට රාජ්‍යයට පත් විය. දක්ඛිණ දේශයේ පාලනය සමග මිත්තා කුමරියගේ පුත් මානාභරණට දෙන ලදී. පළමුවන වික්‍රමබාහුට රෝහණය හිමි විය.

| | | |
|---|---|---|
| **රජරට** | **-** | **පළමුවන ජයබාහු** |
| **දක්ඛිණ දේශය** | **-** | **මානාභරණ** |
| **රෝහණය** | **-** | **පළමුවන වික්‍රමබාහු** |

## ක්‍රියාකාරකම්

1. අනුරාධපුර රාජධානිය පිරිහීමට බලපෑ හේතු සාධක ලැයිස්තුගත කරන්න.
2. පොළොන්නරු රාජධානියේ ආරම්භක පාලකයා නම් කරන්න.
3. පොළොන්නරු රාජධානිය හඳුන්වන ලද නම් තුනක් ලියන්න.



## 1.5 මහා පරාක්‍රමබාහු (හෙවත් පළමුවන පරාක්‍රමබාහු) රජු (1153 - 1186)

කිත්සිරිමෙවන් රජු ඇවෑමෙන් දක්ඛිණ දේශයේ පාලකයාවීම පරාක්‍රමබාහු කුමරුගේ දේශපාලන කාර්යයේ පළමු අදියර යි. දිවයින එක්සේසත් කිරීමේ දීර්ඝ කාලීන සැලැස්මේ මූලාරම්භය සකස් වූයේ දක්ඛිණ දේශයේ දී ය.

දක්ඛිණ දේශයේ පාලන මධ්‍යස්ථානය වූයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ හෙට්ටිපොල ආසන්නයේ පිහිටි වර්තමාන පඬුවස්නුවර ය. එය පරාක්‍රමපුර යනුවෙන් නම් කෙරිණි. මෙහි ඉදි කළ රජමාලිගාවේ නටබුන් අද පවා දැකිය හැකි ය. පණ්ඩවාපී නම් වැව විශාල කිරීම මගින් ප්‍රදේශයට ජල පහසුව සලසා දී ඇත.

රජරට යටත් කර ගැනීම ඔහුගේ අරමුණ වූ අතර එහි පළමු පියවර ලෙස රජරට රාජ්‍යයට අයත් වූ මලය දේශය යටත් කර ගත්තේ ය. ඒ සඳහා රක්ඛ නමැති ප්‍රාදේශීය පාලකයාගේ සහාය ද ලබා ගැනීමට හැකි විය.

මේ සඳහා මලයරායර්, නගරගිරි හා මහින්ද වැනි සේනාපතීන්ගේ සහාය ලැබිණ. සටන් පැවති ප්‍රදේශ ලෙස උත්තර රට්ඨ, කලාවැව, ලග්ගල වැනි ස්ථාන වංශ කථාවේ සඳහන් වී ඇත.

මීළඟ ප්‍රයත්නය වූයේ පොළොන්නරුව අල්ලා ගැනීම යි. එම කාලය වන විට පොළොන්නරුව පාලනය කළේ දෙවන ගජබාහු රජු විසිනි. පරාක්‍රමබාහු විසින් පොළොන්නරුව ආක්‍රමණය කරන ලදී. එහි දී දෙවන ගජබාහු බලකොටුවක් තුළ සැඟ වුණ ද පරාක්‍රමබාහුගේ සේනාවට හසු විය.

සංගමු විහාර සෙල්ලිපියේ සඳහන් පරිදි දෙවන ගජබාහු හා පරාක්‍රමබාහු අතර සමගි සන්ධානයක් ඇති විය. ඊට අනුව ගජබාහු රජුගෙන් පසු රාජ්‍යය පරාක්‍රමබාහුට ලැබෙන පරිදි ඔවුහු ගිවිසුමක් අත්සන් කළහ.

දෙවන ගජබාහු රජු මිය ගිය පසු රුහුණු පාලකයා වූ මානාභරණ ද පොළොන්නරු රාජ්‍යය ලබා ගැනීමට උත්සාහ කළ ද එය අසාර්ථක කිරීමට පරාක්‍රමබාහු රජුට හැකි විය. මෙසේ විවිධ සටන්වලට මුහුණ දෙමින් පරාක්‍රමබාහු රජු මුළු දිවයිනෙහි ම පාලකයා බවට පත් වූයේ ය.

### 1.5.1 පරාක්‍රමබාහු රජුගේ ආර්ථික කටයුතු

දිවයිනේ ආර්ථිකය දියුණු කිරීම සඳහා වාරිමාර්ග කටයුතු රාශියක් මෙතුමා විසින් කරන ලදී. ඒවා පහත සඳහන් ලෙස අදියර දෙකකට බෙදා දැක්විය හැකිය.

- ❖ දක්ඛිණ දේශයේ පාලකයාව සිටි අවධියේ දී කරන ලද වාරිමාර්ග
- ❖ දිවයිනේ ම පාලකයා වීමෙන් පසු කරන ලද වාරිමාර්ග

දක්ඛිණ දේශය සංවර්ධනය කිරීම සඳහා මෙතුමා සිදු කළ වාරිමාර්ග කටයුතු වංසකථාවේ සවිස්තර ලෙස දැක් වේ. එහිදී **''අහසින් වැටෙන එක දිය බිඳකුදු ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යාමට ඉඩ නොදිය යුතු ය''** යන්න පැවසූ එතුමා දැදුරු ඔය හරස් කර අමුණු බැඳීමට හා කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළේ අස්වද්දා එම ප්‍රදේශය සරුසාර ගොවි බිමක් කිරීමට කටයුතු කළේ ය. දැදුරු ඔයේ ජලයෙන් ප්‍රයෝජන ගැනීම උදෙසා එතුමා එහි ස්ථාන තුනක අමුණු බඳවා ජලප්‍රවාහන ව්‍යාපාර තුනක් ආරම්භ කළේ ය. ඒවා, කොට්ඨ බද්ද, සූකර්නිජ්ජර, දෝරදත්තික යනුවෙන් වංසකථාවේ සඳහන් වේ.



රූපය 1.1 පරාක්‍රම සමුද්‍රය

මෙතුමාගේ වාරිමාර්ග කටයුතු අතර වැදගත් ම කාර්යය ලෙස දැක්විය හැක්කේ පොළොන්නරුවේ පරාක්‍රම සමුද්‍රය ඉදි කිරීම යි. එය දෙවන අදියරේ දී කරන ලද්දකි. ලංකාවේ විශාලතම වැව් අතරින් එකක් වන මෙම ජලාශය ඉදි කර ඇත්තේ තෝපා, දුඹුටුලු හා එරමුදු යන වැව් එක් කිරීමෙනි. මෙයට ජලය ලබා ගෙන ඇත්තේ අඹන් ගඟේ අංගමැඩිල්ල නම් ස්ථානයක අමුණක් බැඳීමෙනි. අමුණෙහි ජලය අංගමැඩිල්ල ඇළ දිගේ වැවට ගලා යාමට සලස්වා ඇත.

තිස්තුන් වසරක රාජ්‍ය කාලය තුළ එතුමා විසින් අමුණු 165ක් ද ඇළවල් 3910ක් ද මහවැව් 163ක් ද කුඩා වැව් 2376ක් ද කරවන ලද බව වංසකථාවේ සඳහන් වේ.

ප්‍රතිසංස්කරණය කරන ලද වැව් අතර, මින්නේරිය වැව, කලා වැව, නාච්චදූව වැව, ගිරිතලේ වැව, මහකනදරා වැව, යෝධ වැව, මහගල්කඩවල වැව, පදවිය වැව, අංගමු වැව, කවුඩුලු වැව, කණ්ඩලම වැව, උරුවෙල වැව, පාඩික්කුලම් වැව ආදිය සඳහන් කළ හැකි ය.

### 1.5.2 පළමුවන පරාක්‍රමබාහු රජුගේ ආගමික කටයුතු

පළමුවන පරාක්‍රමබාහු රජුගේ වැදගත් ම ආගමික සේවාව වශයෙන් සැලකිය හැක්කේ, එවකට කොටස් තුනකට බෙදී තිබූ සසුන එක් නිකායක් බවට පත් කිරීම යි. මේ සඳහා දිඹුලාගල මහා කාශ්‍යප හිමියන්ගේ මූලිකත්වයෙන් ශාසන ශෝධනයක් ඇති කොට කතිකාවතක් පිහිටුවා තිබේ. එය පොළොන්නරු කතිකාවත ලෙස හැඳින් වේ. මෙය පොළොන්නරුවේ ගල් විහාර පර්වතයේ කොටා ඇත.



රූපය 1.2 පොළොන්නරුව කිරි වෙහෙර

රුහුණු පාලිකාව වූ සුගලා රැජින සමග සටන් කොට දළදා වහන්සේ ලබා ගත් පරාක්‍රමබාහු දළදාව පොළොන්නරුවේ වඩා හිඳුවා පුද සත්කාර කළේ ය.

පරාක්‍රමබාහු රජතුමා ජේතවනය නමින් මහා විහාරයක් කරවා එහි අෂ්ට මූලායතන අධිපතීන්ට තුන්මහල් ප්‍රාසාද අටක් ද ශාරිපුත්‍ර මහා ස්ථවිරයන්ට එම ජේතවන විහාරයේ මහා ප්‍රාසාදයක් ද කරවා දී තිබේ.



රූපය 1.3 පොළොන්නරුව ගල් විහාරෙන් කොටසක්

එසේ ම එම විහාර භූමිය තුළ තෙමහල් ප්‍රතිමා මන්දිර, පිරිවෙන් සඳහා දීඝ පාසාද, චූල පාසාද ද පුස්තකාල, තිවංක ප්‍රතිමා ගෘහය, සක්මන් මළු, බොජුන් හල්, නාන කොටු, ගිනිහල් ගෙවල්, දළදා මන්දිරය, ධර්මශාලා, චෛත්‍යය, වැසිකිලි ආදි ගොඩනැගිලි 520ක් පමණ කරවන ලදැයි වංසකථාවේ සඳහන් වේ.

ආලාහණ පිරිවෙන් සංකීර්ණය ඉදිකිරීම එතුමාගේ තවත් වැදගත් ආගමික කාර්යක් වේ. මෙම පිරිවෙන් සංකීර්ණය සුභද්‍රා, රූපවතී යනුවෙන් ස්තූප දෙකකින් ද පස් මහලින් යුත් ලංකාතිලක පිළිමගෙයින් ද, බද්ධ සීමා පොහොය ගෙය ඇතුළුව කූටාගාර, දීඝ පාසාද, ගිනිහල් ගෙවල්, නාන පොකුණු, වැසිකිළි, කැසිකිළි, ආදී විවිධ ගොඩනැගිලි සංකීර්ණවලින් ද උයන් හා සුවිශාල ආරෝග්‍ය ශාලාවකින් ද සමන්විත වේ.

රජු අගනුවර ඉදි කර වූ අනෙක් වැදගත් ම විහාර සංකීර්ණය වනාහි උත්තරාරාමය යි. එහි විද්‍යාධර ලෙණ, හිඳි පිළිම ලෙණ හා ඔත් පිළිම ලෙණ යනුවෙන් ලෙන් තුනක් කරවී ය. මෙය ගල් විහාරය ලෙස වර්තමානයේ හඳුන්වයි.

චෝළ ආක්‍රමණයෙන් විනාශ වූ අනුරාධපුරයේ රුවන්වැලි සෑය, අභයගිරි සෑය, ජේතවන සෑය, මිරිසවැටි සෑය ඇමතිවරයෙකු ලවා ප්‍රතිසංස්කරණය කර සුණු පිරියම් කළ බව සඳහන් වේ. ගල් ටැම් 1600ක් පිහිටුවා ලෝවමහාපාය විස්මයජනක ලෙස ප්‍රතිසංස්කරණය කරවන ලද බව සඳහන් වේ. ථූපාරාමය ආදී විහාර භූමිවල පැවති පිරිවෙන් ද, සීමා පවුරු ආදිය ද, මිහින්තලේ ස්තූප ද, විහාරාරාම ද පිළිසකර කළ බව සඳහන් වේ.

පරාක්‍රමබාහු යුගයේ ඇති වූ මේ ශාසනික අභිවෘද්ධිය හා විශේෂයෙන් භික්ෂු සංඝයා හා ධර්ම ශාස්ත්‍රීය විෂයෙහි ඇති වූ දීප්තියේ කීර්තිරාවය අග්නිදිග ආසියාවේ ඈත බෞද්ධ රටවල පැතිර ගියේ ය. මේ හේතුවෙන් ඒ ඒ රටවල භික්ෂූහු වරින් වර පොළොන්නරුවට පැමිණ කලක් නැවතී සිට මෙරට ථේරවාදී ධර්ම ශාස්ත්‍ර හා ශාසනික වත්පිළිවෙත් පුහුණු වී තම රටවලට ගොස් ලාංකික ශාසනික සම්ප්‍රදාය පිහිටවූහ.

බුරුමයේ රාජගුරු පන්ථගු මහා ස්ථවිර ද, පසුව රාජගුරු පදවියට පත් උත්තරජීව මහාස්ථවිරයන් ද, ඔහුගේ ශිෂ්‍ය ඡප්පට තෙර ද එබඳු තෙරුන් වහන්සේලා වූහ.



රූපය 1.4 පරාක්‍රමබාහු මාලිගය



රූපය 1.5 පරාක්‍රමබාහු රාජසභාව

## 1.6 කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල (1187 - 1196)

- එතුමා පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීමේ දී සාහිත්‍ය මූලාශ්‍රයට වඩා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වැදගත් වේ.
- ඔහු දෙවන විජයබාහු රජුගෙන් පසු පොළොන්නරුවේ පාලකයා විය: රාජ්‍ය කාලය වසර නවයකට සීමා විය.
- ලක්දිව වැඩිම ශිලාලේඛන ප්‍රමාණයක් නිකුත් කළ පාලකයා නිශ්ශංකමල්ල රජු ය. ඊට 70කට අධික ශිලාලිපි ප්‍රමාණයක් ඇතුළත් ය. මෙරට හමු වූ දීර්ඝතම සෙල්ලිපිය වන ගල්පොත සෙල්ලිපිය ද ඔහුට අයත් ය.

- ❖ දිවයිනේ විවිධ ප්‍රදේශවලින් හමු වී තිබෙන සෙල්ලිපි ඔහුගේ බලය මුළු රටේ ම ව්‍යාප්තව පැවති බවට ප්‍රබල සාධකයකි.

- ❖ මෙම සෙල්ලිපිවල නිශ්ශංකමල්ල රජු තම වංශය හා පෙළපත පිළිබඳ අතිශයෝක්තියෙන් වර්ණනා කොට ඇත.

- ❖ නිශ්ශංකමල්ලගේ පියා ශ්‍රී ජයගෝප නමැත්තෙකු බවත් මව පාර්වතී නම් දේවියක බවත් මූලාශ්‍රය මගින් අනාවරණය වේ.

- ❖ එසේ ම පළමුවන පරාක්‍රමබාහු රජතුමා, තමා මෙරටට ගෙන්වා තනතුරු දුන් බව ද රජතුමාගේ සුභද්‍රා නම් දියණිය විවාහ කර දුන් බව ද සඳහන් කර ඇත.

රාජ්‍යත්වය තහවුරු කර ගැනීමේ දී නිශ්ශංකමල්ලට මුහුණ දීමට සිදු වූ අභියෝග

- ❖ නිශ්ශංකමල්ල රජු විජාතිකයෙකු වීම
- ❖ පරාක්‍රමබාහු රජුගේ කීර්තිය
- ❖ රාජ්‍ය නිලධාරීන්ගෙන් එල්ල වූ තර්ජන
- ❖ රෝහණයෙන් එල්ල වූ තර්ජන
- ❖ කාලිංග හා පාණ්ඩ්‍ය වංශිකයන් අතර සිංහාසනය සඳහා පැවති අර්බුද

තමා ද පළමුවන පරාක්‍රමබාහු රජු මෙන් ම ඉමහත් සේවාවක් සිදු කළ රජෙකු බව සෙල්ලිපි පිහිටුවීම මගින් සනාථ කිරීමට උත්සාහ දරා ඇත.

කාලිංග වංශිකයන්ට ලංකාවේ රාජ්‍යය සඳහා උරුමයක් ඇති බව  නිශ්ශංකමල්ල නිතර නිතර සෙල්ලිපිවල සඳහන් කර ඇත. එයට ඉතා හොඳ නිදසුනක් ලෙස, ලක්දිව ඓතිහාසික ජනාවාස ආරම්භ කළ විජය කුමරු කාලිංග දේශයේ උපන් අයෙකු බවත් එම කාලිංග දේශයේ විජය රාජ පරපුරෙන් පැවත එන තමාට ලක්දිව සිංහාසනයේ උරුමයක් ඇති බවත් සඳහන් කර තිබීම ගත හැකිය.

බුදුදහම වැළඳ ගැනීම, පරාක්‍රමබාහු රජු ගොවි වංශයට අයත් බව දැක්වීම, රට තුළ සංචාරය කිරීම, වෙහෙර විහාර තැනවීම, බදු අඩු කිරීම, දළදා මැදුරක් තැනවීම වැනි විවිධ දේශපාලන, ආර්ථික, ආගමික ක්‍රියාමාර්ගවලින් තමන් මෙරට සිංහාසනයට සුදුස්සා බව තහවුරු කිරීමට නිශ්ශංකමල්ල රජතුමා උත්සාහ දරා තිබේ.

රූපය 1.6
නිශ්ශංකමල්ල
ලතා මණ්ඩපය



### 1.6.1 නිශ්ශංකමල්ල රජතුමාගේ ආගමික කටයුතු



රූපය 1.7 වටදාගෙය

- ❖ බුද්ධ ශාසනයේ දියුණුව උදෙසා අනුග්‍රහ දැක්වීම.
- ❖ දළදා වහන්සේ තැන්පත් කිරීම සඳහා හැටදාගෙය ඉදි කිරීම. අඩි 120ක් දිග අඩි 90ක් පළල ගල් වැටක් සහිත කොටුවක් ඇතුළත තනා ඇති මෙයට පිවිසීම සඳහා සුවිශේෂී ද්වාර මණ්ඩපයක් තනා ඇත.
- ❖ දඹුලු විහාරය ප්‍රතිසංස්කරණය කොට එහි බුදුපිළිම හැත්තෑ තුනක රන් ආලේප කරවා ලෙන් විහාරය සුවර්ණගිරි ගුහා යනුවෙන් නම් කොට සෙල් ලිපියක් පිහිටුවීම.
- ❖ රන්කොත් වෙහෙර හා වටදාගෙය ඉදිකොට කැලණිය, මාගම, මහියංගණය, ශ්‍රීපාදය ආදී සිද්ධස්ථාන වැඳ පුදා ගැනීමට ගිය අතර ජනතාවට ද වැඳ පුදා ගැනීමට අවස්ථාව සලසා දීම.



රූපය 1.8 නිශ්ශංකමල්ල රාජසභා මණ්ඩපය

- අනුරාධපුරයට ගොස් රුවන්වැලිසෑයට අසදෘශ පූජාවක් පැවැත්වීම.

- පිරිත් ශ්‍රවණය කිරීමටත්, දළදා වහන්සේට වැඳුම් පිදුම් කිරීමටත් නිශ්ශංක ලතා මණ්ඩපය ඉදි කිරීම.

## 1.7 පොළොන්නරු රාජධානියේ බිඳ වැටීම

නිශ්ශංකමල්ල රජුගෙන් පසු පොළොන්නරු රාජධානියේ දේශපාලන තත්වය අවුල් සහගත විය. බොහෝ විට පාලකයන්ට වඩා සෙන්පතීන් බලවත් වීම මෙකල දක්නට ලැබුණි. නිශ්ශංකමල්ල රජුගෙන් පසු කුමාරවරු කීප දෙනෙක් සිංහසුනට පත් වූහ. ඒ අතර ඉන්දියානු කුමාරවරු ද වූහ.

සාහසමල්ල, වීරබාහු, ධර්මාශෝක, අනීකඞ්ග, ලීලාවතී රැජින, කල්‍යාණවතී රැජින හා පරාක්‍රම පාණ්ඩ්‍ය එසේ රජකම් කළ අය අතර වෙති. මේ අතුරින් ලීලාවතී රැජින අවස්ථා තුනක දී බලයට පත් වූවාය. ඇය පළමුවන පරාක්‍රමබාහු රජුගේ බිසව යි. කල්‍යාණවතී රැජින නිශ්ශංකමල්ල රජුගේ බිසව යි. නිශ්ශංකමල්ල රජුගේ පුත්‍රයා වූ වීරබාහුගේ රාජ්‍ය කාලය දවසකට සීමා විය. පොළොන්නරු රාජධානියේ අවසාන පාලකයා වූයේ පරාක්‍රම පාණ්ඩ්‍ය යි. මෙම පාලකයින් වැඩි දෙනෙකුට අත් වූයේ ස්වාභාවික මරණය නොවේ.

පොළොන්නරු රාජධානිය බිඳවැටීමට බලපෑ හේතු සාධක අතර සිවිල් අරගල විය. පොළොන්නරු සිංහාසනයට කාලිංග හා පාණ්ඩ්‍ය වංශිකයන් අතර අර්බුද ඇති විය. මෙම පෙළපත් අතර පැවති අර්බුදවලට ඇමතිවරු ද සම්බන්ධ වූහ. පරාක්‍රම හා කීර්ති වැනි පුද්ගලයෝ ඊට නිදසුන් වෙති.

නිශ්ශංකමල්ල රජුගෙන් පසු පාලකයින් වාරිකර්මාන්ත ඉදි කිරීමට හෝ ප්‍රතිසංස්කරණය කිරීමට පෙලඹුණ ආකාරයක් දක්නට නොමැත. රජරට ශිෂ්ටාචාරයේ ජීවනාලිය වූයේ වාරිමාර්ග පද්ධතිය යි. එය නොසලකා හැරීම ද පොළොන්නරුව රාජධානිය බිඳ වැටීමට ඉවහල් විය. මෙවන් පසුබිමක් යටතේ සිදු වූ කාලිංග මාඝ ආක්‍රමණය පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට බලපෑ ආසන්න හේතුව ලෙස පිළිගත හැකි ය.

## 1.8 කාලිංග මාඝ ආක්‍රමණය

1215 දී එල්ල වූ කාලිංග මාඝ ආක්‍රමණය ඉතා දරුණු ය. ප්‍රබල කේරල කුලී හමුදාවකගේ ආධාරය ඇති ව ආක්‍රමණය කළ හෙතෙම හතළිස් වසරක කාලයක් රජරට පාලනය කළේ ය.

මාඝ ආක්‍රමණය පිළිබඳ මහාවංසයේ විස්තර වී තිබේ. වාරිමාර්ග පද්ධතිය විනාශ කිරීම, ආගමික ස්ථාන විනාශ කිරීම, පාලකයන් හා නිලධාරීන් ඝාතනය, පොත් පත් ගිනි තැබීම, සිංහලයන් සතු වස්තුව කේරල භටයන්ට ලබා දීම, භික්ෂූන් හා ප්‍රභූන් ඇතුළු ජනතාවට ශාරීරික හිංසා කිරීම ආදිය සිදු වූ බව එහි සඳහන් වේ.

මෙම ආක්‍රමණය ලංකාවේ ආර්ථික, දේශපාලන, සංස්කෘතික, සමාජීය හා ආගමික අංශයන්හි පරිහානියක් ඇති කළේය. මෙසේ සිදු වූ මහා විනාශය මීට පෙර නොවූ විරූ දෙයක් විය.

පීඩාවට පත් වූ මහා සංඝයා වහන්සේලා රජරට අතහැර රැකවරණය පතා මායා, රුහුණු හා මලය රටට ගියහ. ඔවුන්ගෙන් සමහරක් දකුණු ඉන්දියාවේ චෝළ හා පාණ්ඩ්‍ය රාජ්‍යවලට ගොස් එහි ආරක්ෂාව ලැබූහ.

එසේම රාජකුමාරවරු, උසස් නිලධාරීන් හා ප්‍රභූ ජනයා රැකවරණය පතා රුහුණු, මායා හා පිහිටි රටවලට ගොස් වාසස්ථාන පිහිටුවා ගත්හ.

### ක්‍රියාකාරකම්

1. ශ්‍රී ලංකා සිතියමක පහත සඳහන් ස්ථාන ලකුණු කරන්න.

| | | |
|---|---|---|
| ගෝකණ්ණ | පරාක්‍රම සමුද්‍රය | මින්නේරිය |
| ශ්‍රී පාදය | අඹන් ගඟ | මහානාගහුල |
| කසාතොට | | |

2. පළමුවන විජයබාහු රාජ්‍යයට පත් වූ අයුරු අනුපිළිවෙළින් සඳහන් කරන්න.
3. පළමුවන පරාක්‍රමබාහු රජුගේ ආගමික කටයුතු ලැයිස්තු ගත කරන්න.
4. රාජ්‍යත්වය තහවුරු කර ගැනීමේදී නිශ්ශංකමල්ල රජුට මුහුණදීමට සිදු වූ අභියෝග මොනවාද?



## 1.9 දඹදෙණි රාජධානිය



රූපය 1.9 දඹදෙණි රජ මාලිගාවට පිවිසීමට ඇති පියගැට පෙළේ කොටසක්

මාඝ ආක්‍රමණය නිසා සිංහල රාජධානිය ක්‍රමයෙන් නිරිත දෙසට සංක්‍රමණය වන්නට විය. එම සංක්‍රමණ අවධියේ දී පිහිටුවා ගත් පළමුවන පාලන මධ්‍යස්ථානය දඹදෙණිය යි.

### 1.9.1 තුන්වන විජයබාහු (1232 - 1236)

දඹදෙණිය රාජධානිය කරගත් තුන්වන විජයබාහු රජු සමකාලීන මූලාශ්‍රයවල හඳුන්වා ඇත්තේ වන්නි විජයබාහු නමිනි. ඔහු දඹදෙණිය තම රාජ්‍යය බවට පත් කර ගත්තේ එය පිහිටා ඇති පරිසරයෙන් ලද ආරක්ෂාව නිසාම විය හැකි ය.

එතුමා විසින් එහි තම ආධිපත්‍යය තහවුරු කර ගැනීම සඳහා දළඳා වහන්සේ හා පාත්‍රා ධාතූන් වහන්සේ තම භාරයට ගන්නා ලදී. ඒ වන විට දළඳා වහන්සේ සහ පාත්‍රා ධාතුව තිබුණේ කොත්මලේ ය. ඒවා බෙලිගලට වැඩමවා තැන්පත් කළ බව සඳහන් ව තිබේ. මේ කාර්යයේ දී වාචීස්වර මහතෙරුන් වහන්සේ ප්‍රධාන තෙරවරුන්ගේ සහාය එතුමා ලබා ගත්තේ ය.

මේ වන විට භික්ෂූන් වහන්සේලා ඉමහත් පීඩාවට ලක්ව සිටි අතර උන් වහන්සේලාට පිළිසරණ වෙමින් රජු විසින් අභිනවයෙන් විහාර ඉදි කළ අතර ජරාවාසව තිබූ ගොඩනැගිලි රාශියක් ප්‍රතිසංස්කරණය කරන ලදී. අභිනවයෙන් ඉදි කරන ලද විහාර අතර දඹදෙණියේ විජයසුන්දරාරාමය හා වත්තල විජයබාහු විහාරය සුවිශේෂ වේ. පිළිසකර කරන ලද ගොඩනැගිලි අතර අත්තනගලු විහාරය හා තොටගමු විජයබා පිරිවෙන වේ. ඒ සියල්ලට ම වඩා උපසම්පදා විනය කර්මය නැවත ආරම්භ කිරීම වැදගත් වේ. ඒ

සමග ම ශාසන ශෝධනයක් කිරීම ද එතුමාගේ කාර්ය අතර වේ. එවකට මහාසාමි ධුරය ඉසිලූ සංඝරක්ඛිත මාහිමියන්ගේ ද ග්‍රාමවාසී හා වනවාසී මහනාහිමිවරුන් දෙදෙනාගේ සහභාගිත්වයෙන් සංඝ සංශෝධනය සිදු කොට කතිකාවතක් ද පිහිටුවා ඇත. තවද උගත් පඬිවරුන් ලවා බෞද්ධ පොතපත නැවත ලියවීමෙන් ධර්ම ශාස්ත්‍රීය ඥානය නගා සිටුවීමට ද එතුමා අමතක නොකළේ ය.

මහලු වියේ දී රජකම ලබා ගත් මෙම රජුගේ රාජ්‍ය කාලය සතර අවුරුද්දකට සීමා විය. තමාගෙන් පසු රාජ්‍යය නිරුපද්‍රතව පවත්වාගෙන යාම සඳහා සංඝරක්ඛිත මාහිමි ඇතුළු මහාසංඝයා ඉදිරියේ දී රජු විසින් පරාක්‍රමබාහු කුමරුට රජකම ලබා දෙන ලදී.

### 1.9.2 දෙවන පරාක්‍රමබාහු (1236 - 1270)

ඊට අනුව පරාක්‍රමබාහු රාජ්‍යයට පත් වූ අතර දෙවන පරාක්‍රමබාහු යනුවෙන් එතුමා හැඳින් විය. මෙතුමා පිළිබඳ තොරතුරු පූජාවලිය, මහාවංසය හා හත්ථවනගල්ල විහාරවංසය ආදියෙන් හෙළි වේ. මෙතුමාට මහාසංඝරත්නයේ ආශීර්වාදය ආරම්භයේ සිට ම ලැබුණු අතර එය මැනවින් රාජ්‍යය පවත්වාගෙන යාමට උපකාරී විය. සාහිත්‍යධරයෙකු ලෙස සැලකෙන එතුමා ''කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත'' යන උපාධි නාමයෙන් ද පිදුම් ලැබී ය. පරාක්‍රමබාහු රජතුමා විශිෂ්ට ග්‍රන්ථ කිහිපයක් සම්පාදනය කර ඇතැයි සැලකේ. විසුද්ධිමග්ග මහාසන්නය, වන විනිස සන්නය, කව්සිළුමිණ ඉන් ප්‍රධාන ය.

මෙතුමාගේ රාජ්‍ය කාලයේ දී චන්ද්‍රභානු නමැති ආක්‍රමණිකයෙක් දෙවරක් මෙරට ආක්‍රමණය කළේ ය. පළමු ආක්‍රමණය සිදු වී ඇත්තේ 1247 දී යැයි සැලකේ. ආක්‍රමණය සාර්ථක ලෙස මැඩ පැවැත්වීමට රජුට හැකි විය. මොහු මලය අර්ධද්වීපයේ පාලකයෙකු බව අනුමාන කෙරේ. දෙවන පරාක්‍රමබාහු රජතුමා තම පුත් විජයබාහු කුමරුගේ සහාය ඇති ව දෙවන අක්‍රමණය මැඬ පැවැත්වී ය. ආක්‍රමණය මැඬලීම සඳහා රජුට පාණ්ඩ්‍ය ආධාර ලැබිණි යැයි සැලකේ.

මෙම ආක්‍රමණ නිසා දෙවන පරාක්‍රමබාහු රජුට මාඝ නම් දරුණු ආක්‍රමණිකයාගෙන් රට මුදා ගැනීමට තවත් කලක් ගත විය. 1255 දී පමණ එතුමා පොළොන්නරුව වටකොට මාඝගේ හමුදා සමූල ඝාතනය කළේ ය. රජුට සහාය සඳහා පාණ්ඩ්‍ය හමුදා පැමිණි බව ද දකුණු ඉන්දියානු සෙල්ලිපිවලින් හෙළිවේ.

### 1.9.3 ආගමික කටයුතු

බෙලිගල තැන්පත් කර තිබූ දළදා වහන්සේ දඹදෙණියට වැඩමවා එහි තැන්පත් කොට අත්‍යලංකාර දළදා පූජාවක් පැවැත්වීමට රජතුමා කටයුතු කළේ ය.

එසේම රජතුමා දඹදෙණිය ආසන්නයේ පිහිටි තම ජන්ම භූමිය වූ ශ්‍රී ජයවර්ධනපුර තෙක් මාර්ගය සමතලා කොට සරසා මහ පෙරහරින් දළදා වහන්සේ එහි වඩමවා ගෙන ගොස් ශ්‍රී වර්ධන පූජා නම් විචිත්‍ර පූජෝත්සවයක් පවත්වා ඇති බව සඳහන් වේ.

ශ්‍රී පාදස්ථානය, වත්තල, මහියංගණය, බෙන්තර ගලපාත විහාරය, අත්තනගලු විහාරය ආදී විහාරස්ථාන පිළිසකර කළ බව ද වාර්තා වේ.

මේ රජතුමා, තම සොහොයුරු බුවනෙකබාහු කුමරු යොදවා ධර්මධර භික්ෂූන්ගේ අඩුපාඩුව පිරිමසාලීමට දඹදිව උගත් භික්ෂූන් වහන්සේලා මෙන් ම පොත්පත් ද ගෙන්වා ගත් අතර මෙරට භික්ෂූන්ගේ ධර්ම ඥානය හා තර්ක ව්‍යාකරණ දැනුම දියුණු කිරීමට ද ක්‍රියා කළේ ය.

මහාසාමි සංඝරාජ තනතුර දැරූ දිඹුලාගල මේධංකර මාහිමියන්ගේ මූලිකත්වයෙන් ග්‍රාමවාසී හා වනවාසී මහාස්ථවිරයන් දෙදෙනා ඇතුළු කාරක සංඝයාගේ සහභාගිත්වයෙන් දඹදෙණියේ විජයසුන්දරාරාමයේ දී සංඝ සම්මේලනයක් ද පවත්වා '' දඹදෙණි කතිකාවත'' සම්පාදනය කිරීම ද රජුගේ ශාසනික කාර්ය අතරට ගැනේ.

එමෙන් ම රජතුමා විශේෂ වනවාසී සම්ප්‍රදායක් ඇති කිරීමේ අරමුණින් තාම්‍රලිංග දේශයෙන් ධර්මධර, ශීලධර හා විනයධර ධම්මකිත්ති නම් මහතෙර කෙනෙකු වැඩමවා මෙරට පලාබත්ගල වන සෙනසුන ආරම්භ කළේය.

දිවයිනේ විවිධ ප්‍රදේශවලින් පොළොන්නරුවේ පොහොය සීමාවට මහාසංඝයා වැඩමවා සත් දිනක් තිස්සේ උපසම්පදා උත්සවයක් පවත්වා නාහිමි, මහාස්ථවිර, ආයතන නායක ආදී ශාසනික තානාන්තර පිරිනැමූ බව සඳහන් වේ. මෙය සිදුව ඇත්තේ රජුගේ අවසාන වර්ෂය වූ 1270 දී ය.

එතුමාගේ කටයුතුවලින් බොහොමයක් කරන ලද්දේ විජයබාහු කුමරු හා දේව ප්‍රතිරාජ ඇමතිවරයා විසින් ය.

මහා පරාක්‍රමබාහු රජතුමාගේ නිකාය සාමග්‍රියෙන් වසර 100කට පමණ පසු මෙම කතිකාවත සම්පාදනය කර ඇත.

## 1.10 යාපහුව රාජධානිය (1272 - 1300)



රූපය 1.10 දළදා මළුවට හා බලකොටුවට පිවිසෙන යාපහුවේ පියගැට පෙළ

යාපහුව, මාඝට මුහුණ දෙනු සඳහා සුභ සෙන්පතියා ඉදි කළ පර්වත බල කොටුවකි. එම සුභ පබ්බතය යාපහුව ලෙස හැඳින් වේ. එය පළමුවන වරට රාජධානිය කරගත්තේ පළමුවන බුවනෙකබාහු විසිනි.

### 1.10.1 පළමුවන බුවනෙකබාහු (ක්‍රි. ව. 1272 - 1284)

මුල් කාලයේ දී පළමුවන බුවනෙකබාහු රජුට විවිධ දේශපාලන අභියෝග එල්ල විය. දෙවන පරාක්‍රමබාහු රජුට හා බෝසත් විජයබාහු රජුට පක්ෂපාතව සිටි වන්නි නායකයන් අතුරින් ඇතමෙක් බුවනෙකබාහු රජුට එරෙහිව නැගී සිටිය හ. කදලීවාට, මාපාණ, තිප, හිමියානක යන කැරලි මෙහෙය වූවන් වංසකථාවේ සඳහන් වේ.

පළමුවන කාලිංගරායර, චෝඩගංගදේව යන දෙමළ සතුරන් ද පරාජය කිරීමත් මේ රජුට සිදු විය.

එතුමා නොබෝ කලකින් දඹදෙණිය හැරදමා යාපහුව තම පාලන මධ්‍යස්ථානය බවට පත් කර ගනු ලැබුවේ මෙම ඓතිහාසික හා දේශපාලන පසුබිම කෙරෙහි සැලකිලිමත් වීමෙනි.

ලංකාවේ ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳව යාපහුව රාජධානිය ද වැදගත් වේ.

පළමුවන බුවනෙකබාහු රජු ඊජිප්තුවේ සුල්තාන්වරයා සමග රාජ්‍ය සබඳතා ඇති කර ගනිමින් වෙළෙඳ කටයුතු දියුණු කර ගත්තේ ය.

### 1.10.2 පළමුවන බුවනෙකබාහුගේ ආගමික කටයුතු

- ත්‍රිපිටක ධර්මය ලියවා පොතපත සුලභ කිරීමට කටයුතු කිරීම.
- වාර්ෂික උපසම්පදා උත්සව පැවැත්වීමට අනුග්‍රහය දැක්වීම.
- යාපහුවේ විසිතුරු මන්දිරයක් ඉදි කොට දළදා වහන්සේ එහි තැන්පත් කරවීම

බුවනෙකබාහු රජුගේ පුත් දෙවන බුවනෙකබාහු කුමරා හා බෝසත් විජයබාහුගේ පුත් පරාක්‍රම කුමරා අතර ඇති වූ ආරවුල අතරතුර පඬි රජු ආර්ය චක්‍රවර්තී නම් අයෙකුගේ මූලිකත්වයෙන් හමුදාවක් එවී ය. දළඳාව හා පාත්‍රා ධාතුව ඔවුන් රැගෙන ගොස් පාණ්ඩ්‍ය අධිරාජයා වූ කුලශේඛරට භාර දී ඇත. මෙම කාලය රාජ්‍යාන්තරයක් (අරාජික කාලයක්) ලෙස මහාවංසයත් දළදා සිරිතත් සඳහන් කරයි. මෙම කාලය තුළ රටේ සාගතයක් ද ඇති වූ බව වාර්තා වේ. පළමුවන බුවනෙකබාහු රජු මිය යාමත් සමග රාජ්‍ය අනුප්‍රාප්ති පිළිබඳ මතභේද ඇති විය.

අනතුරුව බෝසත් විජයබාහු රජුගේ පුත් පරාක්‍රම කුමරු පාණ්ඩ්‍ය දේශයට ගොස් පඬි රජු හා මිත්‍ර සබඳතා ඇති කර ගෙන නැවත දළඳාව හා පාත්‍රා ධාතුව රැගෙන විත් පරාක්‍රමබාහු නමින් පොළොන්නරුවේ රජ විය. ඔහු මේනමින් සිටි තෙවැන්නා යි.

### 1.10.3 තුන්වන පරාක්‍රමබාහු (1287 - 1293)

- මොහු පොළොන්නරුව රාජධානිය කරගත්තේ ය.
- පොළොන්නරුවේ දළදා මැඳුරක් කරවා පුද පූජා පැවැත්වීය.
- දළදා ඉතිහාසයේ වැදගත් තැනක් මෙතුමාට හිමි වේ.
- මෙම රජුගේ රාජ්‍ය කාලය වසර කිහිපයකට සීමා විය.

### 1.10.4 දෙවන බුවනෙකබාහු (1293 - 1302)

තුන්වන පරාක්‍රමබාහු රජු පරාජය කර දෙවන බුවනෙකබාහු කුමරු පොළොන්නරුවෙන් දළඳාව හා පාත්‍රා ධාතුව රැගෙන යාපහුවේ රජ විය. මෙතුමා වසර නවයක් රාජ්‍යය කළේ ය. ඉන් වසර හතක් යාපහුවේ සිටි මොහු පසුව කුරුණෑගල රාජධානිය ලෙස තෝරාගෙන වසර දෙකක් පමණ එහි පාලන කටයුතු කළේ ය.

උපසම්පදා උත්සව නවයක් හා කඨින චීවරාදී සිවුරු පූජාවක් ද ඔහු පැවැත් වූ බව වංසකථාවේ සඳහන් වේ.

ඔහු භික්ෂු විනය පිළිබඳ විධානයක් පැනවීම ආදී ශාසනෝදයකාරී කටයුතු සිදු කළේ ය. මහාසංඝයා වහන්සේට ශාසනික තනතුරු පිරිනැමීම සිදු කළ බව ද වංසකථාවේ සඳහන් වේ. උදා - පලාබත්ගල ධම්මකිත්ති හිමියන්ට තනතුරු ලබා දීම.

## 1.11 කුරුණෑගල රාජධානිය (1300 - 1341)

### 1.11.1 සිවුවන පරාක්‍රමබාහු (1302 - 1326)

දෙවන බුවනෙකබාහු රජුගේ ඇවෑමෙන් ඔහුගේ පුත් පැරකුම් කුමරු 1302 දී සිව්වන පරාක්‍රමබාහු ලෙස කුරුණෑගල රජ විය. එනමින් සිටි හතරවැන්නා ඔහු වේ.

මෙම රජුගේ කාලයේ සිට රජරට සිංහල ජනතාව ක්‍රමයෙන් නිරිත දෙසට විතැන් වීමේ ප්‍රබල ප්‍රවණතාවක් දැකිය හැකි ය.

මලය කඳුකරයෙන් පටන්ගෙන දකුණු දිග මුහුදු තීරය දක්වා මෙතුමාගේ අනුග්‍රහයෙන් ආගමික හා ශාසනික සේවාවන් සිදු වූ බව සඳහන් වේ.

### 1.11.2 සිව්වන පරාක්‍රමබාහුගේ ආගමික කටයුතු

- කුරුණෑගල විචිත්‍ර දළදා මාලිගයක් තනා දළදා වහන්සේ එහි තැන්පත් කිරීම.
- නටබුන්ව පැවැති තොටගමු වෙහෙර පිළිසකර කර නඩත්තුව පිණිස ගම්බිම් පූජා කිරීම.
- වීදාගම ශ්‍රී ඝණානන්ද පිරිවෙන් විහාරය, දෙවුන්දර පටිමාඝරය, වැලිගම විහාරයේ දීඝ පාසාදය ද කරවීම.

- පන්සිය පනස් ජාතක පොත සිංහල භාෂාවෙන් ලිවීමට අනුග්‍රහය දැක්වීම. දළදා සිරිත රචනා කිරීම. එළු බෝධිවංසය, අනාගතවංසය, ධාතු මංජුසා යන කෘති රචනා කිරීමට අනුග්‍රහ දැක්වීම.

- මහනුවර අස්ගිරි විහාරය බිහි කිරීමට දායක වීම. ඒ සඳහා සියලු අනුග්‍රහය ලබාදීමට රජතුමා කටයුතු කළේ ය.

## 1.12 ගම්පොළ රාජධානිය

- පස්වන විජයබාහු රජුගේ අභාවයත් සමඟ කුරුණෑගල රාජ්‍යය ද නිමා වූ අතර ඉන්පසු ගම්පොළ ලංකාවේ අගනුවර බවට පත් විය.

- ආරක්ෂිත ස්ථානයක් ලෙස ගම්පොළ වැදගත් ය.

### 1.12.1 හතරවන බුවනෙකබාහු (1341 - 1351)

- හතරවන බුවනෙකබාහු රජ ගම්පොළ රාජධානිය තම මධ්‍යස්ථානය ලෙස තෝරා ගත්තේ ය.

- මෙම කාලයේ ප්‍රභූ පවුල් දෙකක් දේශපාලන කටයුතුවල දී සහය විය. සේනාධිලංකාර හා අලගක්කෝනාර එම ප්‍රභූ පවුල් දෙක යි.

- රජුගේ අගමැති ලෙස සේනාධිලංකාර කටයුතු කළ අතර දෙවනගල වනරතන හිමියන්ගේ මූලිකත්වයෙන් භික්ෂූන් රැස් කරවා ශාසන ශෝධනයක් කර ඇත.

- සීලවංස ධම්මකිත්ති නම් හිමි නම ගඩලාදෙණිය විහාරස්ථානය කරවා ඇත.

- සේනාධිලංකාර සෙනෙවිරදුන් ලංකාතිලක විහාරය කරවා ඇත.

### 1.12.2 තුන්වන වික්‍රමබාහු (1357 - 1374)

- මොහුගේ අගමැතිවරයා වූයේ නිශ්ශංක අලගක්කෝනාර හෙවත් නිශ්ශංක අලකේශ්වර ය. එසේ ම භාස්කර ජයමහලැන නම් වූ ප්‍රභූවරයෙක් ද ඔහුට සහාය වූයේය.

- ලංකාවේ වෙළඳාමෙන් ලාභ ලබා ගත් යාපනයේ ආර්ය චක්‍රවර්තීන් මැඩ පවත්වා ඔහුගේ හමුදා පලවා හරින ලද්දේ නිශ්ශංක අලගක්කෝනාර විසිනි.

- නියම්ගම්පාය විහාරය හා කැලණි විහාරය රජු විසින් පිළිසකර කරවන ලදී.

### 1.12.3 පස්වන බුවනෙකබාහු රජතුමා (1374 - 1408)

පස්වන බුවනෙකබාහු රජුට අලකේශ්වර, දේවමන්ත්‍රී, අර්ථනායක යන සොහොයුරෝ සහය දුන්හ. උතුරේ ආර්ය චක්‍රවර්තීන්ගෙන් 1381 දී ආක්‍රමණයක් එල්ල වූ අතර එය පස්වන බුවනෙකබාහු රජු හා අලකේශ්වර ඇතුළු සේනාව අතින් පරාජය වූ බව සංගමු ලිපිය හා රාජාවලිය යන මූලාශ්‍රයන්ගෙන් පැහැදිලි වේ.


## ක්‍රියාකාරකම්

1. රාජ්‍ය බලය තහවුරු කර ගැනීමේ දී නිශ්ශංකමල්ල රජුට මුහුණදීමට සිදු වූ අභියෝග ලැයිස්තුවක් සකස් කරන්න.
2. දඹදෙණියේ රජ වූ රජවරුන් දෙදෙනෙකු නම් කරන්න.
3. දෙවන පරාක්‍රමබාහු රජතුමා පිළිබඳ ව සඳහන් සාහිත්‍ය මූලාශ්‍රය තුනක් නම් කරන්න.
4. පළමුවන බුවනෙකබාහු රජුගෙන් සිදු වූ ආගමික කටයුතු මොනවාදැයි හඳුන්වන්න.
5. කුරුණෑගල රාජධානියේ ආරම්භක පාලකයා නම් කරන්න.
6. හතරවන පරාක්‍රමබාහු රජුගේ ආගමික කටයුතු මොනවාද?
7. ගම්පොළ රජ වූ රජවරුන් තිදෙනෙකු නම් කරන්න.



## 1.13 කෝට්ටේ රාජධානිය (1415 - 1597)

ගම්පොළ රාජධානියේ තුන්වන වික්‍රමබාහු රජුගේ කාලයේ ඔහුගේ අගමැති වූ නිශ්ශංක අලගක්කෝනාර, යාපනයෙහි ආර්ය චක්‍රවර්ති සේනාව උතුරට පලවා හැරීම සඳහා කොළඹ වරායට නුදුරු දියවන්නා ඔයෙන් වට වූ ජල දුර්ග හා පංක දුර්ගවලින් යුත් ස්ථානයක තැනූ කෝට්ටේ බලකොටුව ආශ්‍රය කර ගනිමින් කෝට්ටේ රාජධානිය බිහි කළේ ය.




සිතියම 1.3 රාජධානිය සංක්‍රමණය වූ අයුරු

### 1.13.1 හයවන පරාක්‍රමබාහු (1412 - 1467)

දිවයින අවසන්වරට එක්සේසත් කළ සිංහල පාලකයා මොහු ය. එතුමාගේ රාජ්‍ය කාලයේ ආගමික, සාහිත්‍ය හා අධ්‍යාපන දියුණුවක් ඇති විය. එම කාලය හැදෑරීම සඳහා මූලාශ්‍රය රාශියක් තිබේ.

**අලකේශ්වර යුද්ධය**
**රාජාවලිය**
**පරවි සන්දේශය**
**සැළලිහිණි සන්දේශය**
**ගිරා සන්දේශය**
**කෝකිල සන්දේශය**
**සද්ධර්ම රත්නාකරය**
**පැරකුම්බා සිරිත**
**කාව්‍යශේඛරය**
**ගුත්තිල කාව්‍යය**

මෙතුමා චීන අධිරාජයා සමග සමීප සබඳතා පැවැත්වූ බව චීන මූලාශ්‍රයවලින් පැහැදිලි වේ. එසේම චීන අධිරාජයාගේ අනුග්‍රහය යටතේ රාජ්‍යයට පත් වූ බව ද අනුමාන කරනු ලැබේ. එතුමාගේ කාර්ය සාඵල්‍යයට මෙම සම්බන්ධය බෙහෙවින් බලපෑ බව සිතිය හැකි ය.

වෙළෙඳාම පිණිස බඩු පුරවා යැවූ රජුගේ නැවක් අදිවිරරාම පටුනේ දී රායන් මලවර නමැත්තෙක් කොල්ල කෑවේය. රජු නැව් ගණනාවක් යවා වෙළෙඳ තොටුපලවලට පහර දී සොලී රට මකුඩන් කෝට්ටය ඇතුළු ගම් හතරකින් අවුරුදු පතා බදු ගෙන්වා ගෙන ඇත.

යාපන ප්‍රදේශය ආර්ය චක්‍රවර්ති පාලනයෙන් බේරා ගැනීම සඳහා සේනානායක සපුමල් කුමරුට පැවරිණ. පසුව සපුමල් කුමාරයා යාපනයේ ප්‍රාදේශීය පාලකයා ලෙස පත් කරනු ලැබී ය.

උඩරට ප්‍රදේශයේ සාමන්ත පාලක ජෝතිය සිටුවරයාගේ හිතුවක්කාර ක්‍රියා අම්බුලුගල කුමරු යවා මර්දනය කරන ලදී.

### 1.13.2 පරාක්‍රමබාහු වැඩි දියුණු කළ පූජනීය ස්ථාන

❖ ශ්‍රීපාදස්ථානය
❖ අත්තනගලු විහාරය
❖ ගඩලාදෙණිය
❖ ලංකාතිලකය
❖ මහියංගණය
❖ කැලණිය



රූපය 1.11 ගඩලාදෙණිය



රූපය 1.12 ලංකාතිලකය

හයවන පරාක්‍රමබාහු රජු තම මෑණියන් වූ සුනේත්‍රා දේවියගේ නමින් පැපිලියාන සුනේත්‍රාදේවි පිරිවෙණ කර වූ බව ද එහි නඩත්තුවට ගම් බිම් පිදූ බව ද පැපිලියාන සන්නසෙහි සඳහන් වේ.

1.13.3 හයවන පරාක්‍රමබාහු රජුගේ කාලයේ දියුණු තත්වයේ පැවති පිරිවෙන්

- ❖ වත්තල වනවාසය
- ❖ කෝට්ටේ පැරකුම්බා පිරිවෙණ
- ❖ රයිගම ශ්‍රී ඝණානන්ද පිරිවෙණ
- ❖ කැරගල පද්මාවතී පිරිවෙණ
- ❖ දෙවුන්දර ඉරුගල් කුලතිලක පිරිවෙණ

1.13.4 හයවන පරාක්‍රමබාහු රජුගේ කාලයේ විසූ ප්‍රකට පඬිවරු

- ❖ තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
- ❖ වෑත්තෑවේ හිමි
- ❖ විල්ගම්මුල හිමි
- ❖ කැරගල වනරතන හිමි
- ❖ වීදාගම මෛත්‍රිය හිමි
- ❖ ධම්මදින්න විමලකිත්ති හිමි
- ❖ පැපිලියානේ මංගල හිමි

සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස මෙම යුගය හඳුන්ව යි.

සන්දේශ සාහිත්‍යයේ දියුණුවක් මෙම යුගයේ දී ඇති විය.

- ❖ හංස සන්දේශය
- ❖ සැළලිහිණි සන්දේශය
- ❖ ගිරා සන්දේශය
- ❖ කෝකිල සන්දේශය
- ❖ පරෙවි සන්දේශය මෙම කාලයේ දී රචනා විය.

- ❖ ගුත්තිල කාව්‍යය
- ❖ කාව්‍යශේඛරය
- ❖ සද්ධර්මරත්නාකරය
- ❖ බුදුගුණ අලංකාරය
- ❖ ලෝවැඩ සඟරාව
- ❖ අලකේශ්වර යුද්ධය
- ❖ පැරකුම්බා සිරිත යන සාහිත්‍ය ග්‍රන්ථ රචනා වූයේ ද කෝට්ටේ යුගයේ දී ය.

කෝට්ටේ යුගයේ විසූ තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ෂඩ්භාෂාපරමේශ්වර නාමයෙන් ද පිදුම් ලැබී ය. එසේ ම මහා කාව්‍ය සම්ප්‍රදායට අයත් කාව්‍යශේඛරය ද මෙම හිමියන්ගේ කෘතියකි.

## ක්‍රියාකාරකම්

1. රාජධානි සංක්‍රමණය දැක්වෙන සිතියමක් ඇඳ නම් කරන්න.
2. වගුව සම්පූර්ණ කරන්න. (නිරිත දිග රාජධානි ඇසුරින්)

| යුගය | රජතුමා | ඉදි කළ විහාර |
|---|---|---|
| | | |

3. කෝට්ටේ යුගයේ ලියවුණ ග්‍රන්ථ හා කතුවරුන් පිළිබඳ ලැයිස්තුවක් සකසන්න.



# 02

# ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසි බල ව්‍යාප්තිය



**හැඳින්වීම**

පෘතුගීසින් මෙරටට පැමිණීමත් එවිට මෙරට පැවති දේශපාලන, සමාජීය හා ආර්ථික තත්වයත්, ඔවුන්ගෙන් මෙරටට ඇති වූ බලපෑම පිළිබඳවත් ඔබට මෙම පරිච්ඡේදයේ දී අධ්‍යයනය කළ හැකි ය.

## 2.1 දහසයවන සියවසේ ශ්‍රී ලංකාවේ දේශපාලන තත්වය හා කෝට්ටේ රාජ්‍යය බෙදීයාම


දහසයවන සියවස ආරම්භ වන විට කෝට්ටේ රාජ්‍යය දුර්වල වෙමින් පැවතුණි. නිරිතදිග තැනිතලාවේ පිහිටි කෝට්ටේ රාජ්‍යයේ පැවති භූගෝලීය විෂමතා ශක්තිමත් රාජ්‍යයක් පවත්වාගෙන යාමට තරම් හිතකර නොවී ය. මේ අතර හයවන පරාක්‍රමබාහු රජු එක්සත් කළ ලංකාව පාලනය කරගෙන යාම සඳහා සුදුසු අනුප්‍රාප්තිකයෙක් නොවීය.

මේ තත්වය යටතේ ලංකාවේ දේශපාලන බලය ප්‍රධාන පාලන ඒකක තුනක් යටතේ විකේන්ද්‍ර ගත වී තිබුණි. එනම්

* ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ රාජධානිය
* යාපන රාජධානිය
* කන්ද උඩරට රාජධානිය

යනුවෙනි.

පෘතුගීසීන් ගොඩබසින විට අටවන වීරපරාක්‍රමබාහු රජු කෝට්ටේ පාලකයා විය. යාපනය රාජධානියේ පාලකයා වශයෙන් පරරාජසේකරම් රජු කටයුතු කළ අතර උඩරට රාජධානියේ පාලකයා ලෙස සේනාසම්මත වික්‍රමබාහු කටයුතු කරමින් සිටියේ ය. මීට අමතරව පැරණි රජරටට අයත් ව තිබූ වනගත ප්‍රදේශ වන්නි පාලකයන් යටතේ පැවතිණි. 1521 වන විට කෝට්ටේ රාජ්‍යය තවදුරටත් බෙදී ගියේ ය.




සිතියම 2.1 දහසය වන සියවසේ ලංකාවේ දේශපාලන බෙදීම්

**විජයබාකොල්ලය යනු:**

**කෝට්ටේ හයවන විජයබාහු රජ තම රාජ්‍යය හිමි පුතුන් තිදෙනා නොසලකා හැර තරුණ බිසවක වූ කීරවැල්ලේ බිසවගේ පුතෙකු වූ දේවරාජ නම් කුමාරයාට රාජ්‍ය උරුමය ලබා දීමට අදහස් කළේ ය. මෙය සැලවීමෙන් රාජ්‍ය හිමි කුමාරවරු තිදෙනා 1521 දී කුලියට ගත් විදේශිකයකු ලවා පියරජු මරා කෝට්ටේ රාජ්‍යය කොටස් තුනකට බෙදා පාලනය කළහ. මෙය විජයබාකොල්ලය නමින් හැඳින්වේ.**

විජයබා කොල්ලයෙන් පසු කෝට්ටේ රාජ්‍යය බෙදී ගිය කොටස් තුන හා එහි පාලකයන් පහත දැක්වේ.

* කෝට්ටේ - හත්වන බුවනෙකබාහු
* රයිගම - රයිගම් බණ්ඩාර (මද්දුම බණ්ඩාර)
* සීතාවක - මායාදුන්නේ

මෙම දේශපාලන බලය දුර්වල ව පවතිද්දී අහඹු ලෙස ලංකාවට ගොඩබට පෘතුගීසීන්ට කෝට්ටේ රාජ්‍යයේ දේශපාලන කටයුතුවලට මැදිහත්වීමේ අවස්ථාව උදා විය.

## 2.2 යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීමට බලපෑ සාධක

ඈත අතීතයේ සිට ම ආසියාව හා යුරෝපය අතර වෙළෙඳ සම්බන්ධතා පැවතුණ නමුත් එහි දී අතරමැදියන් ලෙස කටයුතු කරන ලද්දේ මුස්ලිම් වෙළෙඳුන් ය. මේ නිසා ආසියාවේ වෙළෙඳ ඒකාධිකාරය මුස්ලිම් වෙළෙඳුන් සතු විය. ඔවුහු ආසියාවේ කුළුබඩු ඇතුළු භාණ්ඩ එක් රැස්කර ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථානය වූ කොන්ස්තන්තිනෝපල් නගරයට ගෙන ගොස් යුරෝපා ජාතීන්ට විකිණීමෙන් විශාල ලාභයක් ලැබූහ.

කුරුස යුද්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් කොන්ස්තන්තිනෝපල් වරාය තුර්කින් යටතට පත්විය. එහි දී ඈත අතීතයේ සිට ම ආසියාව හා යුරෝපය අතර වෙළෙඳ සම්බන්ධතා පැවැත්වූ මාර්ග අවහිර විය. එම මාර්ග නම්,

❖ කොන්ස්තන්තිනෝපල් වරායේ සිට පර්සියාව හා මධ්‍ය ආසියාව හරහා චීනය දක්වා විහිදුණු ගොඩබිම් සේද මාවත

❖ කොන්ස්තන්තිනෝපල් වරායේ සිට මධ්‍යධරණී මුහුද ඔස්සේ ඉන්දියානු සාගරය හරහා චීනය දක්වා වැටී තිබූ මුහුදු සේද මාවත යි.

මෙම අවහිරතාව නිසා කුළුබඩු මිල ඉහළ නැංවීම, භාණ්ඩ හිඟයක් ඇති කිරීම හා කලට වේලාවට භාණ්ඩ නොදීම යන හේතු නිසා යුරෝපා ජාතීන්ට පෙරදිග රටවලින් භාණ්ඩ ලබා ගැනීම දුෂ්කර විය. මේ නිසා පෙරදිග රටවල් සමග සම්බන්ධතා පවත්වා ගැනීමට නම් පෙරදිගට නව වෙළෙඳ මාර්ග සොයා ගත යුතු විය. මේ අනුව යුරෝපා ජාතීහු තම රජවරුන්ගේ අනුග්‍රහයෙන් දේශ ගවේෂණ ව්‍යාපාරයෙහි යෙදුණෝ ය. ආසියාවේ කුළුබඩු නිෂ්පාදිත රටවල් සොයා 15 වන සියවස අවසානයේ දී දේශ ගවේෂණයේ යෙදීම ආරම්භ විය. මෙසේ දේශ ගවේෂණයේ නිරත වූ ප්‍රථම රටවල් දෙක වන්නේ පෘතුගාලය හා ස්පාඤ්ඤය යි.

එම සියවසේ පෘතුගාලයේ සිටි හෙන්රි කුමරු හෙවත් නාවික හෙන්රි දේශ ගවේෂණ ව්‍යාපාරයේ පුරෝගාමියා විය. මේ අනුව වස්කෝද ගාමා නමැති නාවිකයා අප්‍රිකාව වටා යාත්‍රා කොට 1498 වර්ෂයේ දී ඉන්දියාවේ කැලිකට් වරායට සේන්දු විය. මෙයින් පසු ව යුරෝපා ජාතීන්ට ආසියාවේ දොරටු විවර විය. ඒ අනුව ලන්දේසි, ප්‍රංශ හා ඉංග්‍රීසි වැනි යුරෝපා ජාතීහු ආසියාවට පැමිණීමට සමත් වූහ.




රූපය 2.1 **නාවික හෙන්රි**

**ආසියාවේ යුරෝපා බල ව්‍යාප්තියට බලපෑ හේතු**

- ❖ වෙළෙඳ වාසි ලබා ගැනීම
- ❖ ආගම ව්‍යාප්ත කිරීම
- ❖ මුස්ලිම්වරුන් සතුව පැවැති ආසියාවේ වෙළෙඳ ඒකාධිකාරය හිමි කර ගැනීම
- ❖ යටත් විජිත ඇති කර ගැනීම

**ආසියාවේ බලය පිහිට වූ යුරෝපීය රටවල්**

- ❖ පෘතුගාලය
- ❖ ප්‍රංශය
- ❖ බ්‍රිතාන්‍යය
- ❖ ඕලන්දය




**සිතියම 2.2 පහළොස්වන හා දහසයවන සියවස්වල දේශ ගවේෂණ ව්‍යාපාරය**
**8 ශ්‍රේණිය ඉතිහාසය පෙළපොත ඇසුරෙනි**

## 2.3 කෝට්ටේ රාජ්‍යය හා පෘතුගීසීන් අතර සම්බන්ධතා

වස්කෝද ගාමා ඉන්දියාවේ කැලිකට් වරායට පැමිණ වැඩිකල් යාමට පෙර ලංකාව පිළිබඳ යම් අවබෝධයක් ලබා ගැනීමට පෘතුගීසීන්ට හැකියාව ලැබුණි. ලංකාවේ කුරුඳුවලට යුරෝපීය වෙළෙඳ පොළෙන් ඉහළ මිලක් ලැබෙන බවත් වෙනත් කුළුබඩු බොහොමයක් මේ දූපතේ ඇති බවත් පෘතුගීසීන් විසින් අවබෝධ කර ගන්නා ලදී.



**රූපය 2.2 වස්කෝද ගාමා**

1505 දී ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදා පෙරදිග ප්‍රතිරාජයා ලෙස පත් කිරීමේ දී සෙයිලන් නමින් හැඳින්වෙන ලංකාව සොයා ගන්නා ලෙස උපදෙස් දී ඇත. මෙසේ ලංකාව සොයා ගැනීමට උත්සාහ කරමින් සිටි අවධියේ දී ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදාගේ පුත් ලොරෙන්සෝ ද අල්මේදා ඇතුළු නාවික පිරිස 1505 දී අහඹු ලෙස ලංකාවට පැමිණ ඇත.

### 2.3.1 ලොරෙන්සෝ ද අල්මේදා ලංකාවට පැමිණීම

ඉන්දියන් සාගරයේ යාත්‍රා කරන මුස්ලිම් වෙළෙඳ නැව් අල්ලා ගැනීමේ මෙහෙයුමක යෙදී සිටි ලොරෙන්සෝද අල්මේදා ඇතුළු පිරිස මුස්ලිම් වෙළෙඳ නැවක් පසුපස හඹා යන විට කුණාටුවකට හසුව අහඹු ලෙස ලංකාවේ ගාලු වරායට සේන්දු වී තිබේ.

පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට ප්‍රධාන රාජ්‍යය වූ කෝට්ටේ අටවන වීර පරාක්‍රමබාහු රජු මහලු වියේ සිටි බව පෙනේ. එම නිසා ඔහු පුත් විජයබාහු කෝට්ටේ රාජ්‍යයේ කටයුතු මෙහෙයවී ය.

රජු සමග සාකච්ඡා කළ පෘතුගීසීහු කෝට්ටේ රාජ්‍යය සමග වෙළෙඳ සම්බන්ධතා ගොඩනගා ගැනීමට උත්සාහ කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස පෘතුගීසීහු තාවකාලික වෙළෙඳ ගබඩාවක් කොළඹ කොටුවේ ස්ථාපිත කිරීමට සමත් වූහ. කෝට්ටේ රාජ්‍යය තුළ වෙළෙඳ ඒකාධිකාරය ලබා සිටි මුස්ලිම් වෙළෙන්දෝ පෘතුගීසි ආගමනයෙන් දැඩි ලෙස කනස්සල්ලට පත් වූහ. ඔවුහු කෝට්ටේ වැසියන්ගේ සහය ලබා ගෙන පෘතුගීසීන්ගේ වෙළෙඳ කටයුතුවලට බාධා කළහ. බල කොටුවක් කොළඹ ඉදි කිරීමට පෘතුගීසීන් ගත් උත්සාහය මුස්ලිම් වෙළඳුන් විසින් කෝට්ටේ ජනතාවගේ සහයෝගයෙන් වලක්වන ලදී. කෙසේ වුව ද ආයුධ සන්නද්ධ නොකළ ගබඩාවක් ගොඩනැගීමට පෘතුගීසීහු සමත් වූහ.

කෝට්ටේ රාජ්‍යය බෙදීයාමෙන් කලක් ගත වන විට කෝට්ටේ හා සීතාවක අතර ගැටුම් ඇති විය.

රයිගම් බණ්ඩාරගේ මරණයෙන් පසු රයිගම් ප්‍රදේශය සීතාවකට ඈඳා ගත් මායාදුන්නේ කෝට්ටේ රාජධානිය තුළ ද බලය පැතිරවීමට උත්සාහ කළේ ය. මෙහි දී සීතාවක බලපෑමෙන් පීඩාවට පත් බුවනෙකබාහු රජු තම ආරක්ෂාව සඳහා පෘතුගීසී සහය පැතීමෙන් ඔවුන්ට මෙරට පාලනයට සම්බන්ධ වීමට දොර විවර වීමක් විය. රජු පෘතුගීසි සහාය ලබා ගත්ත ද පෘතුගීසි ගැති පාලකයෙකු නොවීය.

බුවනෙකබාහු රජු ජීවත් ව සිටිය දී ම ධර්මපාල කුමරුගේ රන් පිළිරුවක් පෘතුගාලයේ රජු වෙත යවා ඔටුනු පැලඳවීමට පෘතුගීසීහු කටයුතු කළහ. ඒ සමග කතෝලික මිෂනාරීන් ද කොළඹට පැමිණ කතෝලික ආගම ප්‍රචාරය කිරීමට කටයුතු කර ඇත. මේ අතර සීතාවක හා කෝට්ටේ රාජ්‍ය අතර ගැටුම් තව තවත් උත්සන්න විය. මෙම සිදුවීම් නිසා පෘතුගීසීන් කෝට්ටේ රාජ්‍යයේ වෙළෙඳ ද්‍රව්‍ය අඩු මිලකට ලබා ගැනීමත් කෝට්ටේ වැසියන්ට පීඩා කිරීමත් නිසා රජුගේ සිත තුළ ඔවුන් පිළිබඳ කලකිරීමක් ඇති විය. වර්ෂ 1550 දෙසැම්බර් මස 29 දින පෘතුගීසි සොල්දාදුවකුගේ වෙඩි පහරින් බුවනෙකබාහු රජු මරණයට පත් විය. මෙය සැකයට තුඩු දෙන සිදුවීමක් ලෙස සැලකේ.


බුවනෙකබාහු රජුගේ මරණින් පසුව පෘතුගීසීහු ළාබාල වියේ පසු වූ ධර්මපාල කුමරු කෝට්ටේ පාලකයා බවට පත් කර තම සිතැඟි පරිදි කටයුතු කිරීමට උත්සාහ දැරූහ. පෘතුගීසීන්ගේ බසට අවනතව කටයුතු කළ රජ කතෝලික ආගම වැළඳගෙන දොන් ජුවන් ධර්මපාල නමින් බෞතීස්ම ලැබී ය. තම රජු කතෝලික ආගම වැලඳ ගැනීම ගැන කළකිරුණු කෝට්ටේ වැසියෝ සීතාවක රාජ්‍යය වටා එක් වූහ. කෝට්ටේ දළදා මැදුරේ තැන්පත් කර තිබූ දළදා වහන්සේ හිරිපිටියේ නිලමේ විසින් සීතාවකට වැඩම කර දෙල්ගමුව විහාරයේ කුරහන් ගලේ සඟවා තබන ලදි. ඉන් පසුව භික්ෂූන් වහන්සේලාගේ සහාය ද සීතාවක රාජ්‍යයට හිමි විය. ධර්මපාල කුමරුගේ පියා වූ වීදිය බණ්ඩාර පෘතුගීසීන්ට එරෙහිව කැරලි ගැසී ය. මෙම දේශපාලන පසුබිම මත සීතාවක බලවත් රාජ්‍යයක් ලෙස මතු වී ආවේ ය.




රූපය 2.3 දෙල්ගමුව විහාරය හා දළදාව සඟවා තිබූ එහි කුරහන් ගල

කෝට්ටේ රාජ්‍යයේ බලය තහවුරු කරගත් පෘතුගීසීහු ජනතාවට පීඩාකරමින් පාලනය ගෙන ගියෝ ය. කෝට්ටේ ජනතාවගේ පක්ෂපාතීත්වය ලබා ගත් සීතාවක රාජසිංහ රජ ධර්මපාල රජුට හා පෘතුගීසි පාලනයට එරෙහිව නොකඩවා ප්‍රහාර එල්ල කළේ ය. පෘතුගීසි විරෝධතා සීතාවක රාජ්‍යය තුළින් මතු වීමෙන් කෝට්ටේ රාජ්‍යය ආරක්ෂා කර ගැනීමට නොහැකි වූ ධර්මපාල රජ 1565 දී කෝට්ටේ නගරය අත් හැරියේ ය. ඉන්පසු පෘතුගීසි රැකඩයක් බවට පත් වූ ඔහු කොළඹ කොටුවේ රැකවරණය ලැබ 1580 දී තෑගි ඔප්පුවක් මගින් කෝට්ටේ රාජ්‍යය පෘතුගීසීන්ට පවරා දුන්නේ ය. 1597 දී ඔහුගේ මරණයත් සමග පෘතුගීසීහු කෝට්ටේ රාජ්‍යයේ සම්පූර්ණ බලය අත්පත් කර ගත්හ.

එවකට ලංකාවේ පෘතුගීසි නායකයා වූයේ කපිතාන් දොන් ජෙරනිමෝද අසවේදු ය. ධර්මපාල රජුගේ මරණයෙන් පසු ඔහු විසින් කෝට්ටේ රාජ්‍යයෙහි දේශීය පරිපාලන නිලධාරීන් මල්වානට කැඳවන ලදී. එහි දී ධර්මපාල රජු විසින් තෑගි ඔප්පුවක් මගින් කෝට්ටේ රාජ්‍යය පෘතුගාලයේ රජුට පවරා ඇති බව නිල වශයෙන් දන්වා සිටින ලදි. ඒ අනුව පෘතුගාලයේ රජතුමා මෙතැන් සිට ලංකාවේ රජු බව ප්‍රකාශයට පත් විය. එමෙන් ම අනාගත පාලනය ගෙන යාමට පොරොන්දුවීම නිසා සිංහල නිලධාරීහු ද පෘතුගාල රජුට පක්ෂපාතීත්වය දැක්වීමට ප්‍රතිඥා දුන්හ. දහසයවන සියවසේ මෙරට පැවැති දේශපාලන අස්ථාවර භාවයත් පෘතුගීසීන්ගේ උපක්‍රමශීලී භාවයත් නිසා මෙරට මුහුදුබඩ ප්‍රදේශ තම අණසකට ගෙන පාලනය කිරීමට පෘතුගීසීහු සමත් වූහ. එය අවසන් වූයේ දෙවන රාජසිංහ රජු සමග ඇති කර ගත් ගිවිසුමේ ප්‍රතිඵලයක් ලෙස ලන්දේසීන්ගේ සහායෙන් වර්ෂ 1658 දී පෘතුගීසීන් ලංකාවෙන් නෙරපා හැරීමෙනි.




**සිතියම 2.3 කෝට්ටේ රාජධානියේ බෙදීම**
**10 ශ්‍රේණිය පැරණි ඉතිහාසය පෙළපොත ඇසුරෙනි**

## 2.4 සීතාවක රාජ්‍යය හා පෘතුගීසීන් අතර සම්බන්ධතා

වර්ෂ 1521 දී සිදු වූ විජයබා කොල්ලයෙන් බිහි වූ සීතාවක රාජ්‍යයේ ආරම්භක පාලකයා වූයේ මායාදුන්න රජු ය. ඔහු ආරම්භයේ සිට ම පෘතුගීසි විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කළේ ය. කෝට්ටේ රාජ්‍යයේ පාලකයා වූ ධර්මපාල රජු කතෝලික ආගම වැලඳගෙන පෘතුගීසීන්ගේ රූකඩයක් වීම හේතුවෙන් භික්ෂූන්ගේ සහයෝගය සීතාවක රාජ්‍යයට ලැබෙන්නට විය.

රාජ්‍ය උරුමයේ සංකේතය වූ දළදා වහන්සේ හිරිපිටියේ නිළමේ විසින් සීතාවක රජුට භාර දෙන ලදි.

කෝට්ටේ රාජ්‍යය පෘතුගීසීන්ගේ ග්‍රහණයට නතුවීම නිසා ඔවුන්ට විරුද්ධව සීතාවක රාජ්‍යය තුළ විශාල බලවේගයක් ගොඩනැංවෙමින් තිබිණි. මෙසේ සීතාවක රාජ්‍යය බලවත්වීම ඔවුන්ට අභියෝගයක් වූ බැවින් ධර්මපාල රජුගේ ද අනුග්‍රහයෙන් පෘතුගීසීන් විසින් සීතාවක රාජ්‍යය ආක්‍රමණය කරන ලදි.

අපොන්සු පෙරෙයිරා ද ලසාර් දා නම් පෘතුගීසි සෙනෙවියා විශාල හමුදාවක් සහිතව සීතාවකට පහර දුන්නේ ය. මායාදුන්නේගේ පුත් ටිකිරි කුමරු මුල්ලේරියාවේ දී ඔහුට මුහුණ දුන්නේ ය. මෙම සටනින් පෘතුගීසීන් අන්ත පරාජයට පත් කිරීමට ඔහු සමත් විය. පෘතුගීසීන්ට පෙරදිග දරුණුතම පරාජය අත් වූයේ මුල්ලේරියා සටනේ දී ය.

ඉන් අනතුරුව ටිකිරි කුමරු සීතාවක රාජසිංහ නමින් අභිෂේක ලැබී ය. දක්ෂ රණශූරයෙකු වූ ඔහු කෝට්ටේ ධර්මපාල රජුගේ පාලනය හා පෘතුගීසි බලය කොළඹ කොටුවට පමණක් සීමා කර තැබීමට සමත් විය. එහෙත් ගෝවෙන් පෘතුගීසීන්ට ලැබෙන ආධාර වැළැක්වීමට ඔහුට නාවික හමුදාවක් නොතිබීම නිසා පෘතුගීසීන් මෙරටින් පළවා හැරීමට නොහැකි විය. එමෙන් ම මාතර සමරකෝන් මුදලි යටතේ පෘතුගීසීන්ට සේවය කළ ලස්කිරිඤ්ඤ හමුදාව පැමිණීම ද පෘතුගීසීන් නෙරපා දැමීමට අපහසු වූ තවත් හේතුවක් විය.

ක්‍රි. ව. 1597 දී පළමුවන රාජසිංහ රජුගේ මරණයෙන් පසු සීතාවක රාජ්‍යය අරාජික වීම නිසා පෘතුගීසි බලයට එල්ල වූ සීතාවක විරෝධය නැතිව ගියේ ය.

## 2.5 යාපන රාජ්‍යය සහ පෘතුගීසින් අතර සම්බන්ධතා

පෘතුගීසීන් ලංකාවට පැමිණෙන වන විට යාපනය පාලනය කළේ පරරාජසේකරම් විසිනි. 1519 දී පරරාජසේකරම් මරා සංකිලි නම් කුමාරයෙකු යාපනයේ රජ විය. පරරාජසේකරම්ගේ පුත් ආරක්ෂාව පතා පෘතුගීසින් වෙත පලා ගියේ ය. එහි දී ඔහුගේ පුත්‍රයාගේ ඉල්ලීම පරිදි පෘතුගීසිහු සංකිලි රජුට එරෙහිව ආක්‍රමණය දියත් කළෝය. මෙම ආක්‍රමණයේ දී අරමුණු දෙකක් ඉටුකර ගැනීම පෘතුගීසීන්ගේ අභිලාසය වී තිබිණි. එනම්,

- ❖ යාපනය රාජ්‍යය තුළ කතෝලික ආගම පැතිරවීම
- ❖ කප්පම් ලබා ගැනීම යන ඒවා ය

පෘතුගීසීන් යාපනය ප්‍රදේශයේ කතෝලික ආගම ප්‍රචාරය කිරීම නිසා නැගී සිටි හින්දු පූජකවරු ඔවුන්ට මෙන් ම සංකිලි රජුට ද විරුද්ධ වූහ. සංකිලිගේ ප්‍රතිචාරය වූයේ පෘතුගීසීන්ට එරෙහිව කටයුතු කිරීම යි. ඒ අනුව පෘතුගීසීහු දෙවන වරටත් යාපනය ආක්‍රමණය කළහ. එහි දී උපක්‍රමශීලී වූ සංකිලි, පෘතුගීසීන් සමග යළි සුහද ව කටයුතු කිරීමට එකඟ විය. සංකිලි රජුගේ ක්‍රියාකලාපයට විරුද්ධ වූ යාපන වැසියෝ ඔහු බලයෙන් නෙරපා ඔහු පුත් පුවිරාජ පණ්ඩාරම් රාජ්‍යයට පත් කළහ.

එකී සිදුවීමෙන් පසුව යාපනයේ පාලනය සම්බන්ධ ව රාජ්‍ය උරුමකරුවන් අතර බල අරගලයක් ඇති විය. මේ පසුබිම මත ඇතැම් රාජ්‍ය උරුමකරුවෝ පෘතුගීසීන්ගෙන් සහය පැතුවෝ ය. එයින් ප්‍රයෝජන ගත් පෘතුගීසීහු තමන්ට හිතැති අය පාලකයන් ලෙස පත් කර ගැනීමට කටයුතු කළහ.

1591 දී යාපනය ආක්‍රමණය කළ පෘතුගීසීන්, එදිරිමාන්නසිංහම් නැමැත්තෙකු යාපනයේ රජු ලෙස පත් කර තිබේ. ඔහුගේ මරණයෙන් පසු වර්ෂ 1617 දී සංකිලි නමින් යුත් වෙනත් අයෙකු යාපනයේ රාජ්‍යයට පත් විය. ඔහු උඩරට රාජ්‍යයට පක්ෂපාත වූ බැවින් පෘතුගීසීහු ඔහුට විරුද්ධ වූහ. ඒ අනුව 1619 දී පිලිප් ද ඔලිවේරා යටතේ යැවූ පෘතුගීසි හමුදාවක් විසින් යාපනය යටත් කර ගන්නා ලදි. ඉන් අනතුරුව පෘතුගීසීන්ට එරෙහිව මතු වූ කැරලි මර්දනය කර වර්ෂ 1621 දී යාපනයේ පාලන බලය සම්පූර්ණයෙන් ම පෘතුගීසීන් සතු කර ගැනීමට හැකි විය. මෙලෙස යාපනය පෘතුගීසීන් සතුවීමට බලපෑ හේතු කිහිපයකි.

එනම්,

- ❖ රාජ්‍ය උරුමකරුවන් අතර පැවති බල අරගලය
- ❖ ප්‍රමාණවත් නිත්‍ය හමුදාවක් නොසිටීම
- ❖ ස්වාභාවික ආරක්ෂාවක් නොතිබීම

❖ යාපනයේ කතෝලික ජනතාවගේ සහය පෘතුගීසීන්ට හිමිවීම

යාපනය පෘතුගීසි හමුදාවට යටත්වීමත් සමග එහි දේශීය හමුදාව විසුරුවා හැර පෘතුගීසි හමුදාවක් හා ලස්කිරිඤ්ඤා කුලී හමුදාව ස්ථාපිත කෙරිණ. මේ නිසා යාපනය තුළ ඇති වූ බලපෑම්,

❖ යාපනය, කයිට්ස් හා මන්නාරමේ පෘතුගීසි බලකොටු පිහිටුවීම
❖ යාපනයේ අයවැය කටයුතු භාරව විදෝර් දා පසෙන් දා ඇතුළු වෙනත් නිලධාරීන් පත් කිරීම
❖ කතෝලික ආගම යාපනයේ රාජ්‍ය ආගම බවට පත් කිරීම
❖ සෑම ගමකම කතෝලික පල්ලි පිහිටුවීම යන ආදියයි

## 2.6 සෙංකඩගල රාජධානිය හා පෘතුගීසීන් අතර සම්බන්ධතා

සේනාසම්මත වික්‍රමබාහු සෙංකඩගල රාජධානිය ආරම්භ කළ බව පිළිගැනේ. පෘතුගීසීන් කෝට්ටේ අල්ලා ගත්ත ද එහි වැඩි කොටසක බලය තහවුරු කරගෙන සිටියේ සීතාවක පළමුවන රාජසිංහ රජු ය. එම රජු උඩරට පාලකයාව සිටි කරලියද්දේ බණ්ඩාර පරාජය කළේය. රාජසිංහ රජුට උඩරට ප්‍රදේශ අල්ලා ගැනීමට උදව් කළ වීරසුන්දර බණ්ඩාරව සැකයක් නිසා බොරු වලක දමා මරණයට පත් කළ අතර මෙහිදී ඔහුගේ පුත් කොනප්පු බණ්ඩාර පෘතුගීසීන්ගේ ආරක්ෂාව පැතීය. පරාජයට පත් කරලියද්දේ තම දියණිය වූ කුසුමාසන දේවිය ද බෑනා වූ යමසිංහ බණ්ඩාර ද රැගෙන පෘතුගීසීන් වෙත පලා ගියේ ය. මෙසේ උඩරට රාජ්‍යයේ නීත්‍යානුකූල හිමිකාරිය තමන් සතුවීම පෘතුගීසීන් ලැබූ විශාල ජයග්‍රහණයක් විය. පෘතුගීසි රැකවරණයේ සිටි,

❖ කුසුමාසන දේවිය - දෝන කතිරිනා නමින් ද
❖ යමසිංහ බණ්ඩාර - දොන් පිලිප් නමින් ද
❖ කොනප්පු බණ්ඩාර - දොන් ජුවාන් නමින් ද බෞතීස්ම ලැබූහ.

මෙවන් තත්වයකින් ප්‍රයෝජන ගත් පෘතුගීසීහු දොන් පිලිප් උඩරට රජ කරවීම සඳහා කොනප්පු බණ්ඩාර යටතේ උඩරටට ආක්‍රමණයක් මෙහෙය වූහ. මෙම ආක්‍රමණයේ දී පළමුවන රාජසිංහ රජුගේ බලය උඩරටින් ගිලිහුණු අතර උඩරට රජු ලෙස දොන් පිලිප් පත් විය.

ඔහු කෙටි කාලයකින් මිය ගිය හෙයින් උපක්‍රමශීලී රණශූරයකු වූ වීරසුන්දර බණ්ඩාරගේ පුත් කොනප්පු බණ්ඩාර කුසුමාසන දේවිය විවාහ කර ගනිමින් 1592 දී පළමුවන විමලධර්මසූරිය නමින් උඩරට රජු බවට පත් විය.

මෙයින් උරණ වූ පෘතුගීසීන් අවස්ථා කිහිපයක දී උඩරට රාජ්‍යයට ප්‍රහාර එල්ල කළ ද ඒවා දක්ෂ ලෙස මැඩ පැවැත්වීමට පළමුවන විමලධර්මසූරිය ඇතුළු පාලකයෝ සමත් වූහ.

➢ **දන්තුරේ සටන 1594**

පෘතුගීසීන් පේරෝලෝපෙස් ද සූසා යටතේ කරන ලද උඩරටට ආක්‍රමණය දන්තුරේ නම් ස්ථානයේ දී පළමුවන විමලධර්මසූරිය රජු විසින් ව්‍යර්ථ කරන ලදි. මේ නිසා පළමුවන විමලධර්මසූරිය රජු 'කන්ද උඩරට ද්‍රෝහියා' යන ආක්‍රෝශ නාමයෙන් පෘතුගීසීන් විසින් හඳුන්වා තිබේ.

➢ **බලන සටන 1602**

පෘතුගීසීන් දොන් ජෙරොනිමෝ ද අසවේදු යටතේ උඩරටට කරන ලද ආක්‍රමණය උපක්‍රමශීලීව විමලධර්මසූරිය රජු විසින් බලන කපොල්ල අසල දී නැවතත් ව්‍යර්ථ කරන ලදි.

➢ **රන්දෙණිවල සටන 1630**

තවද කොන්ස්තන්තිනූ ද සා යටතේ කරන ලද ආක්‍රමණය පළමුවන සෙනරත් රජුගේ පුත්‍රයා විසින් රන්දෙණිවල දී මැඩ පවත්වන ලදි.

මේ අනුව පෘතුගීසීන් එක දිගටම එල්ල කළ ආක්‍රමණ මැඩ පැවැත්වීමට උඩරට පාලකයෝ සමත් වූහ.

පෘතුගීසීන් නෙරපීමට නාවික බලය ඇති විදේශීය ජාතියක අවශ්‍යතාව අවබෝධ කර ගත් උඩරට දෙවන රාජසිංහ රජ ලන්දේසි සහාය ලබා ගැනීමට යොමු වූයේ ය. ආරම්භයේ දී එය අසාර්ථක වුව ද ඔහු නැවතත් ලන්දේසීන් සමග සම්බන්ධතා ගොඩනැගීමේ ප්‍රතිඵලයක් ලෙස දෙපාර්ශ්වය අතර 1638 ගිවිසුම ඇති විය. මෙම ගිවිසුමට අනුව ලන්දේසි සහයෙන් පෘතුගීසීන් නෙරපා දැමීමට උඩරට දෙවන රාජසිංහ රජු සමත් වූයේ ය.

- **පෘතුගීසීන්ගේ උඩරට ආක්‍රමණ අසාර්ථක වීමට හේතු,**

- ❖ උඩරට රාජධානියේ පිහිටීම හා භූගෝලීය පරිසරය උඩරැටියන්ට වාසි සහගත වීම
- ❖ උඩරැටියන්ගේ සටන් උපක්‍රම හා රජවරුන්ගේ උපාය කෞශල්‍යය
- ❖ සතුරු ආක්‍රමණවල දී උඩරට ජනතාව රජු වටා එක්වීම
- ❖ පෘතුගීසීන්ගේ සහායට පහත රටින් ගිය ස්වදේශිකයන් සටන්වල තීරණාත්මක අවස්ථාවල දී උඩරට රජුට එක්වීම
- ❖ උඩරට රජුට ලන්දේසීන්ගෙන් ලැබුණු සහයෝගය

## 2.7 පෘතුගීසි ආගමනයෙන් ඇති වූ බලපෑම්

පෘතුගීසීන් මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ කාලපරිච්ඡේදය තුළ යහපත් මෙන් ම අයහපත් බලපෑම් ද ඇති විය. මෙරට ජනතාවට ජාත්‍යන්තර වෙළඳපොළක් නැවත නිර්මාණය වීම යහපත් බලපෑමකි. දේශීය ආගම්වලට පහර වැදීම අයහපත් බලපෑමකි. පොදුවේ බලපෑම් සියල්ල මෙම අංශ යටතේ අධ්‍යයනය කළ හැකිය.

- ❖ දේශපාලන බලපෑම
- ❖ ආගමික බලපෑම
- ❖ සමාජ හා සංස්කෘතික බලපෑම

### 2.7.1 දේශපාලන බලපෑම

පෘතුගීසි පාලන ප්‍රදේශයේ ප්‍රධානියා වූයේ පෘතුගාලයේ රජු ය. ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පාලකයා පෘතුගීසි කපිතාන් ජනරාල්වරයෙකි. ඔහු හමුදාවේ නායකයා මෙන් ම පෘතුගාලයේ රජුගේ නියෝජිතයා ද විය. පාලනයේ ඉහළ තනතුරු වන ආදායම් එකතු කිරීම හා අධිකරණ කටයුතු මෙහෙයවීම ඔහු සතු විය. පහළ තනතුරු සඳහා දේශීය නිලධාරීන් යෙදවීය. පාලනයේ දී දිසාව, කෝරළය පත්තු හා ගම් වැනි පාලන බෙදීම් එලෙස ම යොදා ගෙන තිබේ.

### 2.7.2 ආගමික බලපෑම

මුහුදුබඩ පාලනයේ කැපී පෙනෙන ලක්ෂණය වන්නේ කතෝලික ආගම ප්‍රචාරය කිරීම යි. ඒ සඳහා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කර තිබේ. ඒවා අතර පහත සඳහන් ඒවා වැදගත් වේ.

- ❖ කෝට්ටේ රජ පවුල්වල අය කතෝලික ආගමට හරවා ගැනීම.
- ❖ ධර්මපාල රජු ඇතුළු බොහෝ ප්‍රභූ ජනයාට ෆැන්සිස්කානු පූජකවරුන්ගේ බලපෑමට නතුවීමට සිදුවීම.
- ❖ පෘතුගීසීන් යටතේ තනතුරු අපේක්ෂා කළ අයට කතෝලික ආගම වැලඳ ගැනීමට සිදුවීම.
- ❖ බොහෝ ප්‍රදේශවල කතෝලික දේවස්ථාන ඇති වීම.
- ❖ කතෝලික ආගම වැලඳගත් පුද්ගලයින් බදුවලින් නිදහස් කිරීම.
- ❖ අධ්‍යාපනය සමඟ කතෝලික ආගම පැතිර වීම.
- ❖ කතෝලික ආගම නිසා දේශීය ආගම්වලට පහර වැදීම.
- ❖ බුදුසමය යටපත් වී යාම

### 2.7.3 සමාජ හා සංස්කෘතික බලපෑම

මුහුදුබඩ ප්‍රදේශ පෘතුගීසි පාලනයට නතුවීමත් සමඟ එහි සමාජය හා සංස්කෘතියේ ද විවිධ බලපෑම් සිදුවිය. කතෝලික ජන සමාජය බිහිවීම ඉන් වැදගත්වන අතර පහත සඳහන් අංශවලට ද බලපෑම් එල්ල විය.



රූපය 2.4 පෘතුගීසීන්ගේ බලපෑමෙන් මෙරට ඇඳුම් පැලඳුම් වෙනස් වූ ආකාරය

එනම්,

❖ පුද්ගල නාම ඃ- සිල්වා, පෙරේරා, ප්‍රනාන්දු, අල්විස්, ෆොන්සේකා, කොස්තා, මැල්

❖ ගෘහ භාණ්ඩ ඃ- අල්මාරිය, කනප්පු, බංකු

❖ ඇඳුම් පැලඳුම් ඃ- කමිස, කලිසම්, බොත්තම්, ගාංචු

❖ ආහාර වර්ග ඃ- දෝසි, අච්චාරු, පාන්, සලාද

❖ සංගීතය ඃ- බයිලා, කපිරිඤ්ඤා

❖ ලෙඩරෝග ඃ- ලාදුරු, පරංගි

❖ අධ්‍යාපනය ඃ- අංක ගණිතය, ගීතිකා, ලතින් බස, යාඥා, සංගීතය

❖ වාස්තු විද්‍යාව ඃ- කේතු ආකාර උස් වහල සහිත ගොඩනැගිලි ඉදිවීම යන ඒවා ය.

## ක්‍රියාකාරකම්


1. දේශ ගවේෂණයට මුල් වූ යුරෝපීය ජාතීන් තුනක් නම් කරන්න.
2. යුරෝපීය ජාතීන් දේශ ගවේෂණයට යොමු කළ හේතු මොනවාද?
3. ආසියාවට පැමිණි ප්‍රථම පෘතුගීසි ජාතිකයා නම්කර, පැමිණි ස්ථානය ලියන්න.
4. ලංකාවට පැමිණි ප්‍රථම පෘතුගීසි ජාතිකයා හා පැමිණි ස්ථානය ලියන්න.
5. පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට ලංකාවේ පැවති පාලන ප්‍රදේශ සහ එහි පාලකයන් නම්කරන්න.
6. විජයබාකොල්ලයෙන් පසු කෝට්ටේ රාජ්‍යය බෙදී ගිය කොටස් තුන සහ එහි පාලකයන් නම්කරන්න.
7. උඩරට රාජ්‍යයට එරෙහිව පෘතුගීසි ආක්‍රමණ මෙහෙය වූ නායකයන් සහ එම සටනට මුහුණදුන් දේශීය රජුන් නම් කර සටන පරාජය කළ ස්ථාන ඇතුළත් වගුවක් සකස් කරන්න.
8. කෝට්ටේ රාජ්‍යයේ ආරම්භක රජු සහ අවසාන රජු නම් කරන්න.
9. පෘතුගීසී රැකවරණය ලැබූ උඩරට රාජ්‍ය උරුමක්කාරිය නම් කරන්න.
10. පෘතුගීසීන්ගේ උඩරට ආක්‍රමණ අසාර්ථකවීමට හේතු ලියන්න.
11. ශ්‍රී ලංකාවේ සිතියමක පහත ස්ථාන ලකුණු කර නම්කරන්න.

කොළඹ, කෝට්ටේ, ගාල්ල, මන්නාරම, මහනුවර, යාපනය, සීතාවක, ත්‍රිකුණාමලය, මඩකලපුව, මාතර



# 03

# ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි බලය පැතිරවීම



**හැඳින්වීම**

**පෘතුගීසීන් පලවාහැරීම සඳහා කන්ද උඩරට රජුන් ලන්දේසීන්ගේ සහාය පැතූ ආකාරයත්, මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි බලය ව්‍යාප්ත වූ ආකාරයත්, ඔවුන්ගේ පැමිණීම නිසා ලාංකික සමාජයට විවිධ බලපෑම් එල්ල වූ ආකාරයත් මෙම පාඩමෙන් ඔබට ඉගෙන ගත හැකි ය.**

## 3.1 ලන්දේසීන් ලංකාවට පැමිණීම

### 3.1.1 ලන්දේසීන් පෙරදිගට පැමිණීමේ පසුබිම

- ❖ පෘතුගීසීන් පෙරදිගට පැමිණ කුළුබඩු වෙළෙඳාමෙන් ලබා ගත් අධික ලාභය, ලන්දේසීන් පෙරදිගට පැමිණීමට පෙළඹ වූ මූලික කරුණක් විය.

- ❖ පෘතුගීසි හමුදාවේ සේවය කළ ලින් ෂෝටින් නමැති ලන්දේසි ජාතිකයා 1595 - 1596 අතර කාලයේ දී පෙරදිගට පැමිණිය හැකි ගමන් මාර්ග දැක්වෙන සිතියමක් හා පෙරදිග රටවල් පිළිබඳ විස්තර ඇතුළත් පොත් දෙකක් ප්‍රකාශයට පත් කිරීම.

- ❖ පෙරදිග රටවල් තුළ වෙළෙඳ ගබඩා පිහිටුවීම, බලකොටු ඉදිකිරීම, හමුදා පාලනය, රටවල් සමග ගිවිසුම් ඇතිකර ගැනීම වැනි බලතල ලන්දේසි ආණ්ඩුව ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමට පවරාදීම.

- ❖ ඇම්ස්ටර්ඩෑම් ප්ලාන්ඩර්ස් වැනි ප්‍රසිද්ධ වෙළෙඳ වරායන් හා නගර ඕලන්දයේ පිහිටා තිබීම නිසා වෙළෙඳ කටයුතු සාර්ථක කර ගැනීම එම සමාගමට වාසි සහගත වීම.

- ❖ ක්‍රිස්තියානි රෙපරමාදු ආගම පෙරදිග ප්‍රචාරය කිරීමට ලන්දේසීන්ට තිබූ අවශ්‍යතාව.

1602 දී ලන්දේසීහු ඔවුන්ගේ පෙරදිග වෙළෙඳ මධ්‍යස්ථානය වශයෙන් වර්තමාන ඉන්දුනීසියාවට අයත් ජාවා දූපතේ බතාවියාව තෝරාගත්හ. මුලින් ම නැගෙනහිර දූපත් ප්‍රදේශ තුළ තම බලය ව්‍යාප්ත කර ගත් ඔවුහු පසුව පෘතුගීසි බල ප්‍රදේශවලට අවධානය යොමු කළෝය.

රූපය 3.1 ලන්දේසි වෙළෙඳුන් පෙරදිගට පැමිණ භාණ්ඩ ලබා ගැනීම



### 3.1.2 ලන්දේසීන් ලංකාවට පැමිණීමේ පසුබිම

- ඔවුන්ගේ ප්‍රධාන අරමුණ වූයේ කුළුබඩු ලබා ගැනීමයි. විශේෂයෙන් කුරුඳුවලට පෙර අපර දෙදිග වෙළෙඳපොලෙහි අධික ඉල්ලුමක් තිබූ නිසා කුරුඳු වැවෙන ප්‍රදේශ තමන් සතු කර ගැනීම ඔවුන්ගේ අපේක්ෂාව විය.


- පෙරදිග රටවල වෙළෙඳ හා නාවික බලය තහවුරු කර ගැනීමට උපකාරී වන ත්‍රිකුණාමලය, කොළඹ, ගාල්ල වැනි වරායන් හා මීගමුව, කල්පිටිය, මාතර, මඩකලපුව වැනි නැව්තොටු ලංකාවේ පිහිටා තිබීම.

- පෘතුගීසීන් මෙරටින් නෙරපා දැමීම සඳහා ආධාර කරන ලෙස දෙවන රාජසිංහ රජු ලන්දේසීන්ගෙන් ඉල්ලා සිටීම.

## 3.2 ලන්දේසීන් පැමිණෙන විට ලංකාවේ දේශපාලන පසුබිම

ඒ සමය වන විට ලංකාව ප්‍රධාන දේශපාලන ඒකක දෙකකට බෙදී පැවතුණි. එනම් පෘතුගීසි පාලනය යටතේ පැවති මුහුදු බඩ ප්‍රදේශ හා උඩරට රජු යටතේ පැවති උඩරට ප්‍රදේශත් ය.

1638 වන විට ලංකාවේ පැවති දේශපාලන ඒකක



## 3.3 කන්ද උඩරට රජුන් පෘතුගීසීන් පළවා හැරීමට ලන්දේසීන්ගේ සහාය පැතූ ආකාරය හා මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි බලය තහවුරු වීම

පළමුවන විමලධර්මසූරිය රජුගේ ඉල්ලීම පරිදි 1602 ජූලි මාසයේ දී ලන්දේසි දූතයෙකු වූ ජෝරිස් වැන් ස්පිල්බර්ජන් ලංකාවට පැමිණ රජු බැහැදැක්කේය. එහිදී ඕලන්ද රජුගේ සන්දේශය පිළිගැන්වීය. තමන්ට ලංකාවේ වෙළෙඳාම් කිරීමට ඉඩ දෙන්නේ නම් පෘතුගීසීන් ලංකාවෙන් නෙරපා හැරීමට රජුට උදව් කරන බව එහි සඳහන් විය. සතුටට පත් රජතුමා, ස්පිල්බර්ජන්ට තෑගි බෝග දී ලන්දේසීන් සමග සම්බන්ධතා පැවැත්වීමට කැමැත්ත පළ කළේ ය. රජු සහ ස්පිල්බර්ජන් අතර දැඩි මිත්‍රත්වයක් ඇති වූ අතර ස්පිල්බර්ජන් ලන්දේසි සංගීතඥයන් දෙදෙනෙකු ද රාජ සභාවේ නැවැත් වූ බව සඳහන් වේ. රජතුමා ලන්දේසි භාෂාව ඉගෙන ගන්නට පටන්ගත් බව ද වාර්තා වේ. මෙය පෘතුගීසීන් පලවා හැරීම සඳහා කන්ද උඩරට රජු ලන්දේසීන්ගේ සහාය පැතූ පළමුවන අවස්ථාව වේ.



**රූපය 3.2 පළමුවන විමලධර්මසූරිය රජු ස්පිල්බර්ජන් හමුව**

ඊට තුන් මසකට පසු දෙවෙනි උත්සාහය සිදු වූ බව වාර්තා වේ. ඊට අනුව එම වර්ෂයේ දී ම සීබල් ද වාර්ට් නම් ලන්දේසි නැවියා රජතුමා හමුවීමට පැමිණියේ ය. පසුව මඩකලපුවේ නැංගුරම්ලා තිබූ පෘතුගීසි නැව් අල්ලා ගැනීමේ කටයුතුවල යෙදුණේ ය. දෙපක්ෂය එකඟ වූ පරිදි, අල්ලාගත් නැව් රජු වෙත භාර නොදුන්නේ ය. ඒ පිළිබඳ කරන ලද සාකච්ඡාවක දී රජුට අගෞරව වන ආකාරයට ද වාර්ට් හැසිරුණු බැවින් රාජ පුරුෂයන් අතින් ඔහු හා පනස්දෙනෙක් ජීවිතක්ෂයට පත් වූහ. එහෙයින් විමලධර්මසූරිය රජු හා ලන්දේසීන් අතර සබඳතා බිඳ වැටුණි. සෙනරත් රජුගේ කාලයේ දී ලන්දේසීන් හා රජු අතර සාකච්ඡා පැවැත්වුව ද අසාර්ථක විය.

එහෙත් දෙවන රාජසිංහ රජ පෘතුගීසීන් නෙරපා දැමීම සඳහා ලන්දේසීන් සමග සබඳතා පවත්වා ගැනීමට සමත් වූයේ ය.

මේ අනුව පෘතුගීසීන් මෙරටින් නෙරපා හැරීම සඳහා උඩරට රජ හා ලන්දේසීන් අතර 1637 දී සෘජුව ම සාකච්ඡා ඇති විය. ඒ අතර

- ❖ අද්මිරාල් වෙස්ටර් වෝල්ඩ් සුවිශාල නැව් හමුදාවක් රැගෙන ලංකාවට පැමිණීම
- ❖ දෙවන රාජසිංහ රජු 15000ක සේනාවක් සමග මඩකලපුව ආසන්නයේ කඳවුරු බැඳීම
- ❖ ලන්දේසීන්, මඩකලපු පෘතුගීසි බලකොටුවට පහරදීම
- ❖ එය යටත් වූ පසු දෙවන රාජසිංහ රජුට පවරාදීම
- ❖ ක්‍රි. ව. 1638 උඩරට ලන්දේසි ගිවිසුම අත්සන් කිරීම සිදු විය. මඩකලපුව අල්ලා ගැනීමෙන් දින පහකට පසු මෙම ගිවිසුම අත්සන් කෙරිණි.

කෙසේ නමුත් මෙම ගිවිසුමට අනුව නිසියාකාරව සබඳතා පැවතුණේ නැත. ලන්දේසීන් විසින් අල්ලා ගත් බලකොටු තමාට භාර දෙන ලෙස රජ ඉල්ලී ය. එයට ලන්දේසීන්ගෙන් පිළිතුරක් නොලැබීමෙන් පැහැදිලි වන්නේ මුහුදුබඩ ප්‍රදේශවල බලය තමන් සතුකර ගැනීමට ලන්දේසීන් උත්සාහ දැරූ බවයි. කෙසේ වුවත් 1638 වන විට පෘතුගීසීන් මෙරටින් පලවා හැරීමට ලන්දේසීන්ගේ උදව් ලබා ගැනීමට රජ වූයේ ය.

**1638 උඩරට ලන්දේසි ගිවිසුමේ මූලික කරුණු**

1. පෘතුගීසීන් මෙරටින් පලවා හැරීමට උඩරට රජුට සහාය දීමට ලන්දේසීන් එකඟ වීම.
2. ලන්දේසීන්ට වැයවන මුදල් වෙළෙඳ ද්‍රව්‍ය (කුරුඳු, ගම්මිරිස්, මී ඉටි ආදිය) මගින් ගෙවීමට රජු එකඟ වීම.
3. ඇතුන් හැර උඩරට සෙසු වෙළෙඳ ද්‍රව්‍ය පිළිබඳ ඒකාධිකාරය ලන්දේසීන්ට ලැබීම.
4. පෘතුගීසීන්ගෙන් අල්ලාගන්නා ලද බලකොටුවල රජු කැමති නම් ලන්දේසි හමුදාව නතර කරවීමට එකඟ වීම.

1638 ගිවිසුම ලන්දේසි මන්ත්‍රණ සභාව අනුමත කළ අතර රජුට දුන් පිටපතේ හා ලන්දේසීන් සතු පිටපතේ පරස්පරතාවක් ඇති බව රජුට අවබෝධ විය. තමාට අවාසි සහගත තත්වයක් ඇති බවත් ලන්දේසීන් තමා රැවටූ බවත් රජුට වැටහිණ.

1638 ගිවිසුමේ පිටපත් දෙකෙහි වෙනස්කම්


| | |
|---|---|
| රජුගේ ගිවිසුම් පිටපත | පෘතුගීසීන්ගෙන් අල්ලාගන්නා බලකොටුවල ආරක්ෂාව සඳහා **රජු කැමති නම් පමණක්** ලන්දේසි සෙබළුන් රැඳවිය හැකි ය. |
| ලන්දේසීන්ගේ ගිවිසුම් පිටපත | පෘතුගීසීන්ගෙන් අල්ලාගන්නා ලද බලකොටුවල ආරක්ෂාව සඳහා ලන්දේසි සෙබළුන් රැඳවිය හැකිය. |

ලන්දේසීන් උපායශීලී ලෙස ගිවිසුමේ රජු කැමති නම් පමණක් යන වගන්තිය ඉවත් කොට තිබුණි. මෙයට මුල දී අකමැති වූ රජු ලන්දේසීන්ගේ ආධාර නොමැතිව පෘතුගීසීන් මෙරටින් පන්නා දැමීමට නොහැකි බව වටහාගත් නිසා එකඟ වූයේ ය.

ලන්දේසීන් විසින් අල්ලාගත් බලකොටු

| අල්ලාගත් වර්ෂය | බලකොටුව |
|---|---|
| 1639 | ත්‍රිකුණාමලය |
| 1640 | මීගමුව |
| 1640 | ගාල්ල |
| 1652 | කළුතර අඟුරුවාතොට |
| 1656 | කොළඹ කොටුව |
| 1658 | මන්නාරම හා යාපනය |


1642 දී පෘතුගාලය හා ඕලන්දය අතර යුරෝපයේ දී දස අවුරුදු සාම ගිවිසුම ඇති විය. ඒ අනුව ලංකාවේ දී පෘතුගීසි ලන්දේසි ගැටුම නතර විය. එහෙත් දෙපක්ෂය අතර මුහුදුබඩ ප්‍රදේශ බෙදාගැනීමට සාකච්ඡා මෙන් ම අරගල ද ඇති විය. ක්‍රි. ව. 1652 දී සාම කාලය අවසන් වූ අතර කළුතර අගුරුවාතොට බලකොටුව ලන්දේසීන් විසින් අල්ලා ගන්නා ලදි.



රූපය 3.3 බලකොටුවක දර්ශනයක්

උඩරට රාජ්‍යය හා ලන්දේසීන් අතර සබඳතා ඇතිවීම වැළැක්වීම සඳහා 1630 න් පසු රජු සමග මිතුදමක් ගොඩනගා ගැනීමට පෘතුගීසීන් උත්සහ දරා ඇත. ඒ වෙනුවෙන් 1634 දී ''අට්ටාපිටිය ගිවිසුම'' නමින් ගිවිසුමක් ඇති කරගත්ත ද එය සාර්ථක උත්සාහයක් නොවී ය.


දෙවන රාජසිංහ රජු සහ ලන්දේසීන් අතර ගිවිසුමක් ඇති වන බව දැනගත් පෘතුගීසීහු එය වැලැක්වීම සඳහා 1638 දී දියෝගු ද මෙලෝගේ නායකත්වයෙන් උඩරට ආක්‍රමණය කළෝ ය. ඔවුන් ගන්නෝරුවේ දී සමූල ඝාතනය කෙරිණි.




රූපය 3.4 ගාලු කොටුවේ පැරණි සිතුවමක්

රූපය 3.5
ලන්දේසි පෙරදිග ඉන්දීය වෙළෙඳ සමාගමේ ලාංඡනය ( VOC )








සිතියම 3.1
දහඅටවන සියවස
උඩරට සහ ලන්දේසි දේශ සීමා
(1766 ට පෙර)
ලංකා ඉතිහාසය
ගුණසේන ප්‍රකාශන III කාණ්ඩය

## 3.4 මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි පාලනයේ ප්‍රතිඵල

පරිපාලනය අඩු වියදමකින් සිදුකර වැඩි ලාභ ලබා ගැනීම ලන්දේසීන්ගේ අරමුණ විය. ඒ සඳහා තමන් සතු ප්‍රදේශවල පාලනය ක්‍රමවත් කර ගැනීමට ඔවුන්ට අවශ්‍ය විය. පෘතුගීසීන් අනුගමනය කළ පරිදි ම ලන්දේසීහු දේශීය පරිපාලන ක්‍රමය ප්‍රයෝජනයට ගත් අතර උඩරට සමග සාමයෙන් කටයුතු කිරීමට ද උත්සාහ දැරූහ.

ලන්දේසි පාලන ව්‍යුහය




## 3.5 පරිපාලන වෙනස්කම්

ලන්දේසීන් සතු ප්‍රදේශවල පරිපාලන පාලන ඒකක තුනකි. එනම් ගාල්ල, කොළඹ හා යාපනය යි. ඒවායේ පරිපාලන ව්‍යුහය මෙසේ ය.

- **කොමාන්ඩර් (කොමදෝරු)**
  - **සිවිල් පාලනය**
    - **දිසාවේවරු (ලන්දේසි)**
      - **මුදලි (විවිධ සේවා)**
        - **විදානේවරු**
      - **කෝරාල (කෝරළය)**
        - **පත්තු (අතුකෝරළ)**
          - **ගම (ගම්මුලාදෑනි)**
  - **හමුදා පාලනය**
    - **හමුදා කපිතාන්වරු**
  - **වෙළෙඳ අංශ**
    - **ඔපර් හුෆ්ටිමන් (ජ්‍යෙෂ්ඨ වෙළෙන්දා)**
      - **හුෆ්ටිමන් (ඉඩම් ආදායම් නිලධාරී)**

පරිපාලනයේ ඉහළ නිලතලවලට ලන්දේසි ජාතිකයන් පත් කිරීම හා බතාවියේ සිටින ප්‍රධාන ආණ්ඩුකාරවරයා සහ උපදේශක සභාවේ උපදෙස් මත පාලනය ගෙන යාම මෙහි මූලික ලක්ෂණයකි.




රූපය 3.6 විලෙම් ෆල්ක් ආණ්ඩුකාරවරයා

### 3.5.1 ආර්ථික බලපෑම

ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රාජ්‍ය සමයේ දී ලන්දේසීන් හා රජු අතර විදේශීය වෙළඳාම සම්බන්ධයෙන් ගැටුම් ඇති විය. පුත්තලම, කල්පිටිය වැනි වරායන් විදේශ වෙළඳාම සඳහා නිදහස් කර දෙන ලෙස රජු ලන්දේසීන්ට දැනුම් දුන්න ද ලන්දේසීහු එයට එකඟ නොවූහ. එම හේතුව නිසා රජු විසින් කඩවත් වසාදමා ලන්දේසීන්ගේ වෙළෙඳාමට බාධා ඇති කරන ලදි.

ලන්දේසීන්ගේ ආර්ථික කටයුතුවලින් සමහරක් පහත දැක්වේ.

- ❖ ඉන්දියාවේ වෙළෙඳපොළ සඳහා අලි, ඇතුන්, පුවක්, සක් බෙල්ලන්, මුතු වැනි වෙළඳ භාණ්ඩ වැඩි වශයෙන් සැපයීම
- ❖ යුරෝපීය වෙළෙඳපොළ සඳහා ලංකාවේ කුරුඳු සැපයීමට කටයුතු කිරීම. ඒ සඳහා කුල ක්‍රමය මත පදනම්ව ශ්‍රමය ලබා ගැනීම.
- ❖ ඉඩම්වලින් බදු අය කර ගැනීම
- ❖ ගම්මිරිස්, උක්, පොල්, කෝපි හා කපු ආදී භෝග මෙරට වගා කිරීමට උත්සාහ දැරීම
- ❖ ලංකාවේ සහල් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා මුතුරාජවෙල අස්වැද්දීම, යෝධ කණ්ඩිය, කන්තලේ ආදී වැව් ප්‍රතිසංස්කරණය කිරීම.
- ❖ ලංකාවේ ප්‍රවාහනය දියුණු කිරීම සඳහා මාතර සිට මන්නාරම දක්වා මාර්ග යක් තැනීම සහ පුත්තලම ඇළ සහ බොල්ගොඩ ඇළ කැපීම, හැමිල්ටන් ඇළ ඉදි කොට භාණ්ඩ ප්‍රවාහනය කිරීම.



රූපය 3.7 ලන්දේසි වෙළඳුන් ලංකාවෙන් ගෙන ගිය භාණ්ඩ



රූපය 3.8 අලි හීලෑ කිරීම

❖ මොරටුවේ වඩු කර්මාන්තය, කැලණියේ උළු කර්මාන්තය හා යාපනයේ රෙදි සායම් කිරීමේ කර්මාන්තය, පුත්තලම, හලාවත, මන්නාරම රෙදි විවීමේ කර්මාන්තය ඇති කිරීම.

### 3.5.2 සමාජීය බලපෑම්

❖ ලංකාවේ පැවති කුල ක්‍රමය, රාජකාරි ක්‍රමය, ලන්දේසීන්ගේ ආර්ථික අරමුණු ඉටුකර ගැනීම සඳහා භාවිත කිරීම.

❖ පාසල් ආරම්භ කිරීම, මෙම පාසල් තුළ මව්බස, කියවීම හා ලිවීම, රෙපරමාදු ආගම වැනි විෂයන් ඉගැන්වීම මගින් ලන්දේසි සංස්කෘතියට අනුව හැඩගැසුණු පිරිසක් ලංකාව තුළ බිහිවීම.

❖ 1739 දී මුද්‍රණ ශිල්පය හඳුන්වාදීම නිසා බයිබලය සිංහලයට පරිවර්තනය කිරීම, සිංහල හා දෙමළ භාෂාවන්වලින් ක්‍රිස්තියානි ධර්මය පිළිබඳ පොත් මුද්‍රණය කිරීම තුළින් ලාංකීය සමාජයට ආගමික බලපෑම් ඇති කිරීමට කටයුතු කිරීම.

❖ රෝම ලන්දේසි නීති ක්‍රමය හඳුන්වාදීම නව උසාවි පද්ධතියක් ආරම්භ කිරීම.

| | |
|---|---|
| රාද්වැන් ජස්ටිට් | - මහාධිකරණය |
| ලෑන්ඩ්රාද් | - ඉඩම් උසාවිය |
| සිවිල්රාද් | - සිවිල් උසාවිය |

❖ යාපනයේ පැවති තේසවලාමෙම නීති ක්‍රමය යාවත්කාලීන කිරීම.

❖ රවුම් කුලුනු සහිත විශාල ඉස්තෝප්පු, උස් වහල, ලී කැටයම් ආදියෙන් සමන්විත ලන්දේසි ගෘහ නිර්මාණ ලක්ෂණ ලාංකික සමාජයට එකතු වීම.



රූපය 3.9 සිංහල සමාජයට එකතු වූ ලන්දේසි ඇඳුම්

❖ ලාංකීය ජන සමාජයට ලංසි (බර්ගර්) නමින් හඳුන්වන ජන කණ්ඩායමක් එකතුවීම හා කුල ක්‍රමය නොසලකා රෙපරමාදු ආගම වැළඳගත් අයට විශේෂ වරප්‍රසාද හිමිවීම.

❖ ලන්දේසි පෙළපත්නාම හා පුද්ගලනාම ලාංකීය ජන සමාජයට එකතුවීම, සිංහල භාෂාවට ඉස්තෝප්පුව, ඉස්කුරුප්පුව, සොල්දරය, කොකිස් ආදි වචන එකතු වීම.

### 3.5.3 ආගමික බලපෑම

17 වන සියවස මැද භාගයේ දී පමණ ඕලන්දයේ පිළිගත් ආගම වශයෙන් රෙපරමාදු ක්‍රිස්තියානි ආගම පත්විය. එහෙයින් ලන්දේසීහු පෙරදිග රටවල දී ද ඔවුන්ගේ ආගම ප්‍රචාරය කිරීම ආරම්භ කළහ. ලන්දේසීහු ලංකාවේ කතෝලික සහ දේශීය අනිකුත් ආගමිකයන් රෙපරමාදු ආගමට හරවා ගත්හ. රෙපරමාදු ආගම ලංකාවේ ප්‍රචාරය සඳහා, පිලිප් බල්දියෙස් වැනි ෆෙඩ්‍රිකන්ට්වරු (ආගමික දේශකයෝ) ලංකාවට පැමිණියහ

ලන්දේසීන්ගේ ආගමික කටයුතුවලින් සමහරක් මෙසේය.


❖ කොළඹ, යාපනය, මන්නාරම, ගාල්ල ආදී මධ්‍යස්ථානවල ආගමික මණ්ඩල පිහිටුවීම
❖ දෙමළ හා සිංහල භාෂාවලින් ආගම ප්‍රචාරය ඇරඹීම
❖ ක්‍රිස්තියානි දේශකයන් හා දේවගැතිවරුන් පුහුණු කිරීම සඳහා සෙමනේරි ඇති කිරීම
❖ රෙපරමාදු ආගමිකයන්ට මුදලි, මුහන්දිරම් වැනි නිලතල හා වරප්‍රසාද ලබාදීම
❖ කතෝලිකයන් මර්දනය සඳහා විවිධ අණපනත් ඇති කිරීම වැනි ක්‍රියාමාර්ග ගැනීම

දෙවන විමලධර්මසූරිය රජු විසින් ලන්දේසීන්ගේ නාවික සහයෙන් පහළ බුරුමයෙන් භික්ෂූන් වහන්සේලා වැඩමවා ලක්දිව උපසම්පදාව නැවත පිහිටුවන ලදි.

කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය සමයේ ද නැවත උපසම්පදාව ලක්දිව පිහිටුවීම සඳහා සියම් දේශයෙන් (තායිලන්තය) භික්ෂූන් වහන්සේලා වැඩම කිරීම සඳහා ලන්දේසීන්ගේ නාවික සහය ලබාගෙන ඇත. එහෙත් 1766 දී ලන්දේසීන් හා කීර්ති ශ්‍රී රාජසිංහ රජු අතර බරපතල ගැටුම් නිර්මාණය විය. එහි ප්‍රතිඵලය වූයේ විලෙම් ෆල්ක් ආණ්ඩුකාරවරයා සමග වගන්ති 25කින් යුක්ත අවාසිදායක ගිවිසුමකට එකඟ වීමට රජුට සිදුවීම යි.

## ක්‍රියාකාරකම්

1. ලන්දේසීන් ශ්‍රී ලංකාවට පැමිණි අවධියේ ලංකාවේ පැවැති දේශපාලන තත්වය විස්තර කරන්න.
2. 1638 ගිවිසුමේ මූලික කරුණු 03 සඳහන් කරන්න.
3. ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශවල ආර්ථිකය දියුණු කිරීමට ගත් ක්‍රියාමාර්ග ලැයිස්තුගත කරන්න.
4. ලන්දේසීන්ගේ පැමිණීම නිසා ඇති වූ සාමාජික බලපෑම යන මැයෙන් බිත්ති පුවත්පතකට ලිපියක් සපයන්න.



# 04
# ලෝක ශිෂ්ටාචාරවල ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා




**හැඳින්වීම**

ඔබ තුන්වන ශ්‍රේණියේ දී පස්වන පරිච්ඡේදය යටතේ ලෝකයේ පැරණි ශිෂ්ටාචාරවල ආරම්භය හා ඒවායේ වර්ධනය පිළිබඳ අධ්‍යයනය කර ඇත. එහෙයින් මෙහි දී පසුකාලීනව යුරෝපයේ ගොඩනැගුණු ග්‍රීක හා රෝම ශිෂ්ටාචාර පිළිබඳව පමණක් හා ක්‍රි. පූ. හයවන සියවසේ සිට මෞර්ය යුගය අවසානය දක්වා ඉන්දීය ඉතිහාසයේ කැපී පෙනෙන ලක්ෂණ පිළිබඳ කියාදීමට අපේක්ෂිත ය.



නොමිලේ බෙදා හැරීම පිණිසයි




**සිතියම 4.1**

**ඉපැරණි ලෝක ශිෂ්ටාචාර පොත ඇසුරෙනි**

## 4.1 ග්‍රීක ශිෂ්ටාචාරය

### 4.1.1 ග්‍රීසියේ භූගෝලීය පිහිටීම

බටහිරින් අයෝනික් මුහුදටත්, නැගෙනහිරින් ඊජියන් මුහුදටත්, මැදිව මධ්‍යධරණී මුහුදට නෙරා ඇති අර්ධද්වීපය හා ඊට දකුණින් ඇති ක්‍රීට් දිවයින ඇතුළු කුඩා දූපත් සමූහය පැරණි ග්‍රීසියට අයත් වේ.

උස් භූමිවලින් යුක්ත රළු කඳුවැටි අතර ඔලිම්පස් කන්ද කැපී පෙනේ. හැම අතට ම විහිදී ගිය කඳුවැටි නිසා ගොඩබිම් මිටියාවත් සිය ගණනකින් යුක්ත වේ. ග්‍රීසියේ වෙරළ බොහෝ කඩතොලු සහිත ය. සෞම්‍ය දේශගුණයකින් යුක්තය. මෙහි ගොඩනැගුණ ශිෂ්ටාචාර පිළිබඳ අධ්‍යයනයට ඇති ප්‍රධාන මූලාශ්‍රය වනුයේ,

- පුරාවෘත්ත
- හොමර්ගේ ඉලියඩ් හා ඔඩිසි යන කෘති
- පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ආදිය යි.

### 4.1.2 ග්‍රීක ශිෂ්ටාචාරයේ ආරම්භය හා ව්‍යාප්තිය

ජනගහනය වැඩිවීමත් සමගම නව ප්‍රදේශවල ජනපද පිහිටුවීම නිසා ක්‍රි. පූ. 4000 පමණ වන විට ග්‍රීසියට දකුණු දෙසින් පිහිටි ක්‍රීට් දිවයිනේ ශිෂ්ටාචාරයක් ගොඩනැගුණි. එය **ඊජියන් හෙවත් මිනෝවාන්** ශිෂ්ටාචාරය ලෙස හඳුන්වයි.

ක්‍රි. පූ. 2000 පමණ වන විට ඔවුන් වෙළඳාමෙන් දියුණුව සිටි අතර ක්‍රි. පූ. 2500-1400 අතර කාලයේ මිනෝවාන් ශිෂ්ටාචාරය ඉතාම දියුණුව පැවතුණි. **ක්නෝසස්** එහි අගනුවර වේ. ක්නෝසස් කඳු මුදුනෙහි මිනෝවාන් රජුගේ විශාල අලංකාර රාජ මාලිගය පිහිටා තිබුණි. එහි නටබුන් අදටත් දක්නට ලැබේ. ඊජිප්තුවෙන්, සිරියාවෙන්, සුළු ආසියාවෙන් හා ග්‍රීසියෙන් මිනෝවාන්වරුන්ගේ නොයෙක් කලා කෘති සොයාගෙන ඇත. එයින් කියවෙන්නේ නිෂ්පාදන මෙන් ම දියුණු වෙළෙඳාමක් ද ඔවුන් සතුව පැවති බවයි. මුලින් ම මේ ශිෂ්ටාචාරයේ නටබුන් සොයාගත් **ආතර් එවන්ස්** නම් පුරාවිද්‍යාඥයා පෙන්වා දෙන්නේ ගෘහ නිර්මාණ ශිල්ප ක්‍රමයේ මෙන් ම කලාශිල්ප පිළිබඳ මනා නිපුණත්වයක් ඔවුන් ලබා සිටි බව යි. එය නටබුන්වලින් අනාවරණය වේ.



රූපය 4.1 මිනෝවාන් මාලිගය

මිනෝවාන් ශිෂ්ටාචාරය පරිහානියට පත්වීමත් සමග 'මසිනියානුවරු' ක්‍රීට් දිවයින යටත් කරගත්හ. එම පාලන අවධිය **මසිනියානු අවධිය** ලෙස හැඳින්වේ. මසිනියන්වරුන් ද ග්‍රීක භාෂාව ම කතා කරන්නට ඇත. ඒ අනුව **මිනෝවාන්වරු හා මසිනියාන්වරු** ග්‍රීකයන්ගේ මුතුන් මිත්තෝ වෙති. ඔවුන්ගෙන් ග්‍රීක ශිෂ්ටාචාරය ආරම්භයට හා හැඩ ගැසීමට විශාල අනුබලයක් ලැබුණි.

මේ අනුව ක්‍රි. පූ. 2000 දී පමණ ආරම්භ වූ ග්‍රීක ශිෂ්ටාචාරය ක්‍රි. පූ. 1600 දී පමණ ඉන්දු-යුරෝපා ජනවර්ගයක් වූ ඒජියන්වරු ආක්‍රමණය කළහ. මෙසේ වරින් වර ග්‍රීසියට කඩාවැදුණු ආර්යයෝ ග්‍රීසියේ හා ක්‍රීට් දිවයින ඇතුළු අසල්වැසි දිවයින්වල පදිංචි වූහ. ක්‍රි. පූ. 1200 දී පමණ **ට්‍රොයි නගරය** ද ඔවුහු අල්ලා ගත්හ. මීට අමතරව ග්‍රීක භාෂාව කථා කළ **අයෝනියන්, ඉයලික්** ආදීහු ග්‍රීසිය ආක්‍රමණය කොට ජනපද පිහිටුවා ගත්හ.

මේ අනුව ග්‍රීක ජනපද සුළු ආසියාව, කළු මුහුදට උතුරින් හා දකුණින් ද දකුණු ඉතාලියේ ද උතුරු හා මධ්‍යධරණී ප්‍රදේශවල ද ව්‍යාප්ත විය. ක්‍රි. පූ. 1000 දී පමණ **ඩෝරියන්** නම් ආර්ය ගෝත්‍රිකයන්ගෙන් ග්‍රීක වැසියන්ට දැඩි බලපෑමක් එල්ල විය. එහෙත් ඔවුහු ද ආදි ග්‍රීක වැසියන්ගේ ජන ජීවිතය හා නගර මුළුමනින් ම විනාශ නොකොට ග්‍රීක ශිෂ්ටාචාරය නව මුහුණුවරකට ගෙන ආවෝය.

මුල දී තැනිතලා ප්‍රදේශවල කුඩා ගම් තනාගත් ආර්යයෝ කෘෂිකර්මාන්තය හා සත්ව පාලනය තම ජීවන වෘත්තිය කර ගත්හ. ඔවුන් ආර්ථික වශයෙන් දියුණුවත් ම නගර බිහිවන්නට විය. ක්‍රි. පූ. 700 පමණ වන විට ඒ නගරවලට ම ආවේණික වූ පාලන ක්‍රම ගොඩනගා ගත්හ. මෙසේ පාලනය වූ නගර රාජ්‍ය **පෞර රාජ්‍ය** නමින් ද හඳුන්වයි. එවැනි පෞර රාජ්‍ය ගණනාවක් ග්‍රීසියට අයත්ව තිබුණි. ඒ අතර **ඇතැන්ස්, ස්පාටා, ඇකේඩියා,** යන ඒවා වැදගත් වේ.

ක්‍රි. පූ. 521 දී පර්සියාවේ බලයට පත් වූ **ඩේරියස්** රජු තම අධිරාජ්‍ය බලය ග්‍රීසිය දක්වා ව්‍යාප්ත කර තිබුණි. මෙකල ග්‍රීක පෞර රාජ්‍යවල නායකයන්ගේ අනුබලය මත ඩේරියස් රජුට විරුද්ධව ඇති වූ කැරැලි මර්දනය කළ ඩේරියස් රජු තමන්ට අවනත වන ලෙස ග්‍රීක පෞර රාජ්‍යවලට නියෝග කළේ ය.

එයට ග්‍රීකයන් අවනත නොවූ නිසා ඩේරියස් රජු ග්‍රීසියට විරුද්ධව යුද වැදුණේ ය. පර්සියන් හමුදාව ඇතැන්ස් රාජ්‍යයට ළඟාවත් ම ඇතැන්ස්වරු, ස්පාටා රාජ්‍යයෙන් උදව් ඉල්ලා දක්ෂ ධාවන ශූරයකු වූ **'පොයිඩ් පීඩිස්'** එහි යැවී ය. ඇතැන්ස් හා ස්පාටා රාජ්‍ය දෙක අතර දුර කි. මී. 240 කි. පොයිඩ් පීඩිස්ට මෙම දුර දිවීමට පැය 24ක් වත් ගත නොවුව ද ස්පාටාවෙන් ආධාර ලැබීමට පෙර ඇතැන්ස්වරු **මැරතන්** නම් ස්ථානයේ දී ඩේරියස් රජු ව පරාජයට පත් කළහ.

**එම ජයග්‍රහණය පිළිබඳ පුවත ඇතැන්ස් නගරය වෙත ගෙන යෑම භාර වූයේ ද පොයිඩ් පීඩිස්ට ය. ඔහු මැරතන් සිට ඇතැන්ස් දක්වා වූ කි. මී. 42ක් පමණ දුර වේගයෙන් දිවගොස් අප දිනුවා යි කියමින් ඇතැන්ස් නගරය මධ්‍යයේ මැරී වැටුණේ ය. මේ අවස්ථාව සිහි කිරීම හා ඔහුට ගරු කිරීමක් වශයෙන් ඔලිම්පික් ක්‍රීඩා තරගයේ දී කි. මී. 42ක් දුර දිවීමේ මැරතන් නම් තරගය පවත්ව යි.**

මේ අනුව ග්‍රීකයන් පරාජය කිරීමට ඩේරියස් රජුට නොහැකි වුවත් ඔහුගේ පුත් **සර්ෂාස්** රජ ඔවුන් පරාජය කොට පෞර රාජ්‍යය යටත් කර ගත්තේ ය. එපමණක් නොව ඇතැන්ස් නගරය ද ගිනිබත් කළේ ය. නමුත් මේ ග්‍රීක රාජ්‍ය පර්සියන්වරුන්ට යටත්ව පැවතියේ කෙටි කාලයකි. ඇතැන්ස් හි **පෙරික්ලීස්** රජු යටතේ නැවත සංවිධානය වූ ග්‍රීකයෝ ක්‍රි. පූ. 479 දී පමණ පර්සියන්වරු පලවාහැර යළිත් ස්වාධීන වූහ. පසුව ඇතැන්ස් නගරය මුළු ග්‍රීසියේ ම ප්‍රධාන නගරය බවට පත් විය. එනිසා පෙරික්ලීස් පාලන සමය ග්‍රීක ශිෂ්ටාචාරයේ ස්වර්ණමය යුගයක් වශයෙන් සැලකේ.

එහෙත් ස්වෛරී පාලන ක්‍රමයකට හුරු පුරුදුව සිටි ග්‍රීක පෞර රාජ්‍යය ඇතැන්ස් රාජ්‍යයේ ආධිපත්‍යය යටතේ සිටීමට අකමැති විය. එනිසා පෞර රාජ්‍ය අතර සටන් ඇති විය. ක්‍රි. පූ. 431 පමණ වන විට ඇතැන්ස් හා ස්පාටා රාජ්‍යවල නායකත්වයෙන් පෙරමුණු දෙකක් ගොඩනැගුණි.

මුලින් ම ඇතැන්ස් නායකත්වයට විරුද්ධව ස්පාටාවරු යුද්ධ කොට තම ස්වාධීනත්වය දිනා ගත්හ. මෙහිදී පෞර රාජ්‍ය අතර ගැටුම් ඇති වීම සියලු රාජ්‍යයන්ගේ බලය දුර්වල වීමට හේතු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් සියලු ග්‍රීක පෞර රාජ්‍ය අසල්වැසි මැසිඩෝනියානු රාජ්‍යයට යටත් විය.

ක්‍රි. පූ. 360 දී මැසිඩෝනියාවේ බලයට පත් වූ **පිලිප් රජ** අධිරාජ්‍ය තත්ත්වයක් ගොඩනගා ගැනීමට උත්සාහ කළත්, ඔහු හදිසියේම මිය ගියේ ය. අනතුරුව ක්‍රි. පූ. 336 දී බලයට පත් **ඇලෙක්සැන්ඩර්** දක්ෂ අශ්වාරෝහකයෙකු මෙන් ම රණශූරයෙකු වේ. ග්‍රීක පෞර රාජ්‍ය එකිනෙක යටත් කර ගත් ඇලෙක්සැන්ඩර් ග්‍රීසිය මුළුමනින් ම අත්පත් කර ගත්තේ ය. එහෙත් ඔහු එහි පැවති ග්‍රීක සංස්කෘතිය විනාශ නොකොට අගය කළේ ය. එනිසා ඔහුට යටත් සෑම ප්‍රදේශයක ම පාහේ ග්‍රීක සභ්‍යත්වයේ අංග ලක්ෂණ ව්‍යාප්ත විය. විශේෂයෙන් ඊජිප්තුව හා නැගෙනහිරින් වූ වයඹ දිග ඉන්දියානු ප්‍රදේශ (ක්‍රි. පූ. 325 දී ආක්‍රමණය කර) යටත් කරගත් අතර එහි ග්‍රීක ජනපද පිහිටු විය. තවද ග්‍රීක සංස්කෘතික ලක්ෂණ මේ ප්‍රදේශවල ව්‍යාප්ත කළේ ය. ඒ අනුව ඇලෙක්සැන්ඩර් ග්‍රීසිය යටත් කර ගැනීම පැරණි ග්‍රීක සභ්‍යත්වය තවත් විශාල ප්‍රදේශයක ව්‍යාප්ත වීමට ප්‍රධාන හේතු විය.



රූපය 4.2 ඇලෙක්සැන්ඩර් රජු

ග්‍රීකයන්ගේ ආක්‍රමණයට කලින් එහි පැවති ග්‍රීක සංස්කෘතිය **'හෙලනික් සංස්කෘතිය'** වශයෙන් ද ඇලෙක්සැන්ඩර්ගේ ආක්‍රමණවලින් පසු ග්‍රීක සංස්කෘතිය **'හෙලනිස්ටික්'** සංස්කෘතිය වශයෙන් ද හඳුන්වනු ලැබේ. එයින් අදහස් වන්නේ ග්‍රීකයන්ට ආවේණික සංස්කෘතිය හා විදේශ ආභාස සහිතව ගොඩනැගුණු ග්‍රීක සංස්කෘතිය යන්න යි.

මැසිඩෝනියානු ආක්‍රමණවලට පසු ග්‍රීක රාජ්‍යය රෝම අධිරාජ්‍යයේ ග්‍රහණයට ලක් විය. ඔවුහු සුළු ආසියාවේ මෙන් ම දකුණු ඉතාලියේ ද තිබුණු ග්‍රීක ජනපද ඇතුළු මුළු මහත් ග්‍රීසිය ම යටත් කර ගත්හ. රෝමවරුන් ද ග්‍රීක සභ්‍යත්වය අගය කළ නිසා ග්‍රීක සංස්කෘතිය විනාශ නොවී රෝම අධිරාජ්‍යය පුරා ම ව්‍යාප්ත විය. එහෙත් ක්‍රි. ව. 5 වන සියවසෙන් පසු උදා වූ මධ්‍යතන යුගය නොදියුණු යුගයක් වූ බැවින් එකල මේ සංස්කෘතික ලක්ෂණ යටපත් විය.

ක්‍රි. ව. 5 වන සියවසේ බටහිර රෝම අධිරාජ්‍ය බිඳවැටුණත් නැගෙනහිර රෝම අධිරාජ්‍යය බිඳ නොවැටිණි. එනිසා 16 වන සියවසේ පුනරුදයත් සමග නැවත ග්‍රීක රෝම අංග ලක්ෂණ ඉස්මතු වීමත්, නිසා ග්‍රීක සභ්‍යත්වයේ අංග ලක්ෂණ නූතනයේ ද දක්නට ලැබේ.

## ක්‍රියාකාරකම

1. ග්‍රීක ශිෂ්ටාචාරය හැඩ ගැසීමට බලපාන ලද සාධක සොයා ලියන්න.



### 4.1.3 ග්‍රීක ශිෂ්ටාචාරයේ පැවති පාලන ක්‍රමය

ග්‍රීසියේ සෑම අංශයක ම ප්‍රධානතම ඒකකය පෞර රාජ්‍යය වේ. මේ රාජ්‍ය ක්‍රමය ආණ්ඩුක්‍රම වෙනස්වීම්වලට අනුබලයක් විය. එහි මුලින් ම '**රාජාණ්ඩු ක්‍රමයක්** ' වර්ධනය විය. පැරණි ග්‍රීසියේ නගර රාජ්‍යවල පාලනය පුරවැසියන් මෙහෙය වූ අතර ඒ සඳහා '**පුරවැසි සභාවක්**' තිබුණි. මේ රාජ්‍යවල ජීවත් වූ වහලුන්, විදේශිකයන්, කාන්තාවන් හා වයස අවුරුදු 18 ට අඩු පිරිමි ළමුන් ද පාලන කටයුතුවලට සම්බන්ධ කර ගත්තේ නැත. තීරණවලට එළඹුණේ වැඩි දෙනාගේ කැමැත්ත මතය. එම තීරණ ක්‍රියාත්මක කිරීම සියලු දෙනාගේ ම වගකීම විය. අවශ්‍ය නීති-රීති සකස් කරන ලද්දේ ද පුරවැසි බලය පැවරුණු පාලක සභාව මගිනි.

දේශපාලන බලය ලබා ගත් අය ආණ්ඩු කිරීම සඳහා පොදු ජනයා සම්බන්ධ කර ගත්හ. මේ සඳහා හොඳම නිදර්ශනය ඇතැන්ස් රාජ්‍යය වේ. එහෙත් ඇතැන්ස් රාජ්‍යයේ පැවැති ප්‍රජාතන්ත්‍රවාදය වර්තමාන ප්‍රජාතන්ත්‍රවාදයට වඩා වෙනස් වේ. එහි ප්‍රධාන ලක්ෂණය වූයේ පුරවැසියන් සියලු දෙනා ම ඍජුව ම ආණ්ඩු කිරීමේ කාර්යයට සම්බන්ධ වීම යි. මේ නිසා මෙය '**ඍජු ප්‍රජාතන්ත්‍රවාදය**' ලෙස හැඳින්වේ.

එසේ වුවත් පසුව එය නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයකට හැඩ ගැසුණි.

**මේ පෞර රාජ්‍යවල පැවති පාලන ක්‍රමය නූතන බටහිර ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ ආරම්භය ලෙස සැලකේ.**

සමහර පෞර රාජ්‍යවල රාජාණ්ඩු ක්‍රමයට සමාන ආණ්ඩු ක්‍රම පැවතුණි. එහෙත් තනි පුද්ගලයෙකුට පාලන බලය පැවරී නොතිබුණි. එයට හොඳම නිදර්ශනය ස්පාටා රාජ්‍යය යි. එහි බලතල පැවතුණේ ප්‍රභුවරුන් දෙදෙනෙකු අතෙහි ය. මේ පාලන ක්‍රමය යුදමය අවශ්‍යතා මත සංවිධානය වූ අතර පාලකයන් දෙදෙනාගෙන් එක් අයෙකු යුද හමුදා මෙහෙයවීමට බැහැර ගියවිට අනෙක් තැනැත්තාට රටේ පාලන කටයුතු පැවරීම සිරිත විය. පෞද්ගලිකව මුදල් රැස් කර ගැනීම තහනම් වූ අතර රටේ ආරක්ෂාව වෙනුවෙන් සේවය කිරීමට සියලු පුරවැසියෝ කැප වී සිටියහ.

එහෙත් කාලයක් ගත වන විට රාජාණ්ඩු ක්‍රමයේ පැවති යම් යම් දුර්වලතා නිසා සමහර පෞර රාජ්‍යවල සමූහාණ්ඩු පහළ විය. ඒ අනුව රජුගේ කටයුතු ප්‍රභූ ඡන්දයෙන් පත් කරන '**මහේස්ත්‍රාත්වරුන්**' වෙත පවරන ලදි. මේ රාජ්‍යවල මහජන මණ්ඩල කැඳවීමක් ද කලාතුරකින් සිදු විය. එහෙත් නියම දේශපාලන බලය හිමිවුණේ ප්‍රභූ පංතියට ය. එම රාජ්‍යවල ''ප්‍රභූතන්ත්‍ර ආණ්ඩුක්‍රම'' පහළ විය.

සමහර පෞර රාජ්‍යවල ආර්ථික ශක්තියක් තිබූ ජන සහයෝගයෙන් ඒකාධිපතියෝ බිහි වූහ. එම ආණ්ඩුක්‍රමය '**ටයිරන්ට්' හෙවත් ටියනිලි (ප්‍රජාපීඩක)** ලෙස හැඳින්වේ. ග්‍රීකයෝ මේ ක්‍රමයට එතරම් කැමැත්තක් නොදැක්වූහ.

සමහර පෞර රාජ්‍යවල ධනවත්, බලවත් සුළු පිරිසකගෙන් යුත් ආණ්ඩුක්‍රම ඇති විය. ඒවා '**ඔලිගාර්ලි**' ලෙස හැඳින්වේ. මේ ආණ්ඩුක්‍රමය පැවති රාජ්‍යවල ද පුරවැසියන් හැමදෙනා ම පාලන කටයුතුවලට සහභාගී නොවූහ.

මේ අනුව පැහැදිලි වන්නේ ග්‍රීක පෞර රාජ්‍ය ක්‍රමය තුළ කිසියම් ආණ්ඩුක්‍රම විකාශනයක් තිබූ බව යි.

### 4.1.4 ග්‍රීක යුගයේ සමාජය හා ජන ජීවිතය

ග්‍රීක සමාජය පුරවැසියන්, වහලුන් හා විදේශිකයන් වශයෙන් ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ. පුරවැසියන් අතර රදල හා ගොවි වශයෙන් සමාජ මට්ටම් පැවතිණි. රදලයින් සංඛ්‍යාත්මක වශයෙන් සුළු පිරිසක් වූ අතර ගොවීහු බහුතරය වූහ. ආර්ථික මෙන් ම ගේ දොර එදිනෙදා කටයුතු සඳහා වහලුන් යොදා ගැනීම එම සමාජයේ ප්‍රධාන ලක්ෂණය වේ. ගොවියන් තම පවුල්වල සහභාගිත්වයෙන් ගොවිතැන් කටයුතු කළ අතර තමන්ගේ ආර්ථික ශක්තිය අනුව ඒ සඳහා වහලුන් යොදාගෙන ඇත.

ග්‍රීක සමාජයේ කාන්තාවට හිමි වූයේ පුරුෂයාට වඩා පහත් තත්වයකි. පාලන කටයුතු හා වැදගත් සමාජ අවස්ථාවන්ට ඔවුන්ගේ සහභාගිත්වය අපේක්ෂා කෙරිණි. කාන්තාවගේ ප්‍රධාන කාර්යය වූයේ ගේ දොර කටයුතුවල නිරත වීම යි. කාලයක් යන විට ඒ සඳහා වහලුන් යොදා ගැනීම බහුල වීම නිසා වහලුන්ගේ සංඛ්‍යාව වැඩි විය. වහල්ලු තම හාම්පුතුන් සමග පවුලේ සාමාජිකයන් ලෙස ජීවත් වූහ. ඔවුන්ට අමානුෂික ලෙස සැලකීම සමාජය අනුමත නොකළ අතර ඔවුන්ගේ ජීවිත දුක්ඛදායක නොවීය. ඉතිහාසඥයින් පෙන්වා දෙන්නේ පෞර රාජ්‍යවල මෙලෙස වහල් ක්‍රමයක් පැවතීම, දියුණු සභ්‍යත්වයක් ඇති වීමට හේතු වූ බව යි. නිෂ්පාදන කටයුතු මුළුමනින් ම මොවුන් විසින් ඉටු කිරීම නිසා ග්‍රීක පුරවැසියන්ට සැලකිය යුතු විවේකයක් තිබුණි. එම නිදහස් කාලය අධ්‍යාපනය හා විවිධ නිර්මාණයන් කිරීමටත් ඒවා රසවිඳීමටත් අනුග්‍රහය දැක්වීමටත් ඔවුහු යොදා ගත්හ.

නාට්‍ය සංගීතය සහ ක්‍රීඩා උත්සව පැවැත්වීම ජනප්‍රිය විනෝදාංශ වේ. මොවුන්ගේ විවිධ ක්‍රීඩා හා ශාරීරික අභ්‍යාසවලට ග්‍රීක සමාජයේ වැදගත් තැනක් හිමි විය.

### 4.1.5 ග්‍රීකයන්ගේ ආගමික ඇදහිලි හා විශ්වාස

ග්‍රීකයෝ ද ස්වාභාවික වස්තූන්වලට දේවත්වය ආරෝපණය කර වැඳුම් පිදුම් කළහ. මෙම ඇදහිලිවල දැහැමි ලක්ෂණ දක්නට ලැබේ. '**හෝමර්**' නමැති කවියාගේ විස්තරයෙන් පෙනී යන්නේ ග්‍රීකයන් තුළ දෙවියන් කෙරෙහි වූ බිය අඩු වූ බව යි. ඔවුහු දෙවිවරුන් සාමාන්‍යයෙන් මිනිසුන් මෙන් ක්‍රියා කරන බව විශ්වාස කළහ. ග්‍රීක යුගයේ දේව පරපුරක් **ඔලිම්පස්** කන්දේ වාසය කළහ. මෙකල ප්‍රධාන දෙවියා ආකාශයට අධිපති **සීයුස්** ය. ඒ අතර **ඇපලෝ** දෙවියා බුද්ධියට හා ආලෝකයට අධිපති මෙන් ම සංගීතය, කාව්‍ය ආදී හැම අංශයකම සංගතභාවයන් පිළිබිඹු කරන දෙවියා විය. තව ද ඇපලෝ දෙවියා නීතිය හා සාමය පිළිබඳවත්, සෞභාග්‍යයේත් අධිපති දෙවියා වේ. **ආර්ටිමිස්** යනු සඳු දෙවියා ය. යුද්ධයකට අධිපති දෙවියා වූයේ **එරෝස්ය. පොසිඩන්** සමුද්‍රයට අධිපති දෙවියා වේ. ආලයට අධිපතිනි **ඇෆ්‍රොඩයිට්** ප්‍රේමයට හා සෞභාග්‍යයට ද අධිපතිනියයි. හෙරානා ඇතැන්ස් පෞර රාජ්‍ය ආරක්ෂා කරන දේවතාවිය වේ. ඇය ස්ත්‍රී පක්ෂයේ නායිකාව යි.



රූපය 4.3 සීයුස් දෙවියා

ග්‍රීකයෝ හිරු, සඳු, සුළඟ, වැස්ස, මුහුද වැනි ස්වාභාවික වස්තු හා ක්‍රියාවන් දෙවියන් හා දේවානුභාවයන් ලෙස සලකා පුද පූජා කළහ. මේ අනුව ග්‍රීක යුගයේ පැවතුණේ බහු දේවවාදය යි.

මේ දෙවියන් වෙනුවෙන් අලංකාර දේවස්ථාන ඉදි කළහ. එහෙත් ඒවායේ කටයුතු කළ ශක්තිමත් පූජක පක්ෂයක් හෝ සංවිධානයක් දක්නට නොලැබේ. සමහර පෞර රාජ්‍යවල ඇතැම් දෙවියන් ප්‍රමුඛත්වයෙන් සැලකූ නමුත් මුළු දේව පරපුරම ග්‍රීක ලෝකයට පොදු වූ බවක්

දක්නට ලැබේ. ඒ අනුව ග්‍රීක යුගයේ කිසියම් ආගමික එක්සත් භාවයක් පැවති බව පෙනේ. එනිසා ඇතැම් දේවස්ථාන නඩත්තු කිරීම සඳහා පෞර රාජ්‍ය පොදුවේ කටයුතු කළේ ය. විශේෂ දේවස්ථාන පැවති රාජ්‍ය වෙත වෙනත් රාජ්‍යවලින් මිනිසුන් පැමිණ ඇත.

ග්‍රීකයෝ සිත, කය දියුණු කිරීම ආගමික කටයුත්තක් ලෙස සැලකූහ. අනාගත වාක්‍ය ප්‍රකාශ කරන ස්ථාන ග්‍රීසියේ තිබුණි. ඒ අනුව **පේන බැලීම** ආගමික විශ්වාසයකින් සිදු විය. **ඩෙල්ෆි හා ඇපලෝ** එවැනි ප්‍රසිද්ධ ස්ථානවේ. මේවා අනාවැකි කියන දේවස්ථාන ලෙස ප්‍රසිද්ධ විය. තවද ග්‍රීසියේ දේව ඇදහිලිවලට විරුද්ධ අදහස් දක්වන දාර්ශනික කොට්ඨාසයක් ද විය. ඔවුන්ට දේව ඇදහිලි ගරු කරන අයගෙන් හිරිහැර පවා සිදු විය. මෙවැනි දාර්ශනිකයන් සිටීමෙන් පෙනී යන්නේ ග්‍රීක ආගම නිදහස් චින්තනයට බාධාවක් නොවූ බව යි.

## ක්‍රියාකාරකම

1. ග්‍රීක ශිෂ්ටාචාරයේ ඔබ දකින විශේෂ සමාජ හා දේශපාලන ලක්ෂණ වෙන වෙනම ගොනු කරන්න.



### 4.1.5.1 ග්‍රීක යුගයේ ආර්ථිකය

ග්‍රීසියේ භූගෝලීය පිහිටීම හා දේශගුණය කෘෂි කර්මාන්තයට, සත්ව පාලනයට මෙන් ම වෙළෙඳාමට ද ඉතාම යෝග්‍ය විය. සෞම්‍ය දේශගුණය තිරිඟු, බාර්ලි වැනි ධාන්‍ය හා මිදි, ඇපල්, ඔලිව්, දොඩම් වැනි පළතුරු වගාවන්ට ඉතාම හිතකර විය. කඳු බෑවුම් සහිත තැනිතලා ප්‍රදේශවල තිබුණු තණබිම් එළු, බැටලු වැනි සත්ව පාලනය සාර්ථකව සිදු කිරීමට යෝග්‍ය විය.

මුහුදු වෙළෙඳාම සඳහා වැඩි වශයෙන් යොමු වූ ඇතැන්ස් රාජ්‍යය සමීප රාජ්‍ය සමග මෙන් ම දුර බැහැර රටවල් සමග ද දියුණු වෙළෙඳාමක් පවත්වාගෙන ගියේ ය. අවශ්‍ය විදේශ භාණ්ඩ ගෙන ආවේ ඇතැන්ස් වෙළෙඳුන් ය. ග්‍රීකයන් ඉන්දියාව, ලංකාව, ඊජිප්තුව වැනි රටවල පවා වෙළෙඳාමේ ගිය බව ග්‍රීක වාර්තාවල සඳහන් වේ. එකල ග්‍රීකයන් ලංකාව හඳුන්වා ඇත්තේ තැප්‍රොබේන් යනුවෙනි.

වෙළඳුන්ගෙන් තොරතුරු දැනගත් **ටොලමි** නම් ග්‍රීක භූගෝල විද්‍යාඥයා ලංකාව ඉන්දියාව වැනි රටවල් ද ඇතුළත් කොට පළමුවරට ලෝක සිතියමක් නිර්මාණය කළේ ය. **ප්ලිනි, මෙගස්තිනිස්** වැනි අයගේ වාර්තාවල මෙකළ දියුණු වෙළෙඳාමක් පැවති බව සඳහන් වේ.

**ක්‍රියාකාරකම**

1. ග්‍රීක වාර්තාවලින් හෙළිවන ඓතිහාසික තොරතුරු මොනවාද?



**4.1.6 ග්‍රීක යුගයේ සංස්කෘතිකාංග**

❖ **ග්‍රීක වාස්තුවිද්‍යාව**

ලෝකයේ පැරණි යුගයේ වාස්තුවිද්‍යාව සම්බන්ධයෙන් ග්‍රීකයන්ට විශේෂ තැනක් හිමි වේ. මේ සඳහා ඔවුන් මිනෝවාන් ශිෂ්ටාචාරයේ ද අභාසය ලබන්නට ඇත. ග්‍රීකයෝ දෙවියන් සඳහා වෙන් වූ ගොඩනැගිලි ඉතා අලංකාර ලෙස නිර්මාණය කළහ. පර්සියානු යුද්ධවලින් පසු **'පෙරික්ලිස් රජුගේ'** පාලන සමයේ ඇතැන්ස් පෞර රාජ්‍යයේ ඉතා විශිෂ්ට වූත්, අද්විතීය වූත් දේවස්ථාන බිහි විය.

ඇතැන්ස්වල පිහිටි **ඇක්රෝපොලිස්** කන්දේ **ඇක්රෝපොලිස්** බලකොටුව මත කිරිගරුඬින් තනා ඇති **පාතිනන් දේවස්ථානය** හා අනෙකුත් ගොඩනැගිලි ග්‍රීක වාස්තු විද්‍යාව පිළිබඳ ඔවුන්ගේ දැනුම හා කුශලතාව මනාව පෙන්නුම් කරයි.

පාතිනන් දේවස්ථානය ඇතැන්ස්වල ආරක්ෂක දෙවිඳුව මෙන් ම කලාවට අධිපති දෙවිඳුව වන ඇතීනා දෙවඟනගේ දේව මන්දිරය වේ.

**ඩයොනීසියස්ගේ** විශාල රඟමඩල ද ග්‍රීක වාස්තු විද්‍යාවේ ශිල්පය පිළිබඳ මාහැඟි උදාහරණයකි.



රූපය 4.4 පාතිනන් දේවස්ථානය

ග්‍රීක නගරවල බොහෝ ගොඩනැගිලි මහල් දෙකකින් සමන්විත වූ සියලු පහසුකම්වලින් යුක්ත ය. මැද මිදුල වටා කාමර ද, ගබඩාව, කුස්සිය හා ආලින්දය අංගයන්ගෙන් එම නිවෙස් සමන්විත වේ. ගොඩනැගිලි ඉදිකිරීම සඳහා හුණුගල් හා ඔප දැමූ කිරිගරුඬ ගල් භාවිත කර ඇත. **ඩොරික්, ජියෝනියන්, කොරින්තියන්** යන ගෘහ නිර්මාණ ශෛලීන් අනුව ගොඩනැගිලි ඉදි කොට ඇත. ඒ අතරින් **'ඩොරික් ශෛලිය'** ඉතාම සරල හා සියුම් එකකි. එය ග්‍රීක වාස්තු විද්‍යාවේ ශිල්පයට විශිෂ්ටත්වයක් ලබා දී ඇත.

## ❖ මූර්ති කලාව

ප්‍රතිමා නෙළීම සම්බන්ධව ග්‍රීකයෝ විශිෂ්ට දක්ෂතා දැක්වූහ. ඒ අතර විශිෂ්ටතම නිර්මාණයකි පාතිනන් දේවස්ථානයේ ඇතීනා දෙවිඳුවගේ ප්‍රතිමාව. මෙය තඹවලින් නිර්මිත ය. තව ද ඇත්දළවලින් හා රනින් නෙළන ලද **ඇතීනා**ගේ ප්‍රතිමාවක් ද සියුස් දෙවියන්ගේ ප්‍රතිමාව හා ගදායුධය විසිකරන්නාගේ ප්‍රතිමාව ද විශිෂ්ට නිර්මාණ වේ. මෙවැනි ප්‍රතිමා ඇතැන්ස් පෞර රාජ්‍ය පුරා ම දක්නට ලැබේ.

ග්‍රීක යුගයේ ප්‍රතිමා ශිල්පීන් මිනිස් ශරීරය ඉතා ම තාත්විකව නිරූපණය කර ඇත. මිනිස් සිරුර නිර්මාණය කිරීමේ දී ඇටසැකිලි, මාංශපේශී ආදී ශරීරයේ සෑම අවයවයක් කෙරෙහි ම අවධානය යොමු කොට ඇත. නිදර්ශනයක් ලෙස කවපෙත්ත විසිකරන්නාගේ ප්‍රතිමාව දැක්විය හැකිය.

ග්‍රීක යුගයේ සිටි ප්‍රතිමා ශිල්පීන් අතර **ෆීඩියස්** (සියුස් හා ඇතීනා දෙවගන) **මයිරෝ** (කවපෙත්ත විසිකරන්නා) **ප්‍රැක්සිටිලීස්** (ළදරු ඩයනීසස් අතැතිව සිටින හර්මීස්ගේ ප්‍රතිමාව) වැනි අය විශිෂ්ට නිර්මාණ ශිල්පීහු වෙති.





රූපය 4.5 කවපෙත්ත විසිකරන්නාගේ ප්‍රතිමාව හා ඇතීනා දෙවඟන

## ❖ චිත්‍ර කලාව

ග්‍රීක යුගයේ ප්‍රතිමා කලාවට තරම් චිත්‍ර කලාවට සැලකිල්ලක් දක්වා නොමැත. එහෙත් චිත්‍ර කලාව අමතක කර නැත. ග්‍රීකයන් අතර සිටි විශිෂ්ටතම චිත්‍ර ශිල්පියා වූයේ පීඩියාස් ය. ඔහු ඊට සමකාලීනව වූ **පොලික්ගන්ටස්** ගේ චිත්‍රවලින් ආභාසය ලබා ඇත. පොලික්ගන්ටස් ඉතා විශාල චිත්‍ර නිර්මාණය කළේ ය. මල් පෝච්චි, පුන්කලස් හා ඒ හා සමාන භාණ්ඩ, චිත්‍රවලින් අලංකාර කළහ.



රූපය 4.6 මැටි බඳුන්

## ❖ සාහිත්‍යය

ග්‍රීක යුගයේ ඉතා උසස් සාහිත්‍යයක් පැවතුණි. හෝමර් නම් මහා කවියාගේ **ඉලියඩ් හා ඔඩිසි** නම් මහාකාව්‍ය ග්‍රන්ථ ඒ අතර කැපී පෙනේ. මේ ග්‍රන්ථවලට පසුබිම් වී ඇත්තේ ග්‍රීකයන් හා ඔවුන්ට කලින් සිටි වැසියන් අතර පැවති ගැටුම් ය. එම ගැටුම් පිළිබඳ නොයෙක් ජනකථා ආශ්‍රය කර ගෙන හොමර් මහාකාව්‍ය රචනා කර ඇත. මෙහි විශේෂත්වය භාෂාව හසුරුවා ඇති ආකාරය යි. ඒ නිසා ග්‍රීකයන් මේ කෘති ඉතාමත් ඉහළින් අගය කරනු ඇත. ඒවා ඔවුන්ගේ ඉගැන්වීම්වලටට ද උපයෝගී කර ගත්හ. හෝමර්ගේ කෘතිවල එන කතා පුවත් හා පුද්ගලයන් නොයෙක් කලා මාධ්‍යයවල නිරූපණය කිරීමට ග්‍රීක කලාකරුවෝ ඉදිරිපත් වූහ. තව ද හෝමර්ගේ කෘති ග්‍රීක ආගමික විශ්වාස හැඩගැසීමට ද බලපා තිබේ. සාමාන්‍ය මිනිස් ගතිගුණ දෙවියන්ට ආරූඪ කර තිබෙන නිසා දේව ඇදහිලිවලට අලුත් මුහුණුවරක් ලැබුණි.

මේ නිසා බටහිර ලෝකයේ සාහිත්‍ය පෝෂණය කිරීමෙහි ලා මේ ග්‍රන්ථවලින් ඉමහත් සේවයක් සැලසී ඇත. හෝමර්ගේ මහාකාව්‍ය සම්ප්‍රදාය පෙරික්ලිස් යුගය දක්වා පැවති අතර එය අනුගමනය කරමින් පසු කාලයේ ග්‍රන්ථ රචනා විය. රෝම යුගයේ **වර්ජිල්** විසින් රචිත **ඊනිඩ්** කෘතියත් ඉංග්‍රීසි ජාතික **මිල්ටන්** රචනා කළ **පැරඩයිස්ලෝට්ස්** කෘතියත් එයට නිදසුන් ය.

පෙරික්ලීස් පාලන සමයේ ගී කාව්‍ය රචනා කිරීමේ සම්ප්‍රදායක් ද පැවතුණි. ගී කාව්‍ය රචනා කළ අය අතර **පිණ්ඩාර්** හා **සැෆෝ** වැදගත් වේ.

## ❖ ග්‍රීක නාට්‍ය කලාව

යුරෝපීය නාට්‍ය කලාව ආරම්භ වන්නේ ග්‍රීක නාට්‍ය කලාවෙනි. ඒ සඳහා පසුබිම වන්නේ ග්‍රීකයන් අතර පැවති ආගමික විශ්වාසය. සුරාවට අධිපති ඩයනීස් වැනි දෙවියන් අභියස දී මත්පැන් පානය කර නටමින් පුද පූජා පැවැත් වීම සිරිතක් විය. එය දියුණු වීම හේතු කොට ගෙන ග්‍රීකයන් අතර නාට්‍ය කලාව පහළ විය. නාට්‍ය රඟ දැක්වූයේ විවෘත වේදිකාවල හා රංග ශාලාවල ය. ඒ සඳහා නිර්මාණය වූ රංග ශාලා ගෘහ නිර්මාණ ක්ෂේත්‍රයේ වැදගත් අංශයක් වේ.

නාට්‍ය කලාවට මුල් වූ තේමා අතර ජනකථා, මහාකාව්‍ය ආශ්‍රිතව පැවති කථා පුවත් ද නාට්‍ය පහළ වීමට බලපා ඇත. **පෙරික්ලීස්** රාජ්‍ය සමයේ දියුණුව පැවැති නාට්‍ය කලාව පසු කාලයේ දී දියුණු නාට්‍ය සම්ප්‍රදායක් බවට පත්විය. ඒ අනුව ග්‍රීක නාට්‍ය කලාවේ ප්‍රධාන කොටස් දෙකකි.

1. සුඛාන්ත නාට්‍ය කලාව
2. ශෝකාන්ත නාට්‍ය කලාව

**ඇරිස්ටොෆනීස්** සුඛාන්ත නාට්‍ය ද **ඊස්කිලස් ,සොපොක්ලීස්** හා **යුරිපීඩිස්** යන අය ශෝකාන්ත නාට්‍ය කෘති ද නිර්මාණය කළහ.

**ඇරිස්ටොෆනීස්ගේ** සුඛාන්ත නාට්‍ය කෘති මගින් සමකාලීන දේශපාලඥයින් හා කලාකරුවන් උපහාසයට ලක් කර ඇත. ඔහුගේ **'වලාකුළු'** නම් නාට්‍ය කෘතිය මගින් **සොක්‍රටීස්** වැනි දාර්ශනිකයින් උපහාසයට ලක් කරයි.

ශෝකාන්ත නාට්‍ය කෘති මගින් බොහෝ විට මිනිසුන්ගේ සදාතනික ප්‍රශ්න ගවේෂණය කිරීමට උත්සාහ ගෙන ඇත. ඒ අතර **සොපොක්ලීස්** තම කෘති මගින් **ජීවිතය, මරණය, දෛවය** වැනි දේවල් ගැඹුරින් සාකච්ඡා කර තිබේ. ඇරිස්ටෝටල් තම විචාරක ග්‍රන්ථ මගින් ශෝකාන්ත නාට්‍ය පිළිබඳ න්‍යාය ධර්මයන් දක්වා ඇත. මේ නාට්‍යකරුවන්ගේ කෘතිවල ඇති කලාත්මක වටිනාකම හා එහි පෞරාණිකත්වය මත **සම්භාව්‍ය නිර්මාණ** වශයෙන් හඳුන්වයි.

ග්‍රීක කෘති අතර වටිනා ඉතිහාස ග්‍රන්ථ රැසක් ද වේ. එම ග්‍රන්ථ රචනා කළ අය අතර පුරෝගාමියා **හෙරඩෝටස්** ය. **ඉතිහාසයේ පියා** වන ඔහු ඓතිහාසික කරුණු එක් රැස් කොට ග්‍රීසියට එල්ල වූ පර්සියානු ආක්‍රමණ පිළිබඳ හා ඇතැන්ස්වරුන්ගේ කාර්යභාරය පිළිබඳ වටිනා කෘතියක් සම්පාදනය කළේ ය. තවද ඉතිහාසඥයකු වන තුසිඩියස් ද ඇතිනියානු බලය පිරිහීම පිළිබඳ ග්‍රන්ථයක් රචනා කොට ඇත.

### 4.1.7 ග්‍රීක යුගයේ ක්‍රීඩා හා විනෝදාංශ



රූපය 4.7 පැරණි ග්‍රීක් මැටි බඳුනක සිතුවම් කර තිබෙන මැරතන් ධාවකයින් පිළිබිඹු කරන දර්ශනයක්.

ග්‍රීකයන් කාය ශක්තිය වර්ධනය කෙරෙහි දැක් වූ උනන්දුව ආගමික විශ්වාසයක් ලෙස ද සැලකිණි. ග්‍රීසියේ **ඔලිම්පියාහි** සියුස් දෙවියා වෙනුවෙන් ක්‍රි. පූ. 776 සිට සිව් වසරකට වරක් පැවැත්වෙන ජාතික ක්‍රීඩා උත්සවවලින් එය පැහැදිලි වේ. එහි දී දුර දිවීම, පැනීම, මල්ලවපොර, බර ඉසිලීම, පිහිනීම, කවපෙත්ත විසි කිරීම, වළලු පැනීම, හෙල්ල විසිකිරීම, යගදාව විසි කිරීම, අශ්වරථ පැදවීම වැනි ක්‍රීඩා තරග රාශියක් පැවැත්විය. සෑම ග්‍රීක රාජ්‍යයකින් ම තරගකරුවෝ හා නරඹන්නෝ එයට සහභාගී වූහ. එම තරගවලින් ජයග්‍රහණය කළ තරගකරුවන්ට මහත් කීර්තියක් ලැබුණි. එය අදවන විට ජාත්‍යන්තර ඔලිම්පික් ක්‍රීඩා උළෙලක් බවට විකාශනය වී ඇත.

### 4.1.8 ග්‍රීක යුගයේ අධ්‍යාපනය හා දර්ශනවාද

ග්‍රීක අධ්‍යාපන ක්‍රමයේ ප්‍රධාන අරමුණ වූයේ ශාරීරික හා මානසික වශයෙන් පරිපූර්ණ අධ්‍යාපනයක් ලබා දීම යි. ඒ නිසා ග්‍රීකයෝ නොයෙක් විෂයන් හැදෑරීමට විශේෂ උනන්දුවක් දැක්වූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ග්‍රීකයන් අතර මහා දාර්ශනිකයෝ ද පහළ වීම සුවිශේෂ කරුණකි.


ග්‍රීකයන් දර්ශනය යන්නෙන් අදහස් කළේ **ප්‍රඥාව** කෙරෙහි ඇති ඇල්ම යි. එනිසා ග්‍රීක දාර්ශනිකයන්ට සියලු ක්ෂේත්‍ර පිළිබඳ දැනුමට අදාළ වූ අවබෝධයක් තිබුණි. ඔවුහු සියලු ම අංශවල දැනුම ගවේෂණය කළහ. ඒ අනුව ග්‍රීක අවධියේ දර්ශනය යන විෂය

ක්ෂේත්‍රයට වර්තමානයේ වෙන් වෙන් වශයෙන් හදාරන විෂයන් ගණනාවක් අයත් වේ. ස්වාභාවික විද්‍යාව (භෞතික හා තාරකා විද්‍යාව) පාර භෞතික විද්‍යාව, ආචාර විද්‍යාව, තර්ක ශාස්ත්‍රය, ගණිතය ඒ අතර වැදගත් වේ.

ක්‍රි. පූ. තුන්වන සියවසේ ග්‍රීසියේ ඇතැන්ස් රාජ්‍යයේ **සොපික්ස් හෙවත් විතණ්ඩවාදීන්** නමින් උගත් දාර්ශනිකයන් පිරිසක් පහළ වූ අතර ඔවුහු භෞතිකවාදයට විරුද්ධ වූ දර්ශනයක් ඉදිරිපත් කළහ. ඔවුහු තැනින් තැනට ඇවිදිමින් නොයෙක් ප්‍රායෝගික විෂයන් පිළිබඳ දේශන පැවැත්වූහ. එහි පදනම වූයේ ව්‍යක්ත ලෙස කථා පැවැත්වීමේ කලාව, නගර සැලසුම්, ආහාර පිසීම, රාජ්‍ය ශිල්පය, දේශපාලන විද්‍යාව, ආදිය පිළිබඳ දැනුමක් ලබා දීම ය. මුදලට පවා දැනුම ලබා දුන් මේ විතණ්ඩවාදීන් ග්‍රීක බුද්ධිමය ජීවිතයේ ප්‍රගතියට සැලකිය යුතු සේවාවක් සිදු කරන ලදි. කථා පැවැත්වීමේ කලාව හා තර්ක ශාස්ත්‍රයට අවධානය යොමු කළ නිසා ග්‍රීක බුද්ධිවාදී ජීවිතයේ පදනම සකස් විය. පසු කාලය වන විට මොවුහු වචන හරඹ පැවැත්වීමටත්, ව්‍යාජ අදහස් ඉදිරිපත් කිරීමටත් පටන් ගත්හ. ඒ නිසා මේ විතණ්ඩවාදීන්ට නොයෙක් විවේචන එල්ල විය. ඒ සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල් වැනි දාර්ශනිකයන් ගෙනි.

**සොක්‍රටීස් (ක්‍රි. පූ. 489 - 399)**


විතණ්ඩවාදීන් විවේචනය කළ **සොක්‍රටීස්** සත්‍ය ගවේෂණය කරන්නෙකු, යුක්තිය, සාධාරණත්වය හා යහපත් බව සොයන්නකු ලෙස ප්‍රකට විය. ඔහු තම අදහස් ඉදිරිපත් කිරීමේ දී දේශන පැවැත්වීමට වඩා කරන ලද්දේ ප්‍රශ්න කිරීම යි. එය ඔහුගේ අධ්‍යාපන ක්‍රමයේ විශේෂ ලක්ෂණයකි.



රූපය 4.8 සොක්‍රටීස්

එසේ ප්‍රශ්න කිරීමෙන් එකල ප්‍රචලිත ව පැවති නොයෙක් විශ්වාස පිළිබඳ ග්‍රීකයන් තුළ සැක සංකා ඇති කළේ ය. ලැබෙන පිළිතුරු නැවත නැවත ප්‍රශ්න කිරීමෙන් ඔහු පැවති මතවල පරස්පර විරෝධතාව හිස් බවත් පෙන්නුම් කරමින් වැරදි මත බිඳ හෙළීය. සොක්‍රටීස් ඉදිරිපත් කළ ප්‍රධාන දර්ශනය වූයේ ''සතුටින් ජීවත්වීම සඳහා **ඥානය වර්ධනය කිරීම** හොඳම මාර්ගය බව ය''. එම අදහස්, පිළිගත් ඔහුගේ ගෝලයන් අතර දක්ෂතම පුද්ගලයා වූයේ **ප්ලේටෝ** ය.

**ප්ලේටෝ - (ක්‍රි. පූ. 429 - 347)**



රූපය 4.9 ප්ලේටෝ

ප්ලේටෝ තම ගුරුවරයාගේ ඉගැන්වීම් මුල් කරගෙන ඉතා වටිනා ග්‍රන්ථ කීපයක් ම රචනා කළේ ය. සියලු විද්‍යාවන් පිළිබඳ දැනුම ලබා ගැනීමෙන් පමණක් ජීවිතය සාර්ථක නොවන බවත් ජීවිතයේ සාර්ථකත්වය රඳා පවතින්නේ හොඳ නරක නිසි ලෙස හඳුනාගැනීම මත පමණක් බවත් එමගින් පෙන්වා දුන්නේ ය.

ප්ලේටෝ ශාස්ත්‍ර හැදෑරීමට **ඇකඩමිය** නමින් උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවී ය. ප්ලේටෝගේ කෘතිවලින් නොයෙක් දේ ප්‍රශ්න කරමින් ඒ සඳහා පිළිතුරු ඉදිරිපත් කෙරිණි. **උසස් අධ්‍යාපන ක්‍රමය මෙන් ම උසස් පාලනය** යනු කුමක් දැයි ඔහු ප්‍රශ්න කළේ ය. ප්ලේටෝ රචනා කළ කෘති අතර වැදගත්ම කෘතියකි **'ජනරජය' (රිපබ්ලික්).** ඔහු මේ ග්‍රන්ථයෙන් දාර්ශනික රජ කෙනෙකු පාලනය කරන පරමාදර්ශී රාජ්‍ය පිළිබඳ සංකල්පයක් ඉදිරිපත් කළේ ය. ප්ලේටෝ ලියූ ග්‍රන්ථවලින් සමස්තයක් ලෙස විඥානවාදී දර්ශනයක් ඉදිරිපත් කෙරිණි. ඒ තුළින් ඔහු උත්සාහ ගත්තේ එදා ග්‍රීසියේ පැවති ක්‍රමය විස්තර කිරීමට නොව ග්‍රීසියේ පැවතිය යුතු ක්‍රමය විස්තර කිරීමට ය. ප්ලේටෝගේ දර්ශනය නොයෙකුත් චින්තකයන් කෙරෙහි වර්තමානය දක්වා ම විශාල බලපෑමක් සිදු කොට ඇත.

**ඇරිස්ටෝටල් (ක්‍රි. පූ. 384 - 322)**

ප්ලේටෝගේ ප්‍රධාන ශිෂ්‍යයා වූයේ ඇරිස්ටෝටල් ය. ඇරිස්ටෝටල් දාර්ශනිකයකු, විද්‍යාඥයකු හා අධ්‍යාපනඥයකු පමණක් නොව දක්ෂ සංගීතඥයකු වශයෙන් ද හැඳින්විය හැකිය. ඔහුට අලංකාර ශාස්ත්‍රය වැනි විෂයන් පිළිබඳව ද හසල දැනුමක් තිබුණි. එනිසා ඔහු ග්‍රීක ලෝකයේ සිටි **මහා ප්‍රාඥයකු** වශයෙන් හැඳින්වේ.

ඇරිස්ටෝටල් **'ලයිසියම්'** නමින් අධ්‍යාපන ආයතනයක් ආරම්භ කළේ ය. ඉතා පුළුල් දැනුමක් තිබූ දාර්ශනිකයකු වන මොහු එදා ග්‍රීසියේ තිබුණු ගණිතය හැර අන් සියලු විෂයන් ගැන ගවේෂණය කළේ ය. ඔහු දේශපාලන විද්‍යාව ගැන **පොලිටික්ස්** නමින් ග්‍රන්ථයක් ද රචනා කළේය. එය තම අධ්‍යාපන ආයතනවල අත්පොත විය. මෙය යුරෝපයේ දේශපාලන විද්‍යාව ගැන පළමුවරට ලියවුණු ග්‍රන්ථය වේ. මීට අමතර ව **ආචාර විද්‍යාව** නමින් ඇරිස්ටෝටල් ලියූ ග්‍රන්ථය දේශපාලන විද්‍යාව හා ආචාර විද්‍යාව අතර ඇති සම්බන්ධතාව විග්‍රහ කරයි. ඇරිස්ටෝටල් **තර්ක ශාස්ත්‍රයේ පියා** ලෙස ද සලකනු ලැබේ. එතෙම ජීව විද්‍යාව සම්බන්ධයෙන් ලියන ලද කෘතිය ජීව විද්‍යාවේ ආදිතම යුරෝපීය

කෘතිය යි. මේ හැර ඔහු කාය ව්‍යවච්ඡේද විද්‍යාව, සත්ව විද්‍යාව හා අනෙකුත් විද්‍යාවන් පිළිබඳවත් ක්‍රමානුකූලව තොරතුරු රැස් කළේ ය. **ඇරිස්ටෝටල්** විවිධ ශාක හා සත්වයන් පිළිබඳ පර්යේෂණ පවත්වා බොහෝ නිගමන ඉදිරිපත් කළ ග්‍රීක පඬිවරයෙකි ඔහු නවීන විද්‍යාවේ පියා වශයෙන් හඳුන්වනු ලැබේ.



රූපය 4.10 ඇරිස්ටෝටල්

ග්‍රීක යුගයේ දාර්ශනික පදනමකින් කල්පනා කිරීමට පුරුදු වීම නිසා විද්‍යාව ද දියුණු විය. ඒ සඳහා පුරෝගාමී වූ කිහිපදෙනෙක් වූහ. **එරටොස්තිනිස්** නමැති ගණිතඥයා ජ්‍යාමිතිය උපයෝගී කරගෙන පෘථිවියේ විශාලත්වය මැනීමට සමත් විය. පෘථිවිය පැය 24කට වරක් සිය අක්ෂය වටා භ්‍රමණය වන බව **හෙරක්ලීටස්** ප්‍රකාශ කළේ ය. වර්ෂය දින 1 $\frac{1}{4}$ කට බෙදා දින දර්ශනයක් සකස් කරන ලද්දේ ග්‍රීකයන් විසිනි. ජ්‍යාමිතික ප්‍රමේයන් සොයාගත් **පයිතගරස් ගණිත විද්‍යාවේ පියා වේ. යුක්ලීඩ්, ආකිමිඩීස්** ද ගණිතය විෂය පිළිබඳ නව සොයා ගැනීම් කළහ. යම් වස්තුවක් ජලයේ ගිලීමේ දී ඉවත්වන ජල ප්‍රමාණයේ බර හෙවත් **ජලෝත් පීඩනය** පිළිබඳ න්‍යාය **ආකිමිඩීස්** සොයා ගත් විද්‍යාත්මක මූල ධර්මයකි.

බටහිර වෛද්‍ය විද්‍යාවේ ආදි කතෘවරයා ලෙස සැලකෙන්නේ ග්‍රීක ජාතික **හිප්‍රොකටීස්** ය. ඔහු සකස් කරන ලද දිවුරුම් ප්‍රකාශය අද පවා බටහිර වෛද්‍ය වෘත්තියට ඇතුළත් වන්නන් විසින් **ප්‍රතිඥාව** වශයෙන් භාවිත කරනු ලැබේ.

ග්‍රීක යුගයේ න්‍යායාත්මක පදනමක පිහිටා කටයුතු කළ නිසා තාරකා විද්‍යාව ද දියුණු විය. මේ සඳහා බලපෑවේ ග්‍රීකයන් නාවික ගමනාගමනයට තාරකා ආධාර කර ගැනීමයි. ග්‍රීක තාරකා විද්‍යාඥයින් අතර **ඇරිස්ටාකන්ස්ට** ප්‍රධාන තැනක් හිමි වේ. පෘථිවිය ගෝලාකාර බවත්, පෘථිවිය හා අනෙකුත් ග්‍රහ වස්තූන් සූර්යයා වටා ගමන් කරන බවත් ඔහු පෙන්වා දුන්නේ ය. සූර්යග්‍රහණ හා චන්ද්‍රග්‍රහණ පිළිබඳ අනාවැකි පළ කිරීමට ග්‍රීක තාරකා විද්‍යාඥයෝ සමත් වූහ. මේ අනුව ග්‍රීක යුගය තුළ බටහිර විද්‍යාවේ දියුණුවක් පැවති බව හඳුනාගත හැකි ය.

### 4.1.9 ග්‍රීක ශිෂ්ටාචාරයේ පරිහාණිය

ක්‍රි. පූ. දෙවන සියවස වන විට ග්‍රීක පෞර රාජ්‍ය දේශපාලන වශයෙන් පිරිහී ගොස් විදේශීය ආක්‍රමණවලට ගොදුරු වුවත්, ග්‍රීක සභ්‍යත්වය තවත් කාලයක් නොනැසී පැවතුණි. එයට හේතුව ග්‍රීකය යටත් කර ගත් **මැසිඩෝනියානුවන්** ග්‍රීක සභ්‍යත්වය අගය කොට සැලකීම යි.

මැසිඩෝනියාවේ මහා **ඇලෙක්සැන්ඩර්**, ග්‍රීක සභ්‍යත්වය ඉහළින් අගය කළේ ය. ව්‍යාප්ත කළේ ය. මැසිඩෝනියාවේ තැනින් තැන ග්‍රීක ගෘහ නිර්මාණ පදනම් කරගෙන නගර ඉදිකිරීමටත් අලංකාර කිරීමටත් ප්‍රතිමා නිර්මාණය කිරීමටත් ග්‍රීක කලාකරුවන් හා නිර්මාණ ශිල්පීහු උත්සාහ ගත්හ. ග්‍රීක පොතපත ආරක්ෂා කිරීමට **ඇලෙක්සැන්ඩ්‍රියාවේ** පුස්තකාලයක් පවා ඉදි කළේ ය.

ග්‍රීක පෞර රාජ්‍යවල උසස් සභ්‍යත්වයක් ඇති වුවත් ග්‍රීක ජනයාට පොදුවේ මේ සංස්කෘතිය රසවිඳීමට නොහැකි විය. උගතුන්, උසස් කලාකරුවන්, ලේඛකයන් ගණනාවක් පහළ වුවත්, සමහරුන්ට අත් වූ ඉරණම දෙස බැලීමෙන් පෙනී යන්නේ ඔවුන් හැමදෙනාටම ජනතා සහයෝගය නොලැබුණු බව යි.

විදේශීය උගතුන්ට ඇතැන්ස් රාජ්‍යයට පැමිණ ශාස්ත්‍රීය කටයුතුවල නියැලීමට ඉඩ දුන් අතර රාජ්‍යය අලංකාර කිරීමට, ගොඩනැගිලි තැනීමට පෙරික්ලීස් රජුගේ ආධාර හිමිවිය. එහෙත් කල් යන විට මොවුන්ට විරුද්ධව විශාල ජනතා මතයක් ඇති විය. එනිසා මොවුහු ඉවත් ව ගියහ. **සොක්‍රටීස්ට** එල්ල කළ චෝදනාව වූයේ බාල පරපුර නොමග යැවීම යි. ඒ නිසා ඔහු මරා දැමිණි. එවැනි චෝදනා එල්ල වූ අනෙකුත් අය ද රටින් පිටුවහල් කළ අතර මේ නිසා ග්‍රීක පෞර රාජ්‍යවල උසස් සංස්කෘතියක් බිහි වුව ද ඒවා රසවිඳීමට සියලු දෙනාට හැකියාවක් නොතිබීම එම ශිෂ්ටාචාරය පිරිහීයාමට හේතු විය. අභ්‍යන්තර අර්බුද හා බාහිර බලපෑම් හමුවේ මෙම ග්‍රීක ප්‍රදේශ රෝමවරුන් විසින් යටත් කර ගන්නා ලදි.

## ක්‍රියාකාරකම්

1. ග්‍රීක ශිෂ්ටාචාරයෙන් නූතන ලෝකයට ලැබී ඇති දායාද පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කරන්න.

2. ග්‍රීක සභ්‍යත්වය පිළිබඳ වැදගත් තොරතුරු සහිත බිත්ති පුවත්පතක් හෝ කුඩා පොතක් සකස් කරන්න.



### අභ්‍යාසය

1. ග්‍රීසියේ පැවති පෞර රාජ්‍ය පහක් නම් කරන්න.
2. ග්‍රීසියේ විවිධ අංශවලට අධිපති දෙවිවරුන් සිව් දෙනෙකු නම් කරන්න.
3. ග්‍රීසියේ පැවති ආණ්ඩුක්‍රම මොනවාද?
4. ග්‍රීක සමාජයේ වාසය කළ ජන කණ්ඩායම් නම් කරන්න
5. ග්‍රීක යුගයේ සම්පාදනය වූ සාහිත්‍ය කෘති කීපයක් නම් කරන්න.
6. ග්‍රීක දාර්ශනිකයින් තිදෙනෙකු හා විද්‍යාඥයින් තිදෙනෙකු නම් කරන්න.
7. '**ඉතිහාසයේ පියා**' වශයෙන් හඳුන්වන්නේ කවුද?
8. පෘථිවිය ගෝලාකාර බව සොයාගත්තේ කවරකු විසින් ද?
9. ප්‍රථම ලෝක සිතියම නිර්මාණය කළේ කවුරුන්ද?
10. ඔලිම්පික් ක්‍රීඩාවේ ඉතිහාසය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

## 4.2 රෝම ශිෂ්ටාචාරය

### 4.2.1 රෝමයේ භූගෝලීය පිහිටීම

ග්‍රීසියේ මෙන් ම රෝමයේ ද පැරණි ඉතිහාසය හැඩගැසීමට එරට භූගෝලීය සාධක බලපා ඇත. පැරණි රෝමයේ දකුණු සීමාව ඉතාලිය වේ. එහි උතුරු සීමාව **ඇල්ප්ස්** කඳු වැටිය යි. මේ කඳුවැටිය නිසා රෝමය යුරෝපා මහද්වීපයේ සෙසු රටවලින් වෙන් ව පවතී. දකුණින් හා බටහිරින් **මධ්‍යධරණී** මුහුදෙනුත් නැගෙනහිරින් **අන්ද්‍රියන් මුහුදෙනුත්** වටවී ඇති රෝමයට ඇල්ප්ස් කඳුවැටිය ඔස්සේ වැටී ඇති කපොලු හරහා ගෝත්‍රික සංක්‍රමණික හා ආක්‍රමණික ජනයා එයට ඇතුළුවීම වැළැක්විය නොහැකි විය.

රෝමයේ **ඇපිනයින්** (අල්පයින්) කඳුවැටිය නැගෙනහිර වෙරළට වඩාත් සමීපව පිහිටා ඇත. මෙම කඳුවැටියෙන් පටන් ගන්නා ටයිබර් ගංගාවේ මුවදොර ආසන්නයේ බටහිර වෙරළේ පිහිටි රෝම නගරයට මුළු ඉතාලි අර්ධද්වීපය ම පාලනය කිරීම ඉතාම පහසු විය. එය කඳු කීපයකට මැදිව පිහිටා තිබීම නිසා ජල ගැලීම් වැනි ස්වාභාවික විපත්වලින් හා සතුරු ආක්‍රමණවලින් ද ආරක්ෂා වේ. ටයිබර් නදිය දිගේ රෝමය දක්වා නැව් හා ඔරු පාරු යාත්‍රා කළ හැකි හෙයින් රෝමය වැදගත් නැව් තොටුපළක් ද වේ. එනිසා බාහිර හා අභ්‍යන්තර වෙළඳාම ඉතා දියුණු විය. සෞම්‍ය දේශගුණය හා සරුසාරවත් පස කෘෂිකාර්මික සංවර්ධනයට වැදගත් විය. මේ නිසා කුඩා ගමක් ලෙස ආරම්භ වූ රෝමය සියවස් කීපයක් ගතවන විට ආර්ථික වශයෙන් සමෘද්ධිමත් වූ ද දේශපාලන වශයෙන් බලවත් වූ ද අධිරාජ්‍යයක් වශයෙන් ගොඩනැගී තිබුණි.




සිතියම 4.2 රෝම ශිෂ්ටාචාරය පැවති ප්‍රදේශ
ඉපැරණි ලෝක ශිෂ්ටාචාර පොත ඇසුරෙනි

### 4.2.2 රෝම ශිෂ්ටාචාරයේ ආරම්භය හා රෝම බල ව්‍යාප්තිය

රෝම ශිෂ්ටාචාරය ඉතාලියේ ටයිබර් නදිය අසල ඉතා කුඩා රාජ්‍යයක් ලෙස ආරම්භ විය. රොමියුලස් ඉදි කළ නගරය රෝම නගරය නමින් ප්‍රසිද්ධියට පත් විය. එහි පදිංචිකරුවෝ රෝමවරු වූහ. ඔවුන් ගොඩනැගූ ශිෂ්ටාචාරය රෝම ශිෂ්ටාචාරය වේ. රෝම නගරය රජ කෙනෙකු යටතට පත් වීමෙන් රෝම ශිෂ්ටාචාරයේ ආරම්භය සිදු විය.

ලතින් රාජ්‍යයක් වශයෙන් ප්‍රභවය වූ මෙම රාජ්‍යය ශතවර්ෂ කිහිපයක් යන විට සුවිසල් අධිරාජ්‍යයක් බවට පත් විය. මෙය ග්‍රීක ශිෂ්ටාචාරයේ විකාශනයක් ලෙස ද හැඳින්විය හැකිය.

❖ **රෝම බලය ඉතාලියේ ව්‍යාප්ත වීම**




**සිතියම 4.3 රෝම බල ව්‍යාප්තිය**

**7 ශ්‍රේණිය ඉතිහාසය පෙළපොත ඇසුරෙනි**

රෝමය දේශපාලන ඒකකයක් වශයෙන් මුලින් ම ආරම්භ වන්නේ සතුරු ආක්‍රමණවලට මුහුණ දීමට ආරක්ෂිත බල කොටුවක් වශයෙනි

- ❖ ටයිබර් නදියෙන් හා කඳුවැටි තුනකින් රෝමය ආරක්ෂා වීමත්,
- ❖ රෝමය මුහුදු මාර්ගයකට ආසන්නව පිහිටීමත්,
- ❖ රෝමයේ සිට ඉතාලියට පහසුවෙන් ළඟා වීමට හැකි වීමත්

රෝමයේ බලය ව්‍යාප්ත වීමට උපකාරී විය. එහෙත් තාවකාලිකව රෝමය එට්‍රස්කන්වරුන් යටතට පත් විය. ඉන්පසු ක්‍රි. පූ. 509 දී පමණ එට්‍රස්කන් බලය බිඳ දමා රෝමය සමූහාණ්ඩු පාලනයක් ගොඩනගා ගත්තේ ය.

රෝම සමූහාණ්ඩුව පොදු නායකත්වයක් යටතේ අවට රාජ්‍යවල බලය අල්ලා ගත්තේය. එහි දී රෝම නායකත්වය තහවුරු කරගැනීමට පහත සඳහන් නව ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත.

- ❖ විශේෂ වරප්‍රසාද සහිත පුරවැසියන් පිරිසක් බිහි කිරීම.
- ❖ අනෙකුත් ලතින් රාජ්‍යවල වැසියන්ට සමාන අයිතිවාසිකම ලබා නොදීම
- ❖ රෝමවරුන්ට පක්ෂපාතී ජන පිරිසක් සෑම ලතින් රාජ්‍යයකම ඇති කිරීම
- ❖ ලතින් රාජ්‍ය අතර කිසිදු සම්බන්ධතාවක් ඇති කර ගැනීමට ඉඩ නොදීම
- ❖ පුරවැසියන්ගෙන් යුක්ත ජනපද සෑම ලතින් රාජ්‍යයකම පිහිටුවීම.

දකුණු ඉතාලියේ තිබූ ග්‍රීක පෞර රාජ්‍ය අතර නිතර ගැටුම් පැවතුණි. මධ්‍යම ඉතාලියේ සිටි **සැමනයිට්වරුන්** ද විටින් විට එම ප්‍රදේශවලට කඩා වැදුණි. මේ ආරවුල් මත ග්‍රීක පෞර රාජ්‍ය සමග ගිවිසුම් ඇති කරගෙන ඔවුහු එහි රෝම ආධිපත්‍යය ගොඩනගා ගත්හ.

පසුව එට්‍රස්කන්වරු ද පොදු පෙරමුණක් පිහිටුවාගෙන රෝමය ආක්‍රමණය කළත් එය පරාජය කිරීමට රෝමවරු සමත්වූහ. ඒ සඳහා රෝම සමූහාණ්ඩුවට සෙනෙට් සභාව හෙවත් ප්‍රභූ පාලක සභාවෙන් නායකත්වය ලැබුණි.

## ❖ උතුරු අප්‍රිකාවේ රෝම බලය ව්‍යාප්ත වීම

ක්‍රි. පූ. තුන්වන සියවස මැද භාගයෙන් පසු රෝම බලය උතුරු අප්‍රිකානු ප්‍රදේශවල ව්‍යාප්ත විය. මෙකල උතුරු අප්‍රිකාවේ කාතේජ් අධිරාජ්‍යය සමග රෝමවරු වාණිජ අවශ්‍යතා මත **සිසිලි දූපත** මුල් කරගෙන විටින් විට යුද්ධ කළහ. එම යුද්ධ **පියුනික් යුද්ධ** නමින් හඳුන්වයි. පියුනික් යුද්ධවලින් පසු රෝමය මධ්‍යධරණී ප්‍රදේශයේ බලවත් ම රාජ්‍යයක් බවට පත් විය.



රූපය 4.11

**රෝම යුධ භටයෙකු**

ඇලෙක්සැන්ඩර්ගේ මරණයෙන් පසු ග්‍රීක පෞර රාජ්‍ය හා **මැසිඩෝනියානු අධිරාජ්‍යය** අතර ආරවුල් ඇති විය. එහි දී රෝමවරු ග්‍රීකයන්ගේ පාර්ශ්වය ගෙන ක්‍රියා කළහ. කල් යන විට මේ ආරවුල් පදනම් කරගෙන රෝම ආධිපත්‍යය **මිසරය හා ග්‍රීසිය,** ආදී ප්‍රදේශවල ද **උතුරු ඉතාලිය** හා ඊට උතුරින් වූ **ප්‍රංශය** සමග සටන්කොට ජයග්‍රහණ කීපයක් ම ලබා ගත්තේය.

ඒ අනුව ක්‍රි. ව. පළමුවන සියවස වන විට රෝම බලය උතුරු **ඉතාලිය, ස්පාඤ්ඤය, ප්‍රංශය, බෙල්ජියම** වැනි ප්‍රදේශවලත් ඉන්පසු බ්‍රිතාන්‍යයේ දකුණු ප්‍රදේශවලත් ව්‍යාප්ත විය.

මෙකල කීර්තිමත් අධිරාජ්‍යයා **ජුලියස් සීසර්ය** (ක්‍රි. පූ. 59-44). ඔහුගේ ජයග්‍රහණ නිසා **සෙනෙට් සභාවේ** නායකයා වූ **පොම්පේ** ද ඔහුට එරෙහි විය. පසුව ඔහු මිසරයට පැන ගත්තේය. නමුත් ජුලියස් සීසර් මිසරයට ගොස් ඔහු මරාදමා මිසර අධිරාජිණිය ද මුණ ගැසුණි. අනතුරුව රෝමයට ආ සීසර් තමන් දෙවියකු ලෙස පිළිගැනීමක් ඇති කිරීමට දේවස්ථානයක තම පිළිරුව කරවීය. ඔහු එහි පාමුල **අනභිභවනීය** දෙවියා යන වදන් ලියවීය. මෙයට සමූහාණ්ඩුවාදී අදහස් දැරූ ජනතාව විරුද්ධ වූහ. අන්තිමට සෙනෙට් සභාවේ කුමන්ත්‍රණයකින් ම ක්‍රි. පූ. 44 දී ජුලියස් සීසර් මරා දැමිණි. පසුව බලයට පත් **ඔගස්ටස් සීසර්** සෙනෙට් සභාවේ අනුමැතිය ලත් ප්‍රථම අධිරාජයා විය. අනතුරුව **ක්ලෝඩියස්, නීරෝ, ජස්ටීනියන්** හා **කොන්ස්ටන්ටයින්** වැනි අධිරාජ්‍යවරුන් යටතේ ද රෝම බලය ව්‍යාප්ත විය.

ඒ අනුව කුඩා රාජ්‍යයක් වශයෙන් ආරම්භ වූ රෝමය ශතවර්ෂ කීපයක් යන විට විශාල අධිරාජ්‍යයක් බවට පත් විය. ක්‍රි. ව. දෙවන ශතවර්ෂය වන විට ලොකු කුඩා රාජ්‍ය 43ක් රෝමය විසින් පාලනය කරන ලදි. අන්තිමට ක්‍රි. ව. 330 දී පමණ පාලනය කිරීමේ පහසුව සඳහා රෝම අධිරාජ්‍යය කොටස් දෙකකට බෙදා වෙන් කෙරිණි.

- ❖ බටහිර රෝම අධිරාජ්‍යය
- ❖ නැගෙනහිර රෝම අධිරාජ්‍යය වශයෙනි.

## ක්‍රියාකාරකම

1. රෝම බල ව්‍යාප්තියේ විවිධ අවස්ථා පැහැදිලි කරන්න.

### 4.2.3 රෝම ශිෂ්ටාචාරයේ පැවති පාලන ක්‍රමය

රෝම ශිෂ්ටාචාර සමයේ පාලන ක්‍රම කීපයක් පැවතුණි.

- ❖ රාජාණ්ඩු පාලන ක්‍රමය
- ❖ සමූහාණ්ඩු පාලනක්‍රමය
- ❖ අධිරාජ්‍යවාදී පාලන ක්‍රමය


ඒ අනුව රෝමයේ ආණ්ඩුක්‍රම විකාශනයක් සිදු වූ බව දක්නට ලැබේ.

❖ **රාජාණ්ඩු ක්‍රමය**

මුලින් ම (ක්‍රි. පූ. 753 - 510 දක්වා) රෝම ශිෂ්ටාචාරයේ රාජාණ්ඩු පාලන ක්‍රමයක් පැවතුණි. එහිදී රජ කෙනෙකු පත් කර ගැනීම ප්‍රභූ පවුල්වලින් සිදු විය. එසේ තෝරා ගත් රජු ජනතාවගේ කැමැත්ත ද ලබා ගත යුතු විය. රජුට උපදෙස් දීම සඳහා ප්‍රභූවරුන්ගෙන් සමන්විත ආයතනයක් විය. එය **සෙනෙට් සභාවකට** සමාන ය.

මේ හැර **'මහජන සභාව' (රටවැසි සභාව)** යැයි හැඳින්විය හැකි සභාවක් ද වරින් වර කැඳවී ය. රජුගේ නිවේදනවලට සවන් දීම, ආගමික වතාවත් පැවැත්වීම, රජුගේ පත්වීමට අනුමැතිය ලබා ගැනීම වැනි කටයුතු සඳහා රටවැසි සභාව කැඳවිණි.

රජු අසහාය නායකයා වූ අතර ඔහු රටේ ප්‍රධාන විනිසුරුවරයා ද විය. මෙම රාජාණ්ඩු ක්‍රමය වසර තුන්සියයක් පමණ පැවතුණි. අන්තිමේදී රාජාණ්ඩු බලය විදේශිකයන් අතට පත් විය. ඔවුන්ගේ නොමනා ක්‍රියා නිසා රාජාණ්ඩු ක්‍රමය දුර්වල විය. ඒ සමග ප්‍රභූවරුන්ගේ බලය වැඩිවීමත් රෝම රාජ්‍යයේ විශාලත්වයත් නිසා රාජාණ්ඩුක්‍රමය පෙරළා දමා සමූහාණ්ඩු පාලන ක්‍රමයක් ගොඩනගා ගැනිණි.



රූපය 4.12 සෙනෙට් සභාව නමින් හැඳින්විය හැකි ආයතනය

### ❖ සමූහාණ්ඩු පාලන ක්‍රමය

ක්‍රි. පූ. 509 දී පමණ සමූහාණ්ඩු පාලන ක්‍රමය ඇති විය. එහි ප්‍රධාන ලක්ෂණය වූයේ **පරමාධිකාරී** බලය එක්තැනක නොපැවතීම යි. මේ තත්වය යටතේ එම බලය සෙනෙට් සභාවට හෝ **කොන්සාල්** නමින් හැඳින්වූ නිලධාරීන් දෙදෙනෙකුට පවරන ලදි. කොන්සාල්වරයෙකුගේ සේවා කාලය වසරකට සීමා විය. එම නිල කාලය තුළ දී ඔවුහු රෝම හමුදාවේ සේනාපතිවරුන් වශයෙන් ද ප්‍රධාන විනිශ්චයකාරවරු වශයෙන් ද කටයුතු කළහ. මෙහි කරන විධායක කටයුතුවල දී කොන්සාල්වරුන්ට සහාය පිණිස මහේස්ත්‍රාත්වරුන් පිරිසක් ද ජනතාව විසින් තෝරා ගන්නා ලදි. කාලයක් යන විට සෙනෙට් සභාව කොන්සාල්වරුන්ට ඉහළින් සිටින බලවත් සභාවක් බවට පත් විය. හමුදා කටයුතු හා විදේශ කටයුතු වැනි වැදගත් තීරණ ගනු ලැබුවේ ද සෙනෙට් සභාව විසිනි.

කොන්සාල්වරුන් වාර්ෂිකව වෙනස් වුවත් සෙනෙට් සභාව එසේ වෙනස් නොවීය. සෙනට් සභාවේ සාමාජිකයන් මනා අවබෝධයක් ඇති යාවජීව අය වූ නිසා ඔවුහු විශාල ආර්ථික ශක්තියක් ද සමාජයේ ඉහළ තත්වයක් ද හිමි කරගෙන සිටියහ. රාජ්‍යය විශාල වීමත් සමඟ මෙම ආණ්ඩු ක්‍රමයේ ද වෙනස්කම් ඇති විය. උදාහරණ ලෙස, ප්‍රධාන කොන්සාල්වරුන්ට අමතර ව ප්‍රාදේශීය කොන්සාල්වරුන් පිරිසක් ඇති විය. ඔවුන් යටතේ හමුදා බලයක් පැවති නිසා ස්වාධීනව කටයුතු කිරීමේ ඉඩකඩ ලැබුණි. මේ නිසා බලලෝභී පුද්ගලයෝ බිහි වූහ. මේ අනුව කොන්සාල් ක්‍රමය බලලෝභීන් අතර ගැටුම් ඇති වීමට හේතු විය.

රෝම සමාජයේ ඉඩම් හිමි ප්‍රභූවරු ('**පැට්‍රිෂියන්වරු**') සහ සාමාන්‍ය වැසියන් (**ප්ලෙබියන්වරු**) අතර බලය සඳහා දීර්ඝ කාලයක් තුළ ගැටුම් පැවතුණි. අන්තිමට ප්ලෙබියන්වරු රෝමයෙන් ඉවත්ව යාමට තීරණය කළහ. කෘෂිකර්මය, වෙළෙඳාම හා හමුදා සේවය වැනි අත්‍යවශ්‍ය කටයුතු රාශියක් ඉටු කළේ මේ සාමාන්‍ය වැසියන් විසින් ය. ඔවුහු **ප්ලේබියන් නමින් සභාවක් ද** පිහිටුවා ගත්හ. එහි පැනවූ නීති පසුව රෝමයට ම බලපාන තත්වයක් ඇති කර ගැනීමට සමත් විය. ඔවුන් තම අයිතිවාසිකම් දිනා ගැනීමට රෝමයෙන් ඉවත් වී යාමට තීරණය කිරීම ලෝක ඉතිහාසයේ දේශපාලන අරමුණු උදෙසා කෙරුණු **ප්‍රථම වැඩ වර්ජනය** ලෙස සැලකේ. එම අර්බුදය නිමා වූයේ පාලන කටයුතුවල දී ඔවුන්ට තරමක බලයක් ලබා දීමට පැට්‍රිෂියන්වරුන් එකඟවීමෙන් පසුව ය. මෙම ජයග්‍රහණය රෝමවරු සමගි සම්පන්න ජාතියක් බවට පත් වීමට ද හේතු විය.

පසුව ඔවුන් අතර විවාහ සම්බන්ධතා පවා ඇති විය. තව ද බලය බෙදා ගැනීමේ දී දැක්වූ ඉවසීම, යුක්තිගරුක බව හා දේශපාලන ගැටලු විසඳා ගැනීමට රෝමවරු තුළ පැවති දක්ෂතා ලොවට දුන් ආදර්ශයකි. ''අනුන් පාලනය කිරීමට බලාපොරොත්තු වන්නන් පළමුකොට කීකරුවීමට ඉගෙන ගත යුතුය''. යනු රෝම ආදර්ශ පාඨයකි.

කෙසේ නමුත් පැට්‍රිසියන්ස් ප්ලේබියන් ගැටුම පසුකාලීනව සමූහාණ්ඩු ක්‍රමය බිඳ වැටීමට හේතු විය.

මෙම ආණ්ඩුක්‍රමය බිඳ වැටීමට බලපෑ වෙනත් හේතු:

- රෝම පුරවැසියන් තුළ පැවති මහජන යුතුකම් පිළිබඳ හැඟීම් දුර්වල වීම
- පෞද්ගලිකත්වය ඉස්මතු වීම
- යුද ජයග්‍රහණ නිසා ධනවත් හා බලවත් පිරිසක් පහළ වීම
- ඉඩම් හිමියන් හා ධනවතුන් සෙනෙට් සභාවේ අනුග්‍රහය ලබා ගැනීම නිසා පෞද්ගලික අපේක්ෂාවන් ඉටු කර ගැනීමට කටයුතු කිරීම
- විලාස් නමින් හඳුන්වන විශාල ඉඩම් හා ගොවිපලවල් හිමි පිරිසක් බිහිවීම
- වහලුන්ට අසාධාරණ ලෙස සැලකීම නිසා වහල් කැරලි ඇති වීම



රූපය 4.13 ඔගස්ටස් සීසර්

❖ අධිරාජ්‍යවාදී ආණ්ඩුක්‍රමය

ක්‍රි. පූ. පළමු වන ශතවර්ෂය වන විට රෝම සමූහාණ්ඩු ක්‍රමය පරිහාණියට පත් වී තිබුණි. එනිසා රෝම අධිරාජ්‍යය ආරක්ෂා කර ගැනීමේ වගකීම වරින් වර පහළ වූ පුද්ගලයන්ට පැවරුණි. ඒ අනුව **ගෝජස්** සුවිශාල ගොවිපළවල් ඇතිවීම වළක්වමින් කෘෂිකාර්මික පරිහාණිය වැළැක්වීමට උත්සාහ කළේ ය. ඒ සඳහා ගෙන ආ පනතට සෙනෙට් සභාව විරුද්ධ විය. එහෙත් එම විරෝධතා නොසලකා ක්‍රියා කළ නිසා ගෝජස්ව කුමන්ත්‍රණයකින් මරා දැමීය. අනතුරුව තනතුරට පත් ගෝජස්ගේ සොහොයුරා ද එම වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යාමට උත්සාහ කළේ ය. ඔහු විසින් සෙනෙට් සභාවේ සාමාජිකයන් වැඩි කර එය කාර්යක්ෂම කරන ලදි. තවද ප්‍රාදේශීය ආණ්ඩුකාරවරුන්ට එල්ල වූ චෝදනා විභාග කිරීමට සෙනෙට් සභාවට තිබූ බලය අහෝසි කළේ ය. දුප්පතුන්ට ආහාර සැපයීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කළේ ය. මේ සඳහා ද සෙනෙට් සභාව තුළත් එයින් පිටතත් විශාල විරෝධයක් ඇති විය. ඒ නිසා ආණ්ඩුක්‍රමය වෙනස් කිරීමට හෝ ප්‍රතිසංස්කරණය කිරීමට ඔහුටත් නොහැකි විය. අවසානයේ දී ඔහු ද කුමන්ත්‍රණයකින් මරා දැමිණි.

මෙසේ රෝමයේ අභ්‍යන්තර වශයෙන් ආකූල ව්‍යාකූල තත්වයක් මතුවෙත්ම විදේශීය තර්ජන ද ඇති විය. ඒවාට මුහුණ දීමට සමූහාණ්ඩු පාලකයන්ට නොහැකි විය. ඒ නිසා රෝමය ආරක්ෂා කර ගැනීමේ වගකීම හමුදා නායකයන් අතට පත්විය. මේනිසා වරින් වර රෝමයේ බලවත් හමුදා නායකයෝ පහළ වූහ. හමුදා සේනාංකවල පක්ෂපාතීත්වය ලැබුණේ රෝම රජයට නොව හමුදා නායකයන්ට ය.

මෙසේ පහළ වූ හමුදා නායකයන් අතර **මේරියුස් හා සුල්ලා** කීර්තියක් ලබා ගත් අය වෙති. ඔවුහු එල්ල වූ තර්ජනවලින් රෝමය ගලවා ගැනීමට සමත් වූහ. පසුව මේ දෙදෙනා අතර ද බලලෝභීත්වය පදනම් කරගෙන ගැටුම් ඇති විය. එම ගැටුම් පැට්‍රිසියන් හා ප්ලේබියන් ගැටුමක් බවට පත් විය. ක්‍රි. පූ. පළමුවන සියවසේ බලයට පත් **ජූලියස් සීසර්** හා **පොම්පේ** රෝම බලය **ප්‍රංශය, බෙල්ජියම, සිරියාව, ජෙරුසෙලම හා බ්‍රිතාන්‍යයේ**

කොටසකට ද ව්‍යාප්ත කළහ. අන්තිමට සීසර් විසින් පොම්පේ ඝාතනය කරන ලදි. පසුව සෙනෙට් සභාවේ කුමන්ත්‍රණයකින් සීසර්ද ඝාතනය විය. මේ නිසා ජුලියස් සීසර්ගේ උත්සාහය ද අසාර්ථක විය. ඉන්පසු **ඔගස්ටස් සීසර්** රෝම අධිරාජයා බවට පත් විය.



රූපය 4.14 නීරෝ

ඔහු සෙනෙට් සභාවේ අනුග්‍රහය ලත් අධිරාජයා වූ අතර ඔහු විසින් අධිරාජ්‍යවාදී ආණ්ඩුවක් පිහිටුවා ගන්නා ලදි. මේ ක්‍රමය යටතේ රාජ්‍යයේ සියලු බලතල ඒකරාශී වීමක් දක්නට ලැබේ.

මේ නව ආණ්ඩුක්‍රමය යටතේ වුව ද කලින් පැවති සංස්ථා වෙනස් නොවීය. උදාහරණ ලෙස සෙනෙට් සභාව එලෙස ම තිබුණි. එයට ඉහළින් අධිරාජ්‍ය තනතුරක් විය. එම අධිරාජයාට ඒකාධිපති බලතල හිමි විය.

- හමුදාව පාලනය කිරීමේ බලය
- ප්‍රාදේශීය ආණ්ඩුකාරවරුන් පත් කිරීමේ බලය හා ව්‍යවස්ථා යෝජනා කිරීමේ බලය අධිරාජයා සතු විය.

ඔහු අධිරාජ්‍ය පාලනයට අවශ්‍ය කාර්යක්ෂම පරිපාලනයක් ද පිහිටුවා ගත්තේය. මෙයින් පසු ඒකාධිපතිත්වය තවදුරටත් තහවුරු වීමක් දක්නට ලැබේ. පසුව **ක්ලෝඩියස්, නීරෝ, ජස්ටිනියන්**, හා කොන්ස්ටන්ටයින් වැනි අධිරාජ්‍යවරු වූහ. ඔගස්ටස් සීසර් ඇති කළ ආණ්ඩු ක්‍රමයේ සුළු වෙනස්කම් ඇති වුවත් බටහිර රෝම අධිරාජ්‍ය අවසානය දක්වා ම එම ක්‍රමය පැවතුණි.

## ක්‍රියාකාරකම

1. රෝමයේ පැවැති ආණ්ඩුක්‍රමවල මූලික ලක්ෂණ පිළිබඳ ලිපියක් බිත්ති පුවත්පතකට පිළියෙල කරන්න



#### 4.2.4 රෝම ශිෂ්ටාචාරයේ සමාජය හා ජන ජීවිතය

රෝම ජන සමාජය ප්‍රධාන කොටස් තුනකින් සමන්විත විය.

- ❖ පැට්‍රිසියන්වරු (ප්‍රභූවරු)
- ❖ ප්ලේබියන්වරු (සාමාන්‍ය ජනයා)
- ❖ වහල්ලු

මේ අතරින් වහලුන්ට පුරවැසිභාවය හිමි නොවූ අතර කිසිදු අයිතිවාසිකමක් නොලැබුණි. පුරවැසියන්ගේ පාලනය යටතේ සිටි වහලුන් ශ්‍රමය සැපයූ පන්තිය වේ.

ප්‍රභූවරුන්ට හා සාමාන්‍ය ජනතාවට පුරවැසිභාවය හිමි විය. ඒ අතර ප්‍රභූවරුන්ට විශාල ඉඩම් ද යුද හමුදාවලත් රාජ්‍ය සේවයේත් ඉහළ තනතුරු හිමි විය. ආණ්ඩු බලය හිමි වූයේ ද එම පන්තියට ය.

සාමාන්‍ය වැසියෝ සුළු කර්මාන්තවලත්, වෙළඳාමේත්, කෘෂිකර්මාන්තයේත් නියැලුණි. ඔවුහු උසස් පවුල්වල සේවකයන් ලෙස ද කටයුතු කළහ. ඇතැම් විදේශීය ගෝත්‍රවල ජනයා ද මේ ගණයට අයත් වූහ. පැට්‍රිසියන්, ප්ලේබියන්වරුන් යනු වරප්‍රසාදලත් පොහොසත් හා වරප්‍රසාද නොලත් දුප්පත් කණ්ඩායම් දෙකකි. මුල දී මේ දෙපිරිස අතර නොයෙක් ගැටුම් ඇති වුවත් ඉහත සඳහන් කළ පරිදි පසුකාලයේ දී ප්ලේබියන්වරුන්ට දේශපාලන වරප්‍රසාද ලැබීමෙන් පසු ඔවුනොවුන් අතර විවාහ සම්බන්ධතා පවා ඇති විය.

සමාජ සම්මතයන්ට අනුකූලව ජීවත්වීම රෝමවරු ඉතා ඉහළින් අගය කළහ. පවුල ඉතාම පාරිශුද්ධ දෙයක් විය. එහි ප්‍රධානියා වූ පියාගේ තීරණවලට සියලුදෙනා අවනත වූහ. දරුවන් දෙමාපියන්ට කීකරුවීම උසස් ම ගුණධර්මයක් ලෙස සැලකිණි. පවුලක විනයගරුක භාවය හා සදාචාරය ඉහළින් සැළකිනි. රෝම සමාජයේ ළදරුවන්ට කුඩා කල සිට ම විනයගරුක බව ඉගැන්වූ අතර නීතිගරුක පුද්ගලයන්ට මහත් ගෞරවයෙන් සැලකීම නීතිගරුක සමාජයක් බිහි වීමට උපකාරී විය. රෝම සමාජයේ කාන්තාවට ද විශේෂ තැනක් හිමි වූවා මෙන් ම මව පූජනීයත්වයෙන් සැලකූ අතර ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයට ම සම තත්වයක් ලැබුණි.

රෝම ජන සමාජයේ වැඩි පිරිසක් චාම් දිවිපෙවතක් ගත කළහ. එහෙත් අධිරාජ්‍ය බලයක් ගොඩනැගුණු යුගයේ සිට ධනලෝභී හා බලලෝභී පාලකයෝ බිහිවූහ. සාමාන්‍ය ජනයා ද පොහොසත්වීමට මෙන් ම ඉහළ සමාජ තත්වයන් ගොඩනගා ගැනීමට උත්සාහ ගත්හ. මෙයින් සිදු වූයේ කාර්යක්ෂම හා සුහද විනය හා සදාචාර සම්පන්න පවුල් ජීවිත මෙන්ම සමාජ ක්‍රමය ද පිරිහී යාමයි.

## ක්‍රියාකාරකම

1. ''රෝම ජන ජීවිතයෙන් අපට ගත හැකි ආදර්ශ'' යන මැයෙන් රචනයක් ලියන්න.



### 4.2.5 රෝම ශිෂ්ටාචාරයේ ආර්ථිකය

❖ කෘෂිකර්මය

මුල් අවධියේ රෝම අධිරාජ්‍යයට ආර්ථික ශක්තියක් ලබා දුන්නේ නිදහස් ගොවි පන්තිය යි. මුල දී සෑම පුරවැසියෙකුට ම ගොවිතැන් කිරීමට ඉඩම් කොටසක් තිබුණි. ඔවුහු නොයෙකුත් ධාන්‍ය වර්ග, මිදි වැනි පලතුරු වගා කළහ. එරට පැවති නිරන්තර යුද්ධ නිසා නිදහස් ගොවි පන්තිය පිරිහී ගියේ ය. ඒ වෙනුවට **විලාස්** නම් විශාල ඉඩම් හා ගොවිපළවල් බිහි විය. එම ඉඩම් වගා කළේ ශ්‍රමිකයන් වූ වහල්ලුන් යොදාගෙන ය. මේ නව අර්ථක්‍රමය අසාර්ථක වූ නිසා ආර්ථික පරිහානියක් ඇති විය.



රූපය 4.15

❖ වෙළෙඳාම

රෝමවරු ග්‍රීකයන් තරමට කෘෂි කර්මාන්තයට හා වෙළෙඳාමට ද දක්ෂයෝ නොවූහ. එසේ වුවත් පැරණි යුගයේ පෙර අපරදිග රටවල් අතර පැවති වෙළෙඳාමේ කේන්ද්‍රස්ථානය වූයේ **රෝමය** යි. මේ නිසා රෝමයට විශාල ධනයක් ගලා ආවේ ය.

රෝමවරුන්ගේ ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථානය වූයේ **ඇලෙක්සැන්ඩ්‍රියාව යි.** එය මුල් කරගෙන මධ්‍යධරණී මුහුද අවට රටවල් සහ ලංකාව, ඉන්දියාව, චීනය වැනි රටවල් සමග ද වෙළෙඳ සබඳතා පැවැත්වූහ. ඊට සාක්ෂ්‍ය වශයෙන් මේ රටවලින් සොයාගත් රෝම කාසි දැක්විය හැකිය.

සීගිරිය, ගොඩවාය, අනුරාධපුරය, මාතොට, කල්පිටිය වැනි ප්‍රදේශවලින් ලැබුණු රෝම කාසි ගණනාවක් කොළඹ කෞතුකාගාරයේ තැන්පත් කර ඇත.

මීට අමතර ව **ප්ලිනි, කොස්මස්, ප්‍රකෝපියස්** වැනි අයගේ වාර්තා මෙන් ම මහාවංසය වැනි මූලාශ්‍රයවල ද එම රටවල් රෝමය සමග පැවැත් වූ වෙළෙඳ සම්බන්ධතා ගැන සඳහන් වේ.

**භාතිකාභය** රජතුමා රෝමයෙන් පබළු ගෙන්වා රුවන්වැලි සෑයට **කංචුකයක්** (දැල් වැනි ආවරණයක්) කරවීම රෝමයෙන් හා චීනයෙන් විසිතුරු පිඟන් භාණ්ඩ ආදියත්, ලංකාව, ඉන්දියාව වැනි රටවලින් මුතු, මැණික්, කුළුබඩු ආදියත් රෝමයට ගෙන ගොස් ඒවා යුරෝපා වෙළෙඳපොලේ අලෙවි කිරීම.

අභ්‍යන්තර වෙළෙඳාම සඳහා ද දියුණු මාර්ග පද්ධතියක් තිබුණි. **ඔගස්ටස් අධිරාජයාගේ** කාලයේ මහා මාර්ග කළුගල් දමා පුළුල් කළ අතර ගමනාගමන කටයුතු සඳහා අශ්වරථ ආදිය යොදා ගැනුණි.

## ක්‍රියාකාරකම

1. රෝමය හා ශ්‍රී ලංකාව අතර වෙළෙඳ ගනුදෙනු සිදුවූ බවට ඇති සාක්ෂ්‍ය සොයා ලියන්න.



### 4.2.6 රෝමයේ පැවති ආගමික විශ්වාස හා ක්‍රිස්තියානි ධර්මය

රෝම ශිෂ්ටාචාරය දීර්ඝ කාලයක් පැවති නිසා ආගමික වශයෙන් බොහෝ වෙනස්කම් ඇති විය. මුල දී අව්ව, වැස්ස, සුළඟ, විදුලි කෙටීම ආදී ස්වාභාවික සිදුවීම්වලට දේවත්වයක් ආරෝපණය කොට වන්දනාමාන කළහ. මෙම ස්වාභාවික බලවේග මූර්තිමත් කරන රූප නිර්මාණය කොට ඒවාට මෙන් ම භූතාත්මවලට ද පුද පූජා පැවැත් වූ අතර ඒවා සිදු කර ඇත්තේ පුළුල් දාර්ශනික පදනමක් මත පිහිටා නොවේ. එයින් වත්පිළිවෙත් මගින් සාර්ථකත්වය ලබා ගැනීම බලාපොරොත්තුව විය.

ඒ අතර මූර්තිවලට නැගූ වැදගත් දෙවිවරුන් කීපදෙනෙකු වන අතර ඔවුහු විවිධ අංශවලට අධිපතීත්වය උසුලති.

- ❖ ජුපිටර් - අහසට අධිපති දෙවියා
- ❖ කිබලේ (Kybele) - මව් දෙවඟන
- ❖ මාර්ස් - යුද්ධයට අධිපති දෙවියා
- ❖ සෙරෙස් - සාරවත් අස්වැන්නකට අධිපති දෙවියා
- ❖ වීනස් - ආලයට අධිපති දෙවඟන
- ❖ නෙප්චූන් - මුහුදට අධිපති දෙවියා
- ❖ මිනාර්වා - අත්කම්වලට අධිපති දෙවඟන
- ❖ ජූනෝ - ඉතා ම වැදගත් දේවතාවිය

මේ අනුව මුල දී රෝමයේ බහුදේවවාදයක් දක්නට ලැබුණු අතර රෝම රාජ්‍ය පුළුල් වීමත් සමඟ එය තවත් වැඩි විය.

මේ දේව විශ්වාසවලට අමතරව රෝම අධිරාජ්‍යවරු ද දේවත්වයෙන් සලකනු ලැබිණි. ඒ අනුව **ජුලියස් සීසර්** අධිරාජයා ද තමන් දෙවියෙකු යන පිළිගැනීම ඇති කිරීමේ අධිෂ්ඨානයෙන් රෝමයේ දේවස්ථානයක තම පිළිරුව සාදා එහි පාමුල **අනභිභවනීය** දෙවියා යනුවෙන් සඳහන් කළේ ය. නමුත් සමූහාණ්ඩුවාදී අදහස් දැරූ රෝමවරු මෙයට විරුද්ධ වූහ.

**ක්‍රිස්තියානි ආගමේ ව්‍යාප්තිය**

ආසියාවේ යුදෙව් වැසියන් අතර උපන් ක්‍රිස්තියානි ආගම **ජෙරුසෙලම, ජුඩායි හා පලස්තීනය** වැනි ප්‍රදේශවල ව්‍යාප්ත වී පසුව රෝමයට ද ඇතුලු විය. එකල රෝම අධිරාජ්‍යයේ පැවති ප්‍රතිපත්ති අනුව කිතුනු ආගමේ ව්‍යාප්තියට විරුද්ධ නොවීය. එය යුදෙව් ආගමේ කොටසක් ලෙස රෝමවරු සැලකූහ. කාලයක් යන විට ක්‍රිස්තියානි ආගම වේගයෙන් ව්‍යාප්ත වන්නට විය. මේ වන විට රෝම අධිරාජයා ද දේවත්වයෙන් පෙනී සිටියේ ය. ඔහු දෙවියෙකු ලෙස සලකා කටයුතු කළ යුතු විය.

එහෙත් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සර්ව බලධාරී දෙවියන්ගේ පුත්‍රයා ලෙස සැලකූ නිසා රෝම අධිරාජයාට දේවත්වයෙන් සැලකුවේ නැත. ඒ නිසා රෝම අදිරදහු කිතුනු ආගමට බලපෑම් කරන්නටත් කිතුනුවන්ට වධහිංසා කරන්නටත් වූහ. නීරෝ අධිරාජයා කිතුනු විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට පටන් ගත්තේය. එහෙත් පසුව ඔහු ආගමික කටයුතු කරගෙන යාමේ නිදහස ලබා දුන්නේය. එපමණක් නොව කොන්ස්ටන්ටයින් අධිරාජ්‍යයා කිතු සමය වැලඳගෙන එය රාජ්‍ය ආගම බවට පත් කළේ ය. මෙම රාජ්‍ය අනුග්‍රහයේ පසුබිම මත පූජකවරුන් අනුගමනය කළ ක්‍රියාමාර්ග, ආගමික මධ්‍යස්ථාන අතර ඇති වූ සම්බන්ධය හා සංවිධාන ආදිය නිසා අධිරාජ්‍යය පුරා ම කිතු දහම වේගයෙන් ව්‍යාප්ත වන්නට විය.

ක්‍රිස්තියානි ආගම යුරෝපයට විදේශ ආගමක් ලෙස ඇතුළු වුවත් එය රෝම ශිෂ්ටාචාරය හැඩ ගැසීමට බලපෑ වැදගත් ම සාධකය විය. යුරෝපයේ අද දක්වා ම ඇති සදාචාරය ක්‍රිස්තියානි ආගම මත හැඩ ගැසී ඇත

.

## ක්‍රියාකාරකම

1. කිතු සමය රෝමයේ ව්‍යාප්ත වීම සඳහා බලපෑ හේතු සාධක පැහැදිලි කරන්න.



## 4.2.7 රෝම ශිෂ්ටාචාරයේ සංස්කෘතික අංග ලක්ෂණ

### ❖ වාස්තුවිද්‍යා ශිල්පය

ග්‍රීක ශිෂ්ටාචාරයේ තරම් සංස්කෘතික දියුණුවක් රෝම ශිෂ්ටාචාරයේ දක්නට නොලැබේ. නමුත් ග්‍රීක යුගයේ පැවති යම් යම් අංග ලක්ෂණ තවදුරටත් විකාශනය වීමක් දැකිය හැකිය. විශාල ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධ ව රෝමවරු ප්‍රමුඛස්ථානයක් හිමි කර ගනිති.



රූපය 4.1 6 කොලෝසියම

කුළුණු හා ස්තම්භ ඉදි කිරීමේදී ග්‍රීක ආභාසය ලැබී ඇත. එසේ වුවත් ආරුක්කු සහ ගොඩනැගිලි මුදුනෙහි වූ ගෝලාකාර ශිඛර රෝමවරුන්ට ආවේණික නිර්මාණ වේ. **පාතිනන් දේවස්ථානයේ** ගෝලාකාර ශිඛරය ඒ අතර වැදගත් වේ. කලාත්මක නිර්මාණවලට වඩා සැප පහසුකම් ඇති ගොඩනැගිලි ඉදිකිරීම මොවුන්ගේ විශේෂ ලක්ෂණයකි.

රෝම වාස්තු විද්‍යාවේ අමරණීය නිර්මාණ ලෙස පාතිනන් දේවස්ථානය හා කොලිසියම් ක්‍රීඩාගාරය දැක්විය හැකිය. එම ක්‍රීඩාගාරයට එකවර පුද්ගලයන් 50000ක් පමණ ඇතුළු කළ හැකිය. තවද ඩයොක්ලීෂන් අධිරාජ්‍යයාගේ මාලිගය හා වාණිජ මධ්‍යස්ථානයක් වූ **බැසිලිකා** දේවස්ථානය සුවිශේෂ නිර්මාණ වේ. රෝම ගොඩනැගිලි ඉදිකිරීමේ දී අලංකාරයට වඩා අවශ්‍යතාවට මුල්තැනක් ලබා දී ඇත. එනිසා ඒවා ශක්තියෙන් හා ප්‍රමාණයෙන් විශාල වේ. සෑම නගරයක ම පාහේ නාන තටාක හා රංග ශාලා ද ඉදි

කර තිබේ. රෝමවරු මේ නගර නිර්මාණ කිරීමේ දී විධිමත් මහාමාර්ග පද්ධතියක් සකස් කළහ. මාර්ග සැතපුම 12000ක් තනවා ප්‍රධාන නගර අතර සම්බන්ධතා ශක්තිමත් කළහ. මාර්ග තැනීමේ දී පාලම් ඉදිකිරීමට විශේෂ දක්ෂතා දක්වා ඇත.



රූපය 4.17 පොම්පේ නගරය

❖ **මූර්ති හා කැටයම් කලාව**

රෝම ධනවතුන්ගේ නිවාස අලංකාර කිරීමට කැටයම් කරන ලද ගෘහ භාණ්ඩ, වර්ණවත් පලස්, ලෝකඩ පිළිම, යනාදිය භාවිත කර ඇත. ප්‍රතිමාවල ඇති ජීවමාන ස්වරූපය රෝම මූර්ති කලාවේ ඇති සුවිශේෂ ලක්ෂණයකි. **නීරෝ** අධිරාජයාගේ ප්‍රතිමාවත්, **ඔගස්ටස් සීසර්** අධිරාජයාගේ යැයි සැලකෙන **ලෝකඩ හිසත්, ඩයොක්ලීෂියස්ගේ ප්‍රතිමාවත්,** රෝම මූර්ති කලාවේ විශිෂ්ටත්වය නිරූපණය කරන නිදසුන් වේ.



රූපය 4.18 ඔගස්ටස් සීසර් අධිරාජයාගේ යැයි සැලකෙන ලෝකඩ හිස

## ❖ සාහිත්‍යය හා අධ්‍යාපනය

ග්‍රීකයන්ගේ මෙන් ම රෝමවරුන්ගේ ද දියුණු සාහිත්‍ය කලාවක් පැවතුණි. රෝම අධිරාජ්‍යයට ග්‍රීසිය ඈඳාගත් පසු ග්‍රීක සාහිත්‍යයේ ආභාසය රෝම සාහිත්‍යයට ලැබිණ. එයින් පසු රෝම සාහිත්‍යය සැලකිය යුතු මට්ටමින් දියුණු විය.

රෝම සාහිත්‍ය කෘති ලියුවේ **ලතින් භාෂාවෙනි. ලුක් රීටස්** කෘති රචනා කළේ රෝමවරුන් මිථ්‍යා අදහස්වලින් ගලවා ගැනීමට ය. **වර්ජිල්** නම් කවියා ඊඩිනි වැනි කෘති රචනා කළේ රෝම පුරවැසියන් ලෙස ඔවුන්ගේ වගකීම හා යුතුකම් ගැන අවබෝධයක් ලබා දීමට ය. එම කෘතිය ලෝක සාහිත්‍යයේ ඇති ශ්‍රේෂ්ඨතම කෘති අතරින් එකකි. සාහිත්‍ය විචාරකයෙකු, උපහාස කථාකරුවෙකු හා කවියෙකු වූ **හෝරේස්** රෝම සාහිත්‍යයේ කැපී පෙනෙන පුද්ගලයෙකි. මීට පෙර **ජුලියස් සීසර්** හා **සිසරෝ** වැනි අධිරාජ්‍ය පාලකයන් ද සාහිත්‍යකරණයේ නියැලී ඇත. ලතින් සාහිත්‍යය වඩාත් දියුණු වූයේ **ඔගස්ටස් අධිරාජයාගේ** පාලන සමයේ දී ය. **වර්ජිල්, හොරේස්, ලිවි, සැලුස්ට් හා ඕවිඩ්** වැනි අයගේ කෘති වැදගත් විය. **ලිවි** හා **ටැසිටස් ටෙරන්ස්,** යන අය විසින් ඉතිහාස කෘති රචනා කරන ලදි. ප්ලූටාර්ක් ඉතිහාසය කෘති මෙන් ම නාට්‍ය කෘති ද රචනා කළේය. **සෙනෙකා** නාට්‍ය කෘති රචනා කළ අතර **ජුවෙල්නා** උපහාස කතා ද මාකස් **අවුරේලියස්** ඇතුළු තවත් බොහෝ දෙනා ලතින් සාහිත්‍ය පෝෂණය කිරීමට නොයෙක් සාහිත්‍යය කෘති සම්පාදනය කළහ.

කිතු සමය රෝම රාජ්‍ය ආගම වූවාට පසු පූජකවරු දේවධර්මය ප්‍රචාරය කිරීම සඳහා ලතින් භාෂාව යොදා ගත්හ. ඒ සඳහා ක්‍රිස්තියානි පතපොත ලතින් භාෂාවෙන් බිහිවීමෙන් සාහිත්‍ය තවදුරටත් පෝෂණය විය.

## ❖ අධ්‍යාපනය

රෝමවරු අධ්‍යාපන කටයුතු සඳහා විශේෂ අවධානයක් යොමු කළහ. ලතින් භාෂාව අධ්‍යාපන මාධ්‍යය විය. ව්‍යාකරණ, භූගෝල විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, තර්ක ශාස්ත්‍රය, ගණිතය, විද්‍යාව, ඉතිහාසය යනා දී විෂයන්ට අධ්‍යාපනයේ විශේෂ තැනක් හිමි විය. මේ නිසා බොහෝ පත පොත රචනා විය. ඇතැම් විට නාට්‍ය කලාව, ගෘහ නිර්මාණ හා මූර්ති ශිල්පය ද අධ්‍යාපන ක්ෂේත්‍රයේ විෂය ධාරාවට ඇතුළත් ව තිබෙන්නට ඇත.

## ❖ රෝම දර්ශනය

ග්‍රීකයන් මෙන් දර්ශනය විෂය ක්ෂේත්‍රයට අලුතින් යමක් එක් කිරීමට රෝමවරු පොහොසත් වූයේ නැත. එසේ වුවත් '**සෙනෙකා**' සහ **මාකස්** අවුරේලියස් අධිරාජ්‍යයා රෝම ශිෂ්ටාචාරයේ ශ්‍රේෂ්ඨ දාර්ශනිකයෝ වූහ. **මාකස් අවුරේලියස්** දර්ශන විෂය සම්බන්ධව ලියා ඇති '**චිත්ත සමාධිය**' නම් කෘති වැදගත්ය.

## ❖ විද්‍යාත්මක දැනුම

ග්‍රීක යුගයේ තරම් නව සොයා ගැනීම් හා නිෂ්පාදන නොමැති වුවත් විද්‍යාත්මක හා තාක්ෂණික දියුණුවක් පැවති බවට සාධක ඇත. ඒවා අතර විධිමත් නගර සැලසුමක් හා ජලප්‍රවාහන ක්‍රම, ජලනල මාර්ග එයට සාධක වේ. උදාහරණ වශයෙන් පොම්පේ නගර නිර්මාණය එහි නිවාස හා අනෙකුත් වාස්තු විද්‍යා අවශේෂවලින් ඔවුන් සතුව තිබූ තාක්ෂණික හා විද්‍යාත්මක දැනුම තවදුරටත් පිළිබිඹු වේ. සනීපාරක්ෂාව පිළිබඳව ඔවුන් දක්වා ඇති උනන්දුව ඉතා ඉහළ ය.

බොහෝ විට වෛද්‍ය ප්‍රතිකර්මවල දී නේවාසිකව ප්‍රතිකර්ම කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක ව තිබුණි. රෝම අධිරාජ්‍යයේ සිටි ප්‍රධාන වෛද්‍යවරයා ග්‍රීක ජාතික '**ගැලන්**' ය. ඔහු කාය ව්‍යවච්ඡේද විද්‍යාව හා ශරීරයේ අවයවවල ක්‍රියාකාරීත්වය පිළිබඳ මෙන් ම අවශේෂ විද්‍යාව පිළිබඳ විශාල පොත් ප්‍රමාණයක් ලියා ඇත. මෙකල ශල්‍ය වෛද්‍ය විද්‍යාව සැලකිය යුතු මට්ටමක දියුණුව පැවතුණි. **ප්ලිනිගේ ස්වාභාවික ඉතිහාසය** නම් කෘතිය සියලු විද්‍යාවන් පිළිබඳ සංක්ෂිප්ත සංග්‍රහයකි. ඉතිහාසඥයකු මෙන් ම භූ විද්‍යාඥයකු වූ **ස්ට්‍රැබෝ** විසින් විවිධ භෞතික භාණ්ඩවල ප්‍රයෝජන පිළිබඳ විග්‍රහයක් සපයා ඇත. ඇලෙක්සැන්ඩ්‍රියාවේ තාරකා ශාස්ත්‍රඥයකු වූ **සොසිගිනස් ජූලියස්** දින දර්ශනය සකස් කළ අතර ජූලියස් සීසර්ගේ කාලයේ දී එය ක්‍රියාත්මක කිරීම ආරම්භ කෙරිණි. රෝමවරු **එට්‍රස්කන්වරුන්ගෙන් ප්‍රස්තාර** ක්‍රමය ද ඉගෙන ගත්හ.

## ❖ රෝම නීතිය

රෝමවරුන්ගෙන් ලද තවත් විශේෂ දායාදයකි නීති ක්‍රමය. වර්තමාන ලෝකයේ ශිෂ්ට සම්පන්න ජාතීන් සියල්ලන් ම පාහේ රෝම නීතියේ පහස ලබා ඇත. බැබිලෝනියානු අධිරාජ්‍යයේ **හමුරාබිගේ නීති සංග්‍රහයෙන්** පසු ක්‍රමවත් නීති පද්ධතියක් ගැන අසන්නට ලැබෙන්නේ රෝම ශිෂ්ටාචාරයෙනි. රෝම අධිරාජ්‍යය යටතේ විවිධ ජන කොටස් ජීවත් වූහ. මොවුන් පාලනය කිරීමේ දී විවිධ නීති පැනවීමට සිදු විය. මේ නිසා රෝම අධිරාජ්‍යය තුළ සංකීර්ණ හා අංග සම්පූර්ණ යැයි සැලකිය හැකි නීති ක්‍රමයක් ඇති විය.

ප්‍රථමයෙන් ම නීති පද්ධතියක් බිහි වූයේ ක්‍රි. පූ. 150 දී පමණ ය. ඒ **චක්‍ර 12ක්** ලෙසිනි. ඒවා තඹ එලක 12ක ලියා සියලු දෙනාගේ දැන ගැනීම සඳහා වෙළෙඳ මධ්‍යස්ථානවල ප්‍රදර්ශනය කර තිබුණි. පසුකාලීනව රෝම අධිරාජ්‍යය හා වෙළෙඳ කටයුතු පුළුල් වීම හේතුකොටගෙන ඇති වූ වෙනස්කම් සමග නීති පද්ධතිය ද පුළුල් කිරීමේ අවශ්‍යතාව මතු විය. ඒ අනුව රෝම නීතිය ක්‍රමයෙන් විකාශනය විය. රෝම අධිරාජ්‍යයේ ජීවත් වූ විදේශිකයන්ගේ අයිතිවාසිකම් ගැන සලකා බැලීමට රෝම ආණ්ඩුව විසින් විනිසුරුවරයෙක් පත් කරන ලදි. එම තනතුර සඳහා වරින් වර පත් වූ අය විදේශීය සිරිත් විරිත් සැලකිල්ලට ගෙන නව නීති පද්ධතියක් ගොඩනැගූහ. අනෙකුත් ක්ෂේත්‍ර විනිසුරුවන්ගේ නියෝග හා මහේස්ත්‍රාත්වරුන්ගේ නීති ද ලිඛිත නොවූ නීති වශයෙන් පැවතුණි.

රෝම නීතිය විග්‍රහ කොට සංග්‍රහ ගත කිරීම සිදු වූයේ ක්‍රි. ව. හයවන සියවසේ දී ය. එය ජස්ටිනියන් නීති සංග්‍රහය ලෙස හැඳින්වේ. එහි ප්‍රධාන කොටස් හතරකි. එනම්,

- කොට්
- ඩයිජස්
- ඉන්ස්ට්‍රජන්
- නවස්

ඒ අනුව එම නීති පද්ධතිය පදනම් කොටගෙන නඩු ඇසීම, සාක්ෂ්‍ය ඔප්පු කිරීම, ජූරි සභාවක් මගින් අවසන් තීන්දුව ගැනීම, චූදිතයා වැරදිකරුවකු බව ඔප්පු වනතුරු ඔහු නිවැරදිකරුවෙකු ලෙස පිළිගැනීම, නීතිය ඉදිරියේ සෑම පුරවැසියෙකුට ම එක හා සමානව සැලකීම යනාදිය එම නීතියේ ප්‍රධාන ලක්ෂණ වේ. මධ්‍යතන යුගයේ රෝම නීතිය භාවිත කිරීම තාවකාලික ව යටපත් විය. එහෙත් **ජස්ටින්** එය **නීති සංග්‍රහයක්** බවට පත් කොට තිබුණු නිසා ආරක්ෂා විය. පසුව විශ්වවිද්‍යාලවල ද එම රෝම නීතිය හැදෑරූ අතර එනිසා රෝම නීති ක්‍රමය යුරෝපය පුරා ම ව්‍යාප්ත විය.

- 17 වන සියවසේ දී ලන්දේසීන් රෝම නීතිය හඳුන්වා දුන් අතර එම නීති ක්‍රමය **රෝම-ලන්දේසි නීතිය** යනුවෙන් හැඳින්වේ.

## ක්‍රියාකාරකම

1. රෝම නීතිය ගොඩනැගුණු ආකාරය පැහැදිලි කරන්න.



➢ රෝම අධිරාජ්‍යයේ පරිහානිය හා බිඳ වැටීම

- ❖ ක්‍රි. ව. හතරවන සියවස පමණ සිට පරිහාණියේ ලක්ෂණ පහළ වීම
- ❖ පාලනය කිරීමෙහි පහසුව සඳහා ක්‍රි. ව. 330 දී රෝම අධිරාජ්‍යය නැගෙනහිර අධිරාජ්‍යය හා බටහිර අධිරාජ්‍යය වශයෙන් කොටස් දෙකකට බෙදීම

➢ දේශපාලන පරිහානිය

- ❖ දුර්වල පාලකයන් බලයට පත් වීම
- ❖ බලය විකේන්ද්‍රගත වීම (බලය බෙදී යාම)
- ❖ රාජධානියේ දේශසීමා පුළුල් වීම නිසා දේශපාලන අර්බුද නිර්මාණය වීම
- ❖ රාජ්‍ය උරුමය පිළිබඳ නිරවුල් ප්‍රතිපත්තියක් නොතිබීම
- ❖ හමුදාවල තිබූ විනයගරුක බව පිරිහී යාම

➢ ආර්ථික පරිහානිය

- ❖ ගොවි පන්තිය දුර්වල වීම.
- ❖ **'විලාස්'** නමින් විශාල ගොවිපළවල් බිහි වීම.
- ❖ වහල් කැරලි කෝලාහල ඇති වීම.
- ❖ වාණිජ කටයුතු ක්‍රමයෙන් දුර්වල වීම.
- ❖ නිෂ්පාදනය අඩපණ වීම.
- ❖ අධික ලෙස බදු අය කිරීම.
- ❖ ධනවත් අය හා දුප්පත් අය අතර ඇති නැති පරතරය විශාල වීම මත අර්බුද නිර්මාණය වීම
- ❖ බාහිර තර්ජනයන්ට නිතර මුහුණපෑමට සිදු වීම. එනම් ම්ලේච්ඡ ජන කොටස් විටින් විට බටහිර රෝමයට කඩා වැදීම.

මෙවැනි හේතු සාධක ගණනාවක් මත ක්‍රි. ව. පස් වන සියවසේ බටහිර රෝම අධිරාජ්‍යය බිඳ වැටුණි. එයින් ශතවර්ෂ 10කට පමණ පසු එනම්, ක්‍රි. ව. 1453 දී නැගෙනහිර රෝම අධිරාජ්‍යය ද බිඳ වැටුණි. ඒ මුස්ලිම් ආක්‍රමණ හමුවේ ය. එයින් පසු නූතන යුරෝපා යුගය උදා විය.

## ක්‍රියාකාරකම්

1. රෝම අධිරාජ්‍යයේ පිරිහීමට හා බිඳ වැටීමට හේතු වූ කරුණු මොනවාද?
2. රෝම සමාජයේ ඔබ හඳුනාගත් සුවිශේෂ ලක්ෂණ ගොනුවක් වශයෙන් පිළියෙල කරන්න.

## 4.3 ක්‍රි. පූ. හයවන සියවසේ උතුරු ඉන්දියාව


ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට පසු ක්‍රි. පූ 1500 දී පමණ ආර්ය හෙවත් වෛදික ශිෂ්ටාචාරය ආරම්භ විය. ඒ පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා ඇති ප්‍රධානතම මූලාශ්‍රය වන්නේ පුරාණ ඇතුළත් වෛදික ග්‍රන්ථය. ක්‍රි. පූ හයවන සියවසේ ඉන්දීය ඉතිහාසය හැදෑරීම සඳහා උපයෝගී කර ගත හැකි ප්‍රධාන මූලාශ්‍රය වන්නේ බෞද්ධ ග්‍රන්ථ ය.

### 4.3.1 දේශපාලන තත්වය

ඉන්දියාවට සංක්‍රමණය වූ ආර්යයන් මුලින් ම පදිංචි වූයේ පංජාබ් හෙවත් සප්ත සින්දු ප්‍රදේශයේ ය. පසුව ඔවුහු ගංගා ගං නිම්නය දක්වා ද ව්‍යාප්ත වූහ. ක්‍රි. පූ. හයවන සියවස පමණ වනවිට සොළොස් මහාජනපද වශයෙන් ඔවුන් සතු පෙදෙස් වර්ධනය වූ බව බෞද්ධ සාහිත්‍ය මූලාශ්‍රයවල දැක්වේ. ඒවා එසේ වර්ධනය වූයේ කෘෂිකර්මය, වෙළෙඳ හා කර්මාන්ත පදනම් කරගෙන ය. එම ජනපද මෙසේ වෙයි

| ජනපදය | අගනුවර | ජනපදය | අගනුවර |
|---|---|---|---|
| අංග - | චම්පා | කුරු - | ඉන්ද්‍ර ප්‍රස්ත |
| මගධ - | රජගහනුවර, පාටලීපුත්‍ර | පංචාල - | අහිච්ඡත්‍රය, කම්පිල්ල |
| කාසි - | බරණැස | මත්ස - | විරාට |
| කෝසල - | කුසාවතී, ශ්‍රාවස්ති | සූරසේන - | මධුරාපුර |
| වජ්ජි - | වේසාලි (විශාලා) | අස්මක - | පෝතලි |
| මල්ල - | කුසිනාරා, පාවා | අවන්ති - | උදේනිය |
| චේදි - | සාත්ථිමති | ගන්ධාර - | පුරුෂපුරය, තක්ෂිලාව |
| වත්ස - | කොසඹෑ (කෞෂම්බි) | කාම්බෝජ - | ද්වාරකපුරය |

මේ සොළොස් මහාජනපද අතරින් වින්ධ්‍යා කඳු වැටියෙන් දකුණු ප්‍රදේශයේ පිහිටියේ අස්මක ජනපදය පමණි. මෙම ජනපදවලට අමතරව ගෝත්‍ර මගින් පාලනය කළ කුඩා පාලන ඒකක වයඹ දිග ඉන්දියාවේ තිබුණි. මෞර්ය යුගය වනවිට ද ඒවා තිබුණේය.




**සිතියම 4.4 සොළොස් මහාජනපද**
**ඉපැරණි ලෝක ශිෂ්ටාචාර පොත ඇසුරෙනි**

## ක්‍රියාකාරකම

1. සොළොස් මහාජනපද ගැන වැදගත් තොරතුරු ගොනු කරන්න.

### 4.3.2 සොලොස් මහාජනපද පාලන ක්‍රමය

සොළොස් මහාජනපදවල ප්‍රධාන පාලන ක්‍රමවේද දෙකක් පැවතුණි.

1. රාජාණ්ඩු පාලන ක්‍රමය
2. සමූහාණ්ඩු (ගණ/සංඝ) පාලන ක්‍රමය

➢ **රාජාණ්ඩු පාලන ක්‍රමය**

රාජාණ්ඩු පාලනය යනුවෙන් හැඳින්වූයේ රජුගේ ප්‍රධානත්වයෙන් පැවති පාලනය යි. එහි විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය යන සියලු බලතල රජු සතු විය. රජුගේ පාලන කටයුතුවලට සහායවීම සඳහා සේනාපති, පුරෝහිත, අසිග්ගාහක, භාණ්ඩාගාරික වැනි නිලධාරින්ගෙන් සමන්විත මණ්ඩලයක් විය. ඉන් ප්‍රධාන රාජාණ්ඩු වූයේ මගධය, කෝසලය, වත්ස හා අවන්ති යන ජනපද හතර යි. ඒ අතරින් මගධය හා කෝසලය වඩා බලසම්පන්න විය. අවසානයේ දී මගධය බලවත් ම රාජාණ්ඩුව බවට පත් විය. ඉන්පසුව අධිරාජ්‍යයක් බවට වර්ධනය විය.

➢ **සමූහාණ්ඩු පාලන ක්‍රමය**

පාණිනීගේ අෂ්ටාධ්‍යාය නම් ව්‍යාකරණ ග්‍රන්ථයෙහි සංඝ හෙවත් ගණ තන්ත්‍ර රාජ්‍ය ගැන සඳහන් වේ. ඒවායෙහි ප්‍රධාන ලක්ෂණය වූයේ එක් පාලකයෙකු වෙනුවට සමූහයක් එක්ව පාලනය කිරීම යි. එවැනි සමූහාණ්ඩු ගණනාවක් උතුරු ඉන්දියාවේ පැවතුණි.

ශාක්‍යයන්ගේ කපිලවස්තු
මල්ලයන්ගේ පාවානුවර හා කුසිනාරා
ලිච්ඡවීන්ගේ වේසාලි
විදේහයන්ගේ මිථිලා

කෝලියන්ගේ රාමගාම
බූලීන්ගේ අල්ලකප්ප
කාලාමයන්ගේ කේසපුත්ත
මෝරියන්ගේ පිප්ඵලී වනය
භග්ගයන්ගේ සුංසුමාරගිරිය

ගණ රාජ්‍ය යටතේ සංවිධානය වූ පිරිස් හැටියට සැලකිය හැකි ය. ලිච්ඡවී හා මල්ල යන ජනපද දෙක ගණ රාජ්‍ය අතර වැදගත් වේ. ගණපති, ගණජ්‍යෙෂ්ඨ, ගණරාජ, සංඝමුඛ්‍ය යනාදී නම්වලින් ගණ රාජ්‍යවල ප්‍රධානියා හඳුන්වා ඇත.

මේ ගණ හෝ සංඝ රාජ්‍යයන්හි පැවති පරිපාලන ක්‍රමය ගැන අවබෝධයක් බෞද්ධ සාහිත්‍යයෙන් ලබා ගත හැකි ය. ගණ රාජ සභාවේ සැම දෙනාම එකතු වී රාජ්‍ය පිළිබඳ සැම ප්‍රශ්නයක් ම විවෘතව සාකච්ඡා කොට විසඳා ගැනීම පිළිගත් ක්‍රමයක් වී තිබේ. පරිපාලනයට සම්බන්ධව යෝජනා ඉදිරිපත් කිරීම හා ඒවා තුන්වරක් කියවා විරෝධතා මතු නොවූයේ නම් ඒකමතිකව සම්මත කර ගැනිණි. යම් විරෝධයක් ඇති වූයේ නම් සාකච්ඡා කොට ඡන්දය විමසීමක් සිදුකොට වැඩි ඡන්දයෙන් සම්මත කර ගෙන ක්‍රියාත්මක කරනු ලැබී ය.

වජ්ජි ගණ රාජ්‍යයේ ලිච්ඡවී පාලකයින් තුළ පැවති ඉහළ ගුණාංගයක් ලෙස සප්ත අපරිහාණිය ධර්ම අනුව කටයුතු කිරීම දැක්විය හැකි ය. එය බුදුරජාණන් වහන්සේ පවා දේශනා කළ පාලන න්‍යාය ධර්මයකි.

**සප්ත අපරිහාණීය ධර්ම**

1. නිතර නිතර රැස් වී සාකච්ඡා කිරීම
2. සමගිව රැස්ව සමගිව කරුණු සාකච්ඡා කිරීම හා සියලු දෙනා සමඟිව විසිර යාම
3. නොපැන වූ නීති නොපැනවීම හා පැනවූ නීති නොපිරිහෙළා ක්‍රියාත්මක කිරීම හා ඒ ලෙස ම අනුගමනය කිරීම. පෞරාණික වජ්ජි ධර්ම පිළිගෙන කටයුතු කිරීම
4. ජ්‍යෙෂ්ඨයන්ට ගරු සැලකිලි දැක්වීම, ඔවුන්ගේ අවවාද අනුශාසනාවලට ඇහුම්කන්දීම හා ඒවා පිළිපැදීම.
5. කුල කාන්තාවන්ට ගරු කිරීම හා ඔවුන්ගේ අභිමානය ආරක්ෂා කිරීම
6. පරම්පරාගතව ධාර්මිකව කළ කටයුතු අඛණ්ඩව ඉටු කිරීම
7. මහණ බමුණන් නිසි ලෙස රැක බලා ගැනීම

මේ නිසා ලිච්ඡවීන්ගේ වජ්ජි ජනපදයේ ශක්තිමත්, ස්ථාවර පාලනයක් පැවති බව පෙනේ. පසුකාලයේ බලවත් රාජාණ්ඩුවල පාලකයෝ අධිරාජ්‍ය බලයක් ගොඩනගාගෙන ලිච්ඡවී සමූහාණ්ඩුව ද යටත් කර ගැනීමට ක්‍රියා කළහ.

### 4.3.3 සමාජ තත්වය

මේ අවධිය වන විට,

- ගෝත්‍ර සමාජ ක්‍රමය ක්‍රමිකව අභාවයට පත් වීම.
- බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන චතුර් වර්ණ අතරින් ක්ෂත්‍රිය වර්ණය ප්‍රමුඛත්වයට පැමිණීම.
- උපතින් පුද්ගලයෙකු උසස් හෝ පහත් තත්වයක් හිමිකර ගනී යන අදහසට ප්‍රතිපක්ෂව පුද්ගලයන්ගේ චර්යාව අනුව උසස් පහත් බව තීරණය වන බවට පිළිගැනීමක් ඇති වීම. එය බුදුන් වහන්සේ වසල සූත්‍රයේ දී දේශනා කොට ඇත.
- දාස, කම්මකාර යන පහළ මට්ටමේ ශ්‍රමිකයන්ට පවා යම් සමාජ පිළිගැනීමක් හිමි වීම.
- වෛශ්‍ය වර්ණයට අයත් **සෙට්ඨි** හෙවත් **සිටු සහ ගහපති** වැනි කණ්ඩායම් සමාජයේ වඩාත් කැපී පෙනෙන පිරිස් බවට පත් වීම. නිදසුන් වශයෙන් **අනේපිඬු සිටුතුමා, උපාලි ගෘහපතියා** වැනි අය දැක්විය හැක.
- පශ්චාත් වෛදික යුගයේ දී කාන්තාවන්ට එතෙක් හිමිව තිබූ අසතුටුදායක සමාජ තත්වය යටපත් වී වඩාත් උසස් තත්වයක් හා සමාජ පිළිගැනීමක් හිමිවීම.
- බුදුන් වහන්සේගේ අදහස් අනුව සමාජයේ සියලු ම පාර්ශ්වවලට ආගමික නිදහස ලැබීමේ ප්‍රවණතාවක් ඇති විය. විශේෂයෙන් ශුද්‍ර වංශික සුනීත, සෝපාක වැනි අයට පවා බුදුන් වහන්සේගේ ශාසනයට ඇතුළු වීමට අවස්ථාව ලැබිණි.

### 4.3.4 ආර්ථික තත්වය

- ❖ කෘෂි කර්මාන්තය දියුණුවීම
  - ❖ තිරිඟු හා වී ප්‍රධාන ආහාර භෝග ලෙස ව්‍යාප්ත වීම.
  - ❖ ප්‍රාදේශීය රාජ්‍යවල ප්‍රධානීන් පවා කෘෂිකර්මාන්තයට දායක වීම. (බෞද්ධ මූලාශ්‍රයවල වප් මගුල් උත්සව ගැන සඳහන් වේ.)
  - ❖ ගව පාලනය

- ❖ වාණිජ කටයුතු දියුණුවීම
  - ❖ භාණ්ඩ හුවමාරුව, කාසි භාවිතය වෙළෙඳ කටයුතුවල දී ප්‍රමුඛ විය. (ගැල් මගින් බඩු ප්‍රවාහනය කිරීම ගැන සඳහන් වේ)

- ❖ කර්මාන්ත දියුණුව
  - ❖ යකඩ භාවිතයෙන් කෘෂි උපකරණ යුද උපකරණ හා එදිනෙදා අවශ්‍යතාවලට යොදා ගත් උපකරණ ගම් මට්ටමෙන් නිපදවීම.
  - ❖ රෙදි විවීම, කුඹල් කර්මාන්තය, රන් ආභරණ තැනීම, වඩුවැඩ වැනි කර්මාන්ත බිහිවීම.

- ❖ බදු ක්‍රම
  - ❖ වගා කළ ඉඩම්වලින් ද කර්මාන්තවලින් ද පාලකයන් බදු ගැනීම. එම බදු ''බලි'' හා ''භාග'' නමින් හඳුන්වා ඇත.

### 4.3.5 ආගමික තොරතුරු

ඍග් වෛදික යුගයේ පැවති බහුදේවවාදය ඒකදේවවාදයක් කරා යොමු වුණු අතර පශ්චාත් වෛදික යුගයේ දී **අදේව වාදය** කරා යොමු විය.

බ්‍රාහ්මණ ඉගැන්වීම්වලට ප්‍රතිපක්ෂව නව ආගමික චින්තනයක් වර්ධනය වීම හා ජනප්‍රිය වීම.

ක්‍රි. පූ. හයවන සියවසේ දක්නට ලැබුණු ප්‍රධාන ලක්ෂණය වූයේ ජෛන ආගම සහ බුදුදහම පහළ වීම යි.

## ක්‍රියාකාරකම

1. බුදු සමයේ පහළ වීමට තුඩු දුන් කරුණු සාකච්ඡා කරන්න.



## 4.4 මගධ අධිරාජ්‍යයේ නැගීම

මේ පිළිබඳ බෞද්ධ, ජෛන හා හින්දු ග්‍රන්ථවලින් තොරතුරු සපයා ගත හැක. ඉන්දියාවේ මුල් ම අධිරාජ්‍යය ගොඩනැගෙන්නේ මගධය කේන්ද්‍ර කරගෙන ය. එයට බලපෑ සාධක කීපයකි.

1. ගංගා නම් නිම්නයේ මධ්‍යගත ව පිහිටීම
2. වෙළෙඳ මාර්ගවල මධ්‍යස්ථානයක් වීම.
3. ස්වාභාවික ආරක්ෂාව (ඉන්දු නිම්නයට වඩා)
4. මහා පද්මනන්ද - බිම්බිසාර හා අජාසත්ත වැනි පාලකයින්ගේ කටයුතු

### 4.4.1 සිසුනාග පෙළපත

මගධය අධිරාජ්‍යයක් බවට පත් වූයේ සිසුනාග, හර්යංක, නන්ද, මෞර්ය වැනි රාජවංශවල පාලකයින්ගේ කටයුතු නිසා ය. සිසුනාග වංශික බිම්බිසාර රජු විසින් මුලින් ම මගධ අධිරාජ්‍යයට අඩිතාලම දමන ලදි. එතුමා ඒ සඳහා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කළේ ය. ඒ අතර,

- ❖ අසල්වැසි රාජ්‍ය සමග විවාහ සම්බන්ධතා ගොඩනගා ගැනීම (කොසොල් රජුගේ සොහොයුරි ලිච්ඡවී රජ දියණිය හා විශාලාවේ වාසලී කුමරිය විවාහ කර ගැනීම)
- ❖ අංග ජනපදය යුද්ධයෙන් යටත් කර ගැනීම
- ❖ මිත්‍ර හෝ තානාපති සම්බන්ධතා ඇති කර ගැනීම (ගන්ධාරයේ පුක්කුසාති, අවන්තියේ පජ්ජෝත, රජු සමග පැවැත් වූ සබඳතා)
- ❖ මනා පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම

ප්‍රධාන තැනක් ගනී.

### 4.4.2 නන්ද පෙළපත

- ❖ වයඹ දිගින් පංජාබය දක්වා ද දකුණින් ඩෙකෑනය දක්වා ද මගධ අධිරාජ්‍යය ව්‍යාප්ත කිරීම.
- ❖ මගධ අධිරාජ්‍යය මහා ඇලෙක්සැන්ඩර්ගෙන් ආරක්ෂා කර ගැනීම. ඔහු ආර්ථිකය දියුණු කළ බැවින් ධනනන්ද නමින් ප්‍රසිද්ධ විය.

### 4.4.3 මෞර්ය පෙළපත

#### ➤ චන්ද්‍රගුප්ත රජු

- ❖ චාණක්‍ය (කෞටිල්‍ය හෙවත් විෂ්ණු ගුප්ත) ගේ උපදෙස් පරිදි නන්ද රාජ වංශය පරදා මගධය අල්ලා ගැනීම.
- ❖ අධිරාජ්‍යය ඉන්දියාවේ වයඹ දිග ඉන්දියාවෙන් ඔබ්බට තවදුරටත් ව්‍යාප්ත කිරීම.
- ❖ ඩෙකෑනය ද යටත් කර ගැනීම.
- ❖ ඔහු බටහිරින් පර්සියානු දේශසීමාව දක්වා ද නැගෙනහිරින් බෙංගාල බොක්ක දක්වා ද දකුණින් මයිසූරය දක්වා ද අධිරාජ්‍යය ව්‍යාප්ත කළේ ය.

#### ➤ බින්දුසාර රජු

- ❖ චන්ද්‍රගුප්ත රජුගේ පුතා වේ.
- ❖ අමිත්‍රඝාත හෙවත් සතුරු රජවරුන් නසන්නා ලෙස ඔහු හඳුන්වා ඇත.
- ❖ අධිරාජ්‍යය ස්ථාවරව පවත්වා ගත්තේය.
- ❖ මිසරය, ග්‍රීසිය යන රටවල් සමඟ තානාපති සබඳතා පැවැත්වීය.

#### ➤ අශෝක රජු

- ❖ අශෝක බින්දුසාර රජුගේ පුතා වේ.
- ❖ රාජ්‍යය ස්ථාවර කර ගැනීම සඳහා දරුණු ක්‍රියාමාර්ග ගෙන ගියේය.
- ❖ කාලිංගය අල්ලා ගැනීමෙන් මගධයේ ව්‍යාප්තිය උච්චතම අවස්ථාව කරා ගෙන ගියේය.
- ❖ දේශපාලන ජයග්‍රහණ සඳහා දරුණු ලෙස ක්‍රියා කළ නිසා චණ්ඩාශෝක නමින් ප්‍රකට විය.
- ❖ ධර්ම විජය ප්‍රතිපත්තිය අනුව ධර්ම රාජ්‍යය ගොඩනැගීම හේතුවෙන් ධර්මාශෝක නමින් අනතුරුව ප්‍රසිද්ධියට පත් වූයේ ය.

### 4.4.4 අශෝක අධිරාජයාගේ ධර්ම විජය ප්‍රතිපත්තිය

ධර්ම විජය ප්‍රතිපත්තිය යන්නෙහි තේරුම නම් ධර්මයෙන් රටවල් හා ජනයා දිනීම යි. ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග අතර පහත සඳහන් ඒවා වැදගත් වේ.

- ❖ නිග්‍රෝධ සාමණේරයන්ගෙන් බණ අසා බෞද්ධ වී ධර්මප්‍රචාරය සඳහා කටයුතු කිරීම
- ❖ ධර්ම මහාමාත්‍රවරුන් පත් කිරීම
- ❖ තුන්වන ධර්ම සංගායනාව පවත්වා සඟ සසුන සංශෝධනය කොට ධර්ම දූතයන් වහන්සේලා පිටත් කර හැරීමට අනුග්‍රහ දැක්වීම
- ❖ අවිහිංසා ධර්මය පැතිරවීම
- ❖ අශෝක ධර්මය ප්‍රචාරය කිරීම සඳහා සෙල්ලිපි මගින් පහත සඳහන් කරුණු ජනතාවට කියා දීම

- ➤ සතුන් මැරීමෙන් වළකින්න
- ➤ සතුන් මරා යාග නොකරන්න
- ➤ මව්පියන්ට වැඩිහිටියන්ට සලකන්න
- ➤ වැඩිහිටියන්ට, ගුරුවරුන්ට, මහණ බමුණන්ට සංග්‍රහ කරන්න, කීකරු වන්න
- ➤ ගස් සිටුවීම, ළිං හෑරීම සත් ක්‍රියාවකි
- ➤ සත්‍යවාදී වන්න, දයාව දක්වන්න, සිතින් ගතින් පිරිසිදු වන්න
- ➤ තම ආගම උසස් කොට සලකා අන්‍යයන්ගේ ආගම් පහත් කොට නොසලකන්න

සියලු රටවැසියන් තමාගේ දරුවන් ලෙස එතුමා සලකා තිබේ. ධර්ම ප්‍රචාරය සඳහා ධර්මමහාමාත්‍ර නම් විශේෂ නිලධාරි පිරිසක් ද පත් කර ඇත.

අශෝක ධර්මය ඇතැම් විචාරකයන් හඳුන්වා ඇත්තේ ආචාර ධර්ම පද්ධතියක් හැටියට ය. මේ සඳහා බුදු දහම මෙන් ම එවකට ඉන්දියාවේ පැවති ඉගැන්වීම්වල අඩංගු මූලික කරුණු ඇතුළත් කර ඇති බවක් පෙනේ.

### ක්‍රියාකාරකම්

1. චණ්ඩාශෝක ධර්මාශෝක වූ හැටි පැහැදිලි කරන්න
2. මගධ අධිරාජ්‍යය ගොඩනැගීමේ අවස්ථා තුනක් නම් කරන්න.



#### 4.4.5 මෞර්ය යුගයේ වාස්තුවිද්‍යාව හා කලාව

මෙගස්තිනීස්ගේ **ඉන්ඩිකා** නමැති ග්‍රන්ථයේ ද හියුං සාං හිමියන්ගේ දේශාටන විස්තරයේ ද මෞර්ය යුගයේ නගර හා මාලිගා පිළිබඳ විස්තර ඇත. මෙම නගර හා ගොඩනැගිලි බොහෝමයක් පිළිබඳව පුරාවිද්‍යාත්මක තොරතුරු ද අනාවරණය කර ගෙන ඇත. මේ අතර,

- ❖ පාටලීපුත්‍ර නගරයේ නටබුන්
- ❖ අශෝක ස්තම්භ හා සත්වරූප
- ❖ සාරානාත් හි තනිගලෙන් නෙළන ලද ගරාදි වැට
- ❖ බුද්ධගයාවේ කුලුනු හතරක් මත ඇති බෝධි මණ්ඩපය
- ❖ සාංචි ස්තූපය

වෙයි





රූපය 4.19 සාංචි ස්තූපය හා අශෝක ස්තම්භය

දිල්ලිය, අලහබාද්, රාම්පූර්, සංකස්ස, සාංචිය, සාරානාත්, රුම්මින්දෙයි, නිගලිසාගර් යන ප්‍රදේශවල ඇති ස්තම්භවල කලාත්මක ලෙස නිර්මාණය කරන ලද සිංහ, ඇත් ගව, අශ්ව වැනි සත්ව රූප ජීවමාන ස්වරූපයෙන් දක්වා ඇත. සාරානාත් ස්තම්භයේ ඇති සිංහ රූපය සහිත කුලුණු හිස ඉන්දියාවේ ජාතික සංකේතය ලෙස යොදා ගෙන තිබේ. ධර්ම චක්‍රය ද මෙවැනි කුලුණුවල දක්වා ඇත.

- **විහාර හා ස්තූප**

අශෝක විහාර 84, 000ක් කරවූ බව සඳහන් වේ. ඒ අතර සාංචියෙන් සොයාගෙන ඇති ස්තූප අශෝක කළ බවට පුරාවිද්‍යාත්මක සාධක ද ලැබී ඇත. සාංචියේ ඇති මහා ස්තූපය අඩි 54ක් උසින් ද අඩි 120ක විෂ්කම්භයකින් ද යුක්ත ය. මෙහි මුල් ස්වරූපය මීට වඩා කුඩා විය හැකි ය. එක මාලයක් මත අර්ධගෝලාකාර කොටසක් ද ඒ මත හර්මිකාවක් ද, (හතරැස් කොටුවක්) යෂ්ටියකින් හා ඡත්‍රයකින් ද සමන්විත වූ ස්මාරකයකි. බෞද්ධ ස්තූපයට නිශ්චිත ආකෘතියක් ස්ථාපිත කරන ලද්දේ අශෝක රජු විසින් ය.

■ ලෙන්



ඡායාරූපය අංක 4.20 අශෝක රජු විසින් තනන ලද ගුහා විහාරයක්. මෙය පිහිටා තිබෙන්නේ බිහාර් ප්‍රාන්තයට අයත් බර්බර් කන්දේ ය.

පිහිටි ගලෙහි ලෙන් කැණීම අශෝක යුගයට අයත් තවත් වැදගත් නිර්මාණයකි. බරාබර් ගිරි ශිඛරයෙහි හා නාගාර්ජුනී ගිරි ශිඛරයෙහි ලෙන් හතක් අශෝක යුගයේ හා පසුකාලීන අවස්ථාවල දී නිර්මාණය කොට ඇත. බරාබර්හි ඇති ලෙන් තුනක් අශෝක විසින් පූජා කළ බවට සෙල්ලිපි සාධක හමු වී ඇත.

■ මූර්ති

අශෝක යුගයට අයත් මූර්ති අතර මානව රූප කීපයක් පාටලීපුත්‍රයෙන් ද ලැබී ඇත. වැලිගලින් තැනූ පුරුෂ කවන්ධ රූපයක් හමු වී ඇති අතර එය නග්න රූපයක් නිසා දිගම්බර නිකායට අයත් ජෛන පූජකයකුගේ විය හැකිය. තව ද පාටලීපුත්‍රයට ආසන්න ගමකින් චාමරයක් අතින් ගත් ස්ත්‍රී රූපයක් හමු වී ඇත. මෙය ද මෞර්ය යුගයේ නිම වූ කෘතියක් වශයෙන් සැලකිය හැකිය. එම නගරයෙන් හමු වූ පුරුෂ රූප දෙක ද ඉතාම තාත්වික නිර්මාණ වේ. ප්‍රමාණයෙන් බෙහෙවින් විශාල මේ ප්‍රතිමා යක්ෂ රූප යැයි නිගමනය කොට ඇත.

➢ **මෞර්ය කලාවේ විශේෂ ලක්ෂණ හා පර්සියානු හා ග්‍රීක ආභාසය**

මෞර්ය යුගයේ කලාකෘතිවල දක්නට ලැබෙන කැපී පෙනෙන ලක්ෂණ කීපයක් නම් නාගරික බව, ශිෂ්ටත්වය, ත්‍රිමාණ බව, විශාලවීම, කැඩපතක් මෙන් ඔපමට්ටම් වීම.

මෞර්ය කලාවෙහි පර්සියානු හා ග්‍රීක යන බලපෑම් දක්නට ලැබේ. මෞර්ය රාජ සභාවේ මෙගස්තිනිස් වැනි ග්‍රීක තානාපතිවරුන් සේවය කර තිබේ. චන්ද්‍රගුප්ත, ග්‍රීක සෙලියුකස්නිකේටගේ දියණිය විවාහ කර ගත්තේය. එනිසා මෞර්ය රාජ සභාවේ ග්‍රීක බලපෑම් පවතින්නට ඇත. එය හඳුනා ගැනීමට ඇති එක් සාධකයකි, ටෙරාකොටා පලසක සිංහ හමක් සහිත ඇලෙක්සැන්ඩර්ගේ හිසේ රූපයක් හා ග්‍රීක මෝස්තර රටාවක් ද දක්වා තිබීම.

## ක්‍රියාකාරකම්

1. මෞර්ය කලාවේ විශේෂ ලක්ෂණ හඳුනාගෙන ලියන්න.
2. මෞර්ය කලාවේ විදේශීය ආභාස මොනවාද? නිදසුන් සහිතව පැහැදිලි කරන්න.



### 4.4.6 මෞර්ය අධිරාජ්‍යයේ පරිහානියට හා බිඳ වැටීමට බලපෑ හේතු

මෞර්ය අධිරාජ්‍යයේ පරිහානිය හා බිඳ වැටීමට බලපාන ලද හේතු සාධක ගණනාවක් වේ.

- ❖ අශෝකගෙන් පසු අධිරාජ්‍යයේ සංකේන්ද්‍රගත පාලන තන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට තරම් දක්ෂ පාලකයන් බිහි නොවීම.
- ❖ රාජ්‍ය පරිපාලනය දුර්වලවීම හා ප්‍රාදේශීය පාලනය මධ්‍ය පාලනයෙන් ගිලිහී යාම.
- ❖ අශෝකගෙන් පසු බලයට පත් පාලකයන් මෙන් ම පාලන තන්ත්‍රයේ පැවති විවිධ අංග ද දුර්වල වීම නිසා ප්‍රාදේශීය පාලකයන් ස්වාධීනත්වයට පත් වීම.

  උදා - කාලිංගය ඛාරවේල යටතේ ස්වාධීන ශක්තිමත් රාජ්‍යක් බවට පත් වීම.
- ❖ ඔටුන්නට හිමිකම් ඇති අශෝකගේ දරු මුණුබුරන් ස්වාධීන රාජ්‍ය පිහිටුවා ගැනීම.

  උදා - කාශ්මීරය, ගන්ධාරය
- ❖ අශෝක කාලිංග යුද්ධයෙන් පසු අවිහිංසාවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළ නිසා

හමුදාව අකර්මණ්‍ය වීම

- ❖ අශෝක සියලු ආගම් සම්බන්ධව සහනශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කළත්, ඔහුගෙන් පසු පාලකයින් එවැනි ප්‍රතිපත්ති ක්‍රියාත්මක නොකිරීම
- ❖ බ්‍රාහ්මණ ආගමට සැලකිල්ලක් නොදැක්වීම නිසා බ්‍රාහ්මණ වංශිකයින් රාජ්‍ය විරෝධී කැරලි කෝලාහල පවා ඇති කිරීම
- ❖ අවසාන මෞර්ය වංශිකයා වූ බෘහද්රථ ඝාතනය කර පුෂ්‍යමිත්‍ර ශුංග නම් බ්‍රාහ්මණ වංශිකයෙකු බලයට පත් විය. අනතුරුව ඛාන්වා නම් බ්‍රාහ්මණ වංශයක් පාඨලී පුත්‍රයේ බලයට පත් විය.
- ❖ ආර්ථික පරිහානියක් ඇති වීම ද මෞර්ය අධිරාජ්‍යයේ පරිහානියට බලපා ඇත..

## ක්‍රියාකාරකම්

1. මෞර්ය යුගයේ පරිහාණියට හා බිඳ වැටීමට තුඩු දුන් හේතු පහක් විස්තර කරන්න.
2. ග්‍රීක, රෝම, මෞර්ය යන ශිෂ්ටාචාරවල කලාකෘති ඇතුළත් පොතක් සකස් කරන්න.



### අභ්‍යාසය

1. මෞර්ය යුගයේ ආරම්භක පාලකයා නම් කරන්න.
2. චන්ද්‍රගුප්ත මෞර්ය රජුගේ උපදේශකයා නම් කරන්න.
3. අශෝක රජු සිදු කළ දරුණු යුද්ධය කුමක් ද
4. අන්තිම මෞර්ය පාලකයා කවුද? ඉන්පසු බලයට පත් වූ රාජවංශය නම් කරන්න.
5. අශෝක බුදු දහමට නැඹුරු වීමට හේතු වූ කරුණු 3ක් ලියන්න.
6. මෞර්ය යුගයේ බුදු දහම ප්‍රචාරය කළ රටවල් දෙකක් නම් කරන්න.
7. මෞර්ය යුගයේ වැදගත් කලාකෘති දෙකක් නම් කරන්න.
8. මෞර්ය යුගයේදී රාජ්‍යයන් කොපමණ ප්‍රමාණයක බුදු දහම ව්‍යාප්ත වූවාදැයි සඳහන් කරන්න.
9. ඉන්දියාවේ රාජ්‍ය ලාංඡනය වශයෙන් තෝරා ගෙන ඇත්තේ කුමක් ද?.
10. අශෝක ශිලා ලේඛන මගින් උගන්වන කරුණු 03ක් නම් කරන්න.

# 05

# අග්නිදිග ආසියාවේ හා ඈත පෙරදිග රටවල බෞද්ධ සංස්කෘතිය




### හැඳින්වීම

අග්නිදිග ආසියාවේ සහ ඈත පෙරදිග රටවල බෞද්ධ සංස්කෘතිය මේ පාඩමෙන් ඉගැන්වේ. මියන්මාරය (බුරුමය) තායිලන්තය (සියම) කාම්බෝජය ලාඕසය, ඉන්දුනීසියාව අග්නිදිග ආසියාවට අයත් වෙයි. ඈත පෙරදිග රටවලට චීනය, කොරියාව හා ජපානය යන රටවල් ඇතුළත් වෙයි. පසුගිය පාඩමේ දී ඔබ අධ්‍යයනය කර ඇති බැවින් මෙහිදී ලංකාවේ සහ ඉන්දියාවේ බෞද්ධ සංස්කෘතිය හැදෑරීමක් නොකෙරේ.

## 5.1 බුරුමයේ ථෙරවාදී බෞද්ධ සංස්කෘතිය

### ⅄ පිහිටීම

ඉන්දියන් සාගරයට මුහුණලා වර්තමාන ඇසෑමයට යාබදව නැගෙනහිර තායිලන්තය මායිම් කොට පිහිටි දේශය බුරුමය නැත්නම් මියන්මාරය ලෙස හඳුන්වයි.




**සිතියම 5.1 අග්නිදිග ආසියාව හා ඈත පෙරදිග රටවල්**
**උපුටා ගැනීම 7 ශ්‍රේණිය භූගෝල විද්‍යාව පෙළපොත ඇසුරෙනි**

### 5.1.1 බුරුමයට බුදුසමය පැමිණීම

අශෝක ධර්මදූත ව්‍යාපාරයට අයත් වූ සෝණ රට්ඨ හෙවත් සුවණ්ණ භූමිය බුරුමය (මියන්මාරය) ලෙස අනුමාන කරනු ලැබේ.

ක්‍රි. ව. පස් වන සියවස වනවිට බුරුමයේ ප්‍රධාන ජන වර්ග දෙකක් විය. ඉන් එක් වර්ගයක් නම් ටිබැට් ජාතික පරපුරකින් පැවත එන ''පියු'' ජනයා ය. අනෙක් කොටස මොන් (තලයි) නම් වේ.

පස්වන සියවසට අයත් රන්තැටිවල කොටා ඇති දකුණු ඉන්දියානු අක්ෂර අනුව පියු ජනයා එම වකවානුවේ දී ථේරවාදී බුදු සමයට හුරු පුරුදු වී සිටි බව ඉතිහාසඥයෝ විශ්වාස කරති.

දකුණු ඉන්දියාවේ මදුරාසිය අසල පැරණි කාංචිපුරය පරිශ්‍රයේ ධර්මපාල අටුවාචාරීන් යටතේ ථේරවාදී බුදුසමයේ උද්දීප්තියක් ඇතිව තිබිණ. බුරුමයේ පියු ජනයා පස්වන හා හයවන සියවස්වල හුරු පුරුදු වී සිටි ථේරවාදී බුදුසසුන් පිළිවෙත්වලට කාංචිපුරයෙන් ආභාසය ලැබෙන්නට ඇතැයි ද විශ්වාස කෙරේ.

මොන් ජනයා දකුණු බුරුමයේ ථාථොන් නගරයේ ද පසුව පේගු නගරය ආශ්‍රිතව ද වාසය කළහ. මේ ප්‍රදේශය රාමඤ්ඤ දේශය නමින් ප්‍රකට විය. මෙහි වාසය කළ මොන් ජනයා මධ්‍යම සියමේ ලොප්පුරි බෞද්ධ විහාරය හා සම්බන්ධතා පැවැත්වූ බව පස්වන සියවසට අයත් පල්ලවාක්ෂරවලින් ලියවුණු සෙල්ලිපියකට අනුව විශ්වාස කෙරේ.

මධ්‍යම ඉන්දියාවේ ව්‍යාප්තව පැවති මහායාන බුදුසමයේ බලවේග පස් වන සියවස තරමේ සිට බුරුමයට පිවිසෙමින් තිබිණ. මේ අනුව ආරම්භයේ සිට එකොළොස්වන සියවස දක්වා බුරුමයේ ශාසන ඉතිහාසය ගොඩනැගෙන්නේ අනුමාන වශයෙනි.

### 5.1.2 බුරුම ථේරවාදී බුදු දහමේ ප්‍රබෝධය

ඉහළ බුරුමය හා පහළ බුරුමය එක්කොට පාගාන් අගනුවර සිට පාලනය ගෙන ගිය අනුරුද්ධ (අනවරථ) රජු බුරුමයේ ථේරවාද බුදු දහමේ පුනරුදය සඳහා කටයුතු කළේය. ඔහු සුප්‍රකට ස්වේදගොන් චෛත්‍යය ගොඩනගන ලද පාලකයා වේ.

1059 ආරම්භ කළ එම චෛත්‍ය නිර්මාණය 1077 දී ඔහු මිය යන තෙක් ම නිම කළ නොහැකි විය. එහි බුදුන් වහන්සේගේ අකු ධාතුව, ලලාට ධාතුව හා දන්ත ධාතුව නිධන් කොට ඇතැයි විශ්වාස කරනු ලැබේ. තව ද එහි, වංශකථාවල සඳහන් සාම්ප්‍රදායික දේවතාවන් තිස්හත් දෙනාගේ ම ප්‍රතිමා ඉදි කොට ඇත.



රූපය 5.1 ස්වේදගොන් චෛත්‍යය

අනවරථ රජතුමාගේ අනුප්‍රාප්තිකයා ලෙස ඔහු දෙවන පුත් ක්‍යාන්සිත්ථ 1084 දී රාජ්‍යයට පත් විය. ඔහු ද බුරුමයේ ථේරවාදී බුද්දහම පුනරුදය සඳහා කටයුතු කළේය. 1090 දී මෙම රජු සුප්‍රකට ආනන්ද විහාරය ඉදි කළේය. ෂින් අරහත් තෙරුන්ගේ හා ක්‍යාන්සිත්ථ රජුගේ ද මූර්ති දෙකක් මෙම විහාරයෙහි තිබේ.

දීප්තිමත් සුධාලේපනයෙන් හා රන් කොතින් විරාජමාන ආනන්ද විහාරය පාගාන් නගරයේ විස්මය ජනක පූජනීය ස්මාරකයක් ලෙස බහුමානයට පාත්‍ර වී තිබේ. ජාතක කථා නිරූපිත පුවරු එක්දහස් පන්සියයක් හා බුද්ධ චරිතයේ විවිධ අවස්ථා නිරූපිත මූර්ති අසූවක් ද විහාරයේ බිත්ති කුහරවල පටු ගමන් පථයන් හි දක්නට ලැබේ. ක්‍යාන්සිත්ථ රජුගේ මව ඉන්දීය කාන්තාවක් බවට පවතින එක් මතයකුත් සිංහල කාන්තාවක බවට පිළිගැනෙන තවත් මතයකුත් පවතින හෙයින් මෙකී නිර්මාණයට ඉන්දීය මෙන් ම ලාංකීය චිත්‍ර මූර්ති කලාවේ ආභාසය ලැබෙන්නට ඇති බව කලා විචාරකයෝ පවසති.



රූපය 5.2 ආනන්ද විහාරය

### 5.1.3 බුරුමය හා ලංකාව අතර පැවති සබඳතා

එකොළොස් වන සියවසේ සිදු වූ චෝළ ආක්‍රමණ සමයේ ත්‍රිපිටක ධර්ම රැගෙන ආරක්ෂාව පතා රාමඤ්ඤ දේශයට වැඩම කළ මෙරට මහ තෙරවරුන් ථාථොන් අගනුවර නැවතී සිටි බව බුරුම වංසකථාවලින් අනාවරණය වේ. මේ අනුව පාගාන්හි ථේරවාදී බුදු දහමේ උද්දීපනයට ලාංකීය ශාසනික සබඳතා ඉවහල් වන්නට ඇත. අනවරථ රජු ථාථොන් ආක්‍රමණවලින් පසු සිංහල භික්ෂූන් වහන්සේලා පාගාන් නුවරට වැඩමවාගෙන ගිය නිසා එහි පැවති මහායානවාදය පසු බැස ථේරවාදී සසුන තහවුරු විය.

1070 දී චෝළ ආධිපත්‍යයෙන් රජරට නිදහස් කොට පළමුවන විජයබාහු පොළොන්නරුවේ රජ විය. එකල විනය කර්මය සඳහා අවශ්‍ය ගණ පූරණය දිවයිනෙන් සොයා ගැනීමට නොහැකි වූ නිසා රජතුමා බුරුම රජු වෙත දූතයන් යවා භික්ෂූන් හා ත්‍රිපිටකය වැඩමවා ගත් බව වංසකතාවලින් මෙන් ම වේළෛක්කාර දෙමළ සෙල්ලිපියෙන් ද හෙළි වෙයි. මේ අවස්ථාවේ කැඳවාගෙන එන ලද්දේ මෙරටින් බුරුමයට වැඩම කොට සිටි මහතෙරුන් වහන්සේලාගේ ශිෂ්‍යයන් විය හැකි බව ඉතිහාසඥයෝ පිළිගනිති. බුරුම ලාංකීය සබඳතා වැඩි දියුණු කිරීමට සිංහල භික්ෂූන් වහන්සේලා නිසැකව ම දායක වන්නට ඇත.

පළමුවන විජයබාහු රජතුමාගේ සමයේ බුරුමය සහ මෙරට අතර පැවති වාණිජ හා සංස්කෘතික සබඳතා බිඳ වැටෙන ලෙස පසුව ක්‍රියා කළ බව මහාවංසයේ පහත සඳහන් කරුණු වලින් හෙළි වේ.

- ❖ මෙරටින් ගිය වෙළඳුන්ට තහනම් නීති පැනවීම
- ❖ සංස්කෘතික නියෝජිතයන්ට හිරිහැර කිරීම
- ❖ කාම්බෝජයට යවන ලද සිංහල කුමාරිකාවක් පැහැර ගැනීම

එයට ප්‍රතික්‍රියා දැක්වූ මහා පරාක්‍රමබාහු රජතුමා බුරුමය ආක්‍රමණය කළ බවත් ඒ සඳහා දමිළ අධිකාරී ආදිත්‍ය හා කිත්නුවරගල් සෙන්පති ඇතුළු හමුදාවක් යෙද වූ බවත් දැක්වේ. මෙකී ගැටුම සිංහල භික්ෂූන්ගේ මැදිහත්වීම මත සමථයකට පත් වූ බව එම රජතුමාගේ දොළොස් වන වසරේ දෙවනගල සෙල්ලිපියෙන් හෙළිවෙයි.

මහා පරාක්‍රමබාහු රජතුමාගේ අනුග්‍රහයෙන් සිදු වූ සංඝ සාමග්‍රිය හා ත්‍රිපිටක අටුවාවලට ටීකා ලිවීම ආදී ශාසනාභිවෘද්ධි ක්‍රියාමාර්ග ගැන තොරතුරු දැනගත් ප්‍රකට බුරුම භික්ෂූන් මෙරට බුදු සමය හැදෑරීමට දිවයිනට පැමිණ තිබේ. බුරුම රාජගුරු

පදවිය හෙබ වූ පන්ථගු මහා ස්ථවිරයන් වහන්සේ 1167 දී වැඩමවා ශාසන පිළිවෙත් හදාරා ආපසු වැඩම කොට ඇත. ඉන්පසු උත්තරජීව හිමි ඡප්පට නම් භික්ෂූන් වහන්සේ සමඟ පැමිණ දස වසරක් ශාසන පිළිවෙත් හදාරා පෙරළා බුරුමයට වැඩම කර ඇත.

පෙරළා බුරුමයට වැඩම කළ ඡප්පට තෙරුන් සීහල සංඝ භික්ෂු නිකායක් ආරම්භ කර ඇත. ඒ වන විට බුරුමයේ පැවතියේ ෂින් අරහං තෙරුන්ගෙන් පැවත ආ මොන් භික්ෂු නිකාය වේ. 1173 - 1210 අතර රජ කළ නරපති සිථු රජුගේ කාලයේ සීහල භික්ෂු නිකාය ලංකාව සමග නිරන්තර සබඳතා පවත්වා ඇත.

හයවන පරාක්‍රමබාහු සමයේ 1424 බුරුම භික්ෂූන් හය නමක් සිංහල උපසම්පදාව සඳහා පැමිණ ඇත. මේ වසරේ ම සියම් හා කාම්බෝජ භික්ෂූන් වහන්සේලා තිස්තුන් නමක් තත්කාලීන සංඝරාජ ධුරය දරූ වනරතන මාහිමියන් ප්‍රමුඛ මහ තෙරවරුන්ගෙන් උපසම්පදාව ලැබූහ.

1450 වසරේ රාමඤ්ඤ දේශයේ මත්තිම නගරයේ සෝවසුවණ්ණසෝභණ තෙරුන් වහන්සේ ප්‍රමුඛ භික්ෂු පිරිසක් මෙරටට පැමිණ කැලණි ගඟේ ඉදි කළ උදකුක්ඛේප සීමා මාලකයේ දී උපසම්පදාව ලැබූහ. මෙහිදී කර්මවාගාචාර්ය තනතුර දැරුවේ විජයබා පරිවේණාධිපති රාහුල ස්ථවිරයන් වහන්සේ ය. මෙලෙස උපසම්පදාව ලත් බුරුම භික්ෂූන් වහන්සේලා ආපසු වැඩමවා සිංහල ශාසන සම්ප්‍රදාය නවීකරණය කෙරිණි.

1474 බුරුමයේ ධම්මචේතිය රජ බුරුමයේ මහාවිහාර උපසම්පදාව තහවුරු කරනු සඳහා භික්ෂූන් ඇතුළු පිරිසක් මෙරටට එවී ය. එකී පිරිසට වීදාගම මෛත්‍රිය මහාස්ථවිරයන් ප්‍රමුඛ සංඝ සභාවක් විසින් උපසම්පදාව ලබා දෙන ලදි. එවකට මෙරට පාලකයා ව සිටි හයවන බුවනෙකබාහු රජතුමා බුරුම භික්ෂූන්ට පරාක්‍රමබාහු සාමි, සිරි වනරතන සාමි ආදී සිංහල නම් පිරිනැමූ බව කියවේ. මේ ආදී වශයෙන් බුරුමයෙන් වරින්වර මෙරටට වැඩම කළ භික්ෂූන් වහන්සේ උපසම්පදාව ත්‍රිපිටක ධර්ම කොටස් රැගෙන ගොස් ඇති කළ ශාසනික දියුණුව පිළිබඳ දීර්ඝ විස්තරයක් ධම්මචේතිය රජතුමා පිහිටුවා ඇති කල්‍යාණි ශිලාලේඛනයේ සටහන්ව තිබේ.

පෘතුගීසි ආක්‍රමණ හේතුවෙන් දහසයවන සියවසෙන් පසු මෙරට බුදු දහම පරිහාණියට පත් වුව ද පිරිසිදු බුදු දහම පවතින එකම රට ලෙස ලංකාව සලකන බුරුම ජාතිකයෝ, ලංකාවට වන්දනාමාන ආදිය සඳහා පැමිණෙති. මෙරට ශාසනික උපසම්පදාවේ ඇති වූ පරිහාණි තත්වය නිසා මහාවිහාර උපසම්පදාව නැවත ලබා ගනු සඳහා බුරුමයේ රාමඤ්ඤ දේශයට හා අමරපුර දේශයට වරින් වරදූතයන් පිටත් කර හැරීමට ලාංකීය භික්ෂූන් වහන්සේලාට සිදු විය.

## ක්‍රියාකාරකම

බුරුම-ලංකා සබඳතා පාඩම ඇසුරින් පහත සඳහන් සිවු සටහන් ජර්නලය සම්පූර්ණ කරන්න.

| ලක්දිව රාජධානි සමය (යුගය) | ලංකාවේ රජතුමා | බුරුමයේ රජතුමා | සබඳතා වල ස්වරූපය |
|---|---|---|---|
| | | | |

## 5.2 තායිලන්තයේ (සියමයේ) ථෙරවාදී බෞද්ධ සංස්කෘතිය

### ➢ පිහිටීම

බටහිරින් බුරුමය ද, ඊසාන දෙසින් ලාඕසය ද නැගෙනහිරින් කාම්බෝජය ද දකුණින් මලය අර්ධද්වීපයේ දකුණු කොටස හා සියම බොක්ක ද මායිම් කොට පවත්නා තායිලන්තය අග්නිදිග ආසියාවේ විශාල ම දේශය යි.

අතීතයේ සිට ක්‍රි. ව. 1939 වන තෙක් සියම් දේශය ලෙස හැඳින්වූ තායිලන්තය ඈත අතීතයේ සිට මේ දක්වා අග්නිදිග ආසියාවේ පවත්නා විශාල ම බෞද්ධ රාජ්‍යය ලෙස හැඳින්විය හැකිය. දහඅටවන සියවස මැද භාගය වන විට මෙරට උපසම්පදාව අභාවයට ගොස් බුදු සසුන පිරිහී පවතිද්දී වැලිවිට සරණංකර මාහිමියන්ගේ අප්‍රතිහත ධෛර්යය නිසා කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ අනුග්‍රහයෙන් මෙරට උපසම්පදාව යළි පිහිටවනු සඳහා උපාලි මහා ස්ථවිරයන් වහන්සේ ප්‍රමුඛ කණ්ඩායමක් ගෙන්වා ගනු ලැබුවේ සියම් දේශයෙනි. එහෙයින් තායිලන්තය ශාසනික වශයෙන් ශ්‍රී ලංකාවට බෙහෙවින් සමීප රටක් වේ.

**තායිලන්තයේ පැරණි බෞද්ධ නගර**

- ❖ පැරණි ප්‍රාචීන් පුරි
- ❖ ෆිස්නුලෝක (විෂ්ණු ලෝකය)
- ❖ සුපන්පුරි (ස්වර්ණ පුරය)
- ❖ සුබෝතායි (සුඛෝදය)
- ❖ නබොම් පතොම් (ප්‍රථම නගරය)
- ❖ ලොප්පුරි (ලාවාපුර)

තායිලන්තයේ වාර්තාගත නිශ්චිත ඉතිහාසය ඇරඹෙන්නේ දහතුන්වන සියවසේ අග භාගයේ සිට ය. එහෙත් හත්වන සියවස සිට එකොළොස් වන සියවස තෙක් කාලය තුළ ද්වාරවතී නමින් ශිෂ්ටාචාරයක් මධ්‍යම තායිලන්තයේ පැවති බව ඉතිහාසඥයින් පිළිගෙන තිබේ.

### 5.2.1 ද්වාරවතී ශිෂ්ටාචාරය

තායිලන්තයේ නැගෙනහිර හා ඊසාන දිග ප්‍රදේශවලින් පල්ලව ග්‍රන්ථාක්ෂරයෙන් ලියවුණු සෙල්ලිපි හමු වී ඇත. ඒවායේ බුදු සිරිතේ ඇතැම් අවස්ථා හා ජාතක කථා මූර්තිමත් කර ඇත. මෙබඳු සෙල්ලිපි බොහොමයක 'යෙ ධම්මා හේතුප්පභවා' යන බෞද්ධ පාඨය සඳහන් වී තිබේ. හත්වන සියවසේ විසූ හියුංසාං සඳහන් කරන පරිදි තෙලොපතිහි බුදු දහම පැවති බව කියවේ. මෙහි තෙලොපති යන්න ද්වාරවතීහි චීන රූපය යි. මේ සාධක අනුව ද්වාරවතී ශිෂ්ටාච-ාරයේ බුදුදහම ද ව්‍යාප්තව තිබෙන්නට ඇත. මේ බුදුදහම අනෙකක් නොව ථෙරවාදයයි.

ද්වාරවතී ශිෂ්ටාචාරයෙන් හමු වූ ලෝහමය හිටි බුදු පිළිම ලංකාවේ අනුරාධපුර බුදු පිළිමවලට සමාන විය. මේ ලක්ෂණ ඉන්දියාවේ අමරාවතී පිළිමවල ද ඇත. මේ නිසා ලංකාවේ හා ඉන්දියාවේ ආභාසයෙන් මෙම පිළිම නෙලා ඇතැයි විචාරකයෝ හඳුන්වති.

විශේෂයෙන් මේ කාලය තුළ ද්වාරවතීය හා අනුරාධපුරය අතර සබඳතා පැවති නිසා වැඩි ආභාසයක් අනුරාධපුරයෙන් ලැබෙන්නට ඇත. එසේම ලංකාවේ කුඩා බුදු පිළිම ද්වාරවතීයට ගෙන ගොස් ඇති බවත් සැලකේ.

ලක්දිව පැවති ශ්‍රී මහා බෝධි වන්දනාව ද ශ්‍රී පාද වන්දනාවද හත්වන සියවස තරමේ සිට පාචීන්පූරි විහාරයේ තිබුණි. මෙම ශ්‍රී මහා බෝධිය දොන්සිමාබෝධි අඩවිය ලෙස හැඳින්වේ. එසේ ම ලංකාවේ සංග්‍රහ කරන ලද ත්‍රිපිටක හා අටුවා ග්‍රන්ථ එකල එහි භාවිත විය.

පාචීන්පූරි විහාරයේ හත්වන සියවසට අයත් ශිලා ලේඛනයක ලංකාවේ ලියන ලද තේලකටාහ ගාථා නම් පාලි කාව්‍යයේ ප්‍රථම ගාථා තුන සඳහන් වේ. මේවා සිංහල භික්ෂූන් වහන්සේලා තායිලන්තයට රැගෙන යන්නට ඇත. දෙරට අතර තිබූ සම්බන්ධතා මෙයින් තවදුරටත් තහවුරු වේ.

මෙතෙක් සඳහන් කරන ලද කරුණු අනුව හත්වන සියවසේ සිට යටත් පිරිසෙන් එකොළොස්වන සියවස තෙක් මධ්‍යම සියමයේ පැවති ද්වාරවතී ශිෂ්ටාචාරය සමග අනුරාධපුර යුගයේ ආගමික හා සංස්කෘතික සබඳතා පැවති බව නිගමනය කළ හැකි ය.

මධ්‍යම සියමේ හා දකුණු සියමේ ද්වාරවතී ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසු විශාල ප්‍රදේශයක් කාම්බෝජයට යටත් වුණි. එසේ යටත් කරගනු ලැබුවේ හත්වන විජයවර්මන් රජතුමා ය. එම ආධිපත්‍යය පැවති අවධියට අයත් සෙල්ලිපි හා බෞද්ධ නටබුන් රැසක් ඒ අතර වේ.

මෙසේ එකළොස්වන සියවසත් දහතුන්වන සියවසත් අතර කාම්බෝජ අධිරාජ්‍ය බලය ව්‍යාප්තව පැවති මධ්‍යම තායිලන්තය ද එකල කාම්බෝජ නමින් හැඳින්වුණ බව එම ප්‍රදේශවලින් හමු වූ සෙල්ලිපි හා වංසවාතාර නමින් හැඳින්වෙන තායි වංසකථාවෙන් හෙළි වෙයි.

### ක්‍රියාකාරකම

ක්‍රි. ව. හත්වන සියවසේ සිට දොළොස් වන සියවස දක්වා කාලය තුළ තායිලන්තය හා අනුරාධපුර අතර ආගමික වශයෙන් පැවති සමානතා ගැන බිත්ති පුවත්පතකට ලිපියක් සකසන්න



### 5.2.2 සියම සමඟ පැවති ලාංකීය සබඳතා

ලාංකික වංසකථාකරුවන් පොළොන්නරු යුගයේ දී කාම්බෝජය නමින් හඳුන්වා ඇත්තේ අංකෝරය අගනුවර කරගත් නැගෙනහිර කාම්බෝජය නොව කාම්බෝජ පාලනයට නතුව පැවති මධ්‍යම සියම යැයි සිතන්නට කරුණු තිබේ.

මහා පරාක්‍රමබාහු රජතුමා කන්‍යාවක් යැවූවේ මධ්‍යම සියමේ සිටි මේ කාම්බෝජ පාලකයා වෙත යැයි සිතිය හැකිය.

නිශ්ශංකමල්ල තම සෙල්ලිපියක තමා මහා පරාක්‍රමබාහු රජතුමාගේ බෑණනුවන් බව ද රජතුමා සිංහපුරයට හසුන්පත් යවා තමා මෙරටට ගෙන්වා රජකමට පුහුණු කර වූ බව ද සඳහන් කරයි. මෙහි සඳහන් සිංහපුරය මධ්‍යම සියමේ පිහිටි මුවංසිං යන ස්ථානය විය හැකි බවට අනුමානයක් පවතී.

නිශ්ශංකමල්ල රජතුමා සිය සෙල්ලිපි කිහිපයක කාම්බෝජවාසීන් සඳහා වෙන් කළ වීථියක් ගැන සඳහන් කර තිබේ.

දහතුන් වන සියවසේ මැද භාගයේ ඉන්ද්‍රදිත්‍ය රජු කාම්බෝජ පාලකයින් පලවා හැර ප්‍රථම තායි රාජ්‍යය ඇරඹී ය. එහි අගනුවර සුඛෝතායි වේ. එතැන් සිට ලංකා සියම් සබඳතා අඛණ්ඩ ව පැවතුණි. තායිලන්තයේ සිරි ධම්ම නගරයට අසිරිමත් බුදු පිළිමයක් වැඩමවා ගැනීම. ඒ සඳහා උදාහරණයක් ලෙස,

හේමමාලා සහ දන්ත කුමරු දළදාව ගෙන එන අතර තායිලන්තයේ සිරිධම්ම නගරයේ නැවතී සිටි බවට මතයක් තිබේ.

මෙරට දළදා වහන්සේ යම් පාලකයකු සතුව පවතී ද ඔහු සිහසුන සතුය යන විශ්වාසය පැතිර තිබූ ආකාරයට ම සිංහල බුදු පිළිමය යම් පාලකයෙකු සතු ද ඔහු සියමේ අගරජ වෙතියි විශ්වාසයක් පැතිර තිබිණි. මෙකී බුදු පිළිමය වර්තමාන තායිලන්තයේ අගනුවර වූ බැංකොක් නුවර කෞතුකාගාරයේ තැන්පත් කොට තිබේ. වසරකට වරක් අප්‍රේල් මස 14 වන දින එය ප්‍රදර්ශනය කිරීමට කටයුතු යොදා තිබේ.

මේ පිළිමය පිළිබඳ කතා පුවත හා සැසඳෙන තොරතුරු හත්ථවනගල්ල විහාර වංසයේ, පූජාවලියේ හා මහාවංසයේ සඳහන් වේ. දඹදෙණියේ දෙවන පරාක්‍රමබාහු සමයේ (1236-1271) තාම්‍රලිංග දේශයේ සිට පැමිණි ජාවක චන්ද්‍රභානු, සිරිධම්ම රජු අසිරිමත් බුදු පිළිමය ලබාගනු වස් ලංකාවට එවූ දූතයා විය හැකි බව ඉතිහාසඥයින් නිගමනය කොට ඇත. තාම්‍රලිංග ධම්මකිත්ති නම් මහ තෙරනමක පිඬු සිඟා වඩිනා කල පෙරමග පියුම් පැන නැංගයි අසා පරාක්‍රමබාහු රජතුමා දහම් පඬුරු හා රජ පඬුරු යවා උන්වහන්සේ මෙහි වඩමවා උන්වහන්සේ යටතේ පලාබද්දල සුවිශේෂී වනවාසී භික්ෂු පුහුණු මධ්‍යස්ථානයක් පිහිට වූ බව පූජාවලියේ හා මහාවංසයේ සඳහන් වෙයි. මේ සාධක අනුව ධම්මකිත්ති මහතෙරුන් වහන්සේ වෙනුවට දෙවන පරාක්‍රමබාහු රජතුමා අසිරිමත් බුදු පිළිමය දෙන්නට ඇතැයි සිතිය හැකිය.

13 වන සියවස අගභාගයේ සුඛෝදයේ පාලකයා වූ රාම්කම්හෙං රජ දවස පිහිටු සෙල්ලිපියක් ඇත. එයට අනුව ලංකාවෙන් සිරිධම්මපුරයට වැඩම කළ සිංහල මහාසාමි සංඝරාජ කෙනෙකු සුඛෝදයට වැඩමවා සිංහල බුදු සමය පැතිරවීය. එතැන් සිට සියමේ සීහලසංඝ ශාසනය නමින් භික්ෂු නිකායක් ඇති විය.

සුඛෝදය රජ පවුලට අයත් භික්ෂූන් වහන්සේ නමක් 1351 දී ලංකාවට පැමිණ දස වසරක් ගම්පොළ නැවතී සිට මහියංගණය විහාරයේ ප්‍රතිසංස්කරණ කටයුතුවල නියැලී අනුරාධපුර පොළොන්නරු සිද්ධස්ථාන දැක බලාගෙන පෙරළා සුඛෝදයට ගොස් තමා ගත කළ ජීවිතය පිළිබඳ තොරතුරු ඇතුළත් කොට දීර්ඝ සෙල්ලිපියක් පිහිටුවා ඇත. එතුමා ලංකාවේ දී කළ පුණ්‍ය ක්‍රියා කෙරෙහි පැහැදුණු ලාංකික ජනයා එතුමාට බෝධිසත්වවරයෙකු ලෙස සැලකූ බව එම ලිපියෙහි සඳහන් වෙයි. සෙල්ලිපියට අනුව උන්වහන්සේගේ නම ශ්‍රී ශ්‍රද්ධාරාජ චූලමනී සිරිරතන ලංකාදීප මහාසාමි ය.

එකී ලංකාදීප මහාසාමි කල සුබෝදයේ රජ කළ ශ්‍රී ධර්මරාජලිදය්‍ය නම් රජ ලක්දිව සුමනකූට පර්වත මුදුනේ ඇති සිරිපතුල් සටහනක් පිටපත් කොට ගෙන එන ලෙස දූත පිරිසක් ලංකාවට එවී ය. එසේ පිටපත් කරගෙන ගිය සිරිපා සටහන සුබෝදය නගරයට බටහිර කන්දේ පිහිටුවා එම ස්ථානය ''වට් සුමන කූට'' යනුවෙන් නම් කරන ලද බව ලිදය්‍ය රජතුමා පිහිටුවා ඇති සෙල්ලිපියක සඳහන් කොට ඇත.

ලිදය්‍ය රජු සමයේ සුබෝදයට වැඩම වූ ශ්‍රී ලාංකික වනවාසි මහාසාමි සංඝරාජවරයෙකු ගැන සියම් වංසකතා රැසක මෙන් ම මෙම රජතුමාගේ සෙල්ලිපි ගණනාවක ද සඳහන් වෙයි.

උන්වහන්සේගෙන් සිංහල වනවාසී සම්ප්‍රදාය ද මෙකල සියමේ බිහි විය. ලිදය්‍ය රජතුමා උන්වහන්සේට අම්බවන නම් විහාරය කරවා පූජා කොට ඇත.

තම මාලිගයට වැඩම වූ උන්වහන්සේ වෙතින් බණ ඇසූ රජ එදින ම පැවිදි වී අනතුරුව මහාසාමි සංඝ සමග පිරිවරින් ගොස් අම්බවන විහාරයේ වස් විසීය. රජුගෙන් තොර වූ අගනුවර පරසතුරු උවදුරට ලක් විය. මේ අවස්ථාවේ ඇමතිවරු සහ මහජනයා පැමිණ රාජ්‍යය රැකදෙන ලෙස පැවිදි වූ රජතුමාගෙන් ඉල්ලා සිටියහ. රජතුමා එය ප්‍රතික්ෂේප කළ ද මහාසාමි සංඝරාජයන් වහන්සේ ගේ ඉල්ලීම පරිදි යළිත් රජ වී පරසතුරු ආක්‍රමණවලින් රට නිදහස් කර ගත්තේ ය. මෙම තොරතුරු ඇතුළත් සෙල්ලිපියක් සුබෝදය නගරයේ පිහිටුවා තිබේ.

දහහතරවන සියවසේ අගභාගය වන විට සියමේ අගනුවර බවට පත්වූයේ අයෝධ්‍ය නගරය යි. එකල ධම්මකිත්ති නම් සියම් ජාතික තෙර නමක් ලංකාවට පැමිණ ගම්පොළ සිලවංශ ධම්මකිත්ති සංඝරාජ මාහිමියන්ගෙන් මහණ උපසම්පදාව ලැබ අයෝධ්‍යා නගරයට ගොස් එහි ලංකාරාමයේ වාසය කළේය.

දහසය වන සියවස අග භාගය වන විට මෙරට උපසම්පදාව හා ලංකා ශාසන සම්ප්‍රදායන් පරිහානියට පත් වෙමින් පැවතිණි. දහඅටවන සියවස මැද භාගයේ (1753) වැලිවිට සරණංකර මාහිමියන්ගේ අප්‍රතිහත උත්සාහයෙන් හා කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ අනුග්‍රහයෙන් සියම් රටින් උපාලි ස්ථවිර ප්‍රමුඛ සංඝයා මෙහි වැඩම කොට උපසම්පදාව පිහිටුවන ලදී. මෙසේ පිහිටුවනු ලැබුවේ දහහතරවන සියවසේ සිට පහළොස්වන සියවස දක්වා වරින්වර මෙරටින් ගෙන ගොස් සියමේ තහවුරු කොට තිබූ ලංකා සීහල උපසම්පදා ක්‍රමය යි.

## ක්‍රියාකාරකම

තායි-ලංකා ශාසනික සබඳතා දහතුන්වන හා දාහත්වන සියවස් අතර කාලයේ අඛණ්ඩ ව පැවති බව පිළිගත හැකි සාධක තුනක් කෙටියෙන් ගෙන හැර දක්වන්න.

## 5.3 කාම්බෝජය

**පිහිටීම**

ථේරවාදී බෞද්ධ රටක් ලෙස සැලකෙන පැරණි කාම්බෝජය වර්තමාන ඛමේර් ජනරජය ලෙස හඳුන්වයි. තායිලන්තය හා දකුණු වියට්නාමයට මායිම් ව පවත්නා කුඩා රටකි.

### 5.3.1 කාම්බෝජයේ බුදුදහම පැතිර යාම

පස්වන සියවසේ අගභාගයේ දී කාම්බෝජයේ රජ කළ ජයවර්මන් රජු බුදු පිළිමයක් හා වෙනත් පුද පඬුරු චීනයට පිටත් කර හැරි බව දක්වෙන සටහනක් අනුව ඒ වන විට එහි බුදුසමය පැවති බව පිළිගැනීමට සිදු වේ.

ක්‍රි. ව. නවවන සියවසේදී එහි විසූ යශෝවර්මන් නම් අධිරාජයාගේ කාලයේ දී සෞගතාශ්‍රමය නමින් භික්ෂු ආරාමයක් ඉදිකරවූ බව ද දැක්වේ.

කාම්බෝජය තුළ ථේරවාදී බුදුදහමේ දීප්තිමත් බැබළීමක් ඇති වූ අවධියක් ලෙස දහවන සියවසේ රජ කළ ජයවර්මන් රජුගේ කාලය හඳුන්වති. එම රජු තම පුත්‍රයා ලංකාවට එවා පැවිද්ද ලබාදී ධර්මය මනාව හදාරා නැවත සිය රටට ගෙන්වා ගෙන ථේරවාදී බුදු සමය ප්‍රචලිත කිරීමට කටයුතු කොට තිබේ. ජයවර්මන් රජුට අයත් තාප්‍රෝම්හි අභිලේඛනයේ ඔහු කරන ලද සේවා රාශියක් ගැන තොරතුරු ඇතුළත්ව තිබේ. ඔහු සිදුකරන ලද පිංකම්වලින් අනුමෝදන් වූ පිං සිය මවට අනුමෝදන් කොට බුද්ධත්වය ප්‍රාර්ථනා කර තිබේ. මේ සාධක අනුව මෙකල එහි මහායාන බුදුදහම ද ප්‍රචලිතව තිබෙන්නට ඇති බව සිතිය හැකිය.

එකොළොස්වෙනි සියවසේ රජ වූ සුසර්මන් රජු දවස ද බුදුදහම පැවති බව පැහැදිලිවේ. මේ සාධක මත දහතුන්වන සියවස දක්වා කාම්බෝජයේ ථේරවාදී බුදුදහමත් පැවති බව කිව හැකි ය.

කාම්බෝජය දහතුන්වන සියවස අගභාගයේදී තායි දේශපාලන ආධිපත්‍යයට නතු වීමත් සමඟ වෙනත් සමයන් අභාවයට ගොස් ථේරවාදී බුදු සමය අදහන්නා වූ රටක් බවට පත්ව තිබේ.

දහතුන්වන සියවසේ සිට කාම්බෝජයේ රාජ්‍ය ආගම බුදුදහම බවට පත්ව ඇති අතර ජනතාවගෙන් බහුතරය බෞද්ධයෝ වෙති.

ඔම්යුත්තක (ථොම්මයුත්) හා මහායානික් (මොහනිකොක්) නමින් කාම්බෝජයේ භික්ෂු නිකාය දෙකකි. පළමු නිකායේ සඟරජ හිමි පොම්පෙන්හි පිහිටි බොන්කුම් (බෝධිවාද) විහාරයේ ද දෙවනුව සඳහන් කළ නිකායේ සඟරාජ හිමියෝ උණ්නලොම් (උර්ණාලෝම) විහාරයෙත් වැඩ වෙසෙති. මෙකී විහාරයේ වැඩ වාසය කරන භික්ෂූන් වහන්සේලා විශාල පිරිසක් ත්‍රිපිටකය මෙන් ම සංස්කෘත, ප්‍රංශ, චීන ආදී භාෂා ද හදාරති. වර්තමානය වන විට මෙම කුඩා රාජ්‍යයෙහි වෙහෙර විහාර දෙදහසක් වේ. මීට අමතරව එහි ලක්ෂයකට ආසන්න භික්ෂූහු ද වැඩ සිටිති.



**රූපය 5.3 කාම්බෝජයේ අන්කෝර්වට්හි විහාරය**

කාම්බෝජයේ සියැම්රීප් පළාතේ පිහිටි මෙම අන්කෝර්වට් ආරාමය ලෝක ප්‍රකට ය. ඛමේර් ජනරජයට අයත් හින්දු දේවාලයක් ලෙස ගොඩනගන ලද මෙය දොළොස්වන සියවසේදී බෞද්ධ විහාරයක් බවට පරිවර්තනය විය.

**ක්‍රියාකාරකම**

දහවන සියවසේදී බුදුසමය කාම්බෝජය තුළ දීප්තිමත් ව පැවැති බව පෙන්වන සාධක මොනවාද?

## 5.4 ලාඕසය

කාම්බෝජය, තායිලන්තය, වියට්නාමය යන රටවල් මායිම් කොට ලාඕසය පිහිටා තිබේ. ඉතිහාස කථාවන්ට අනුව ලාඕසයට බුදු සමය ලැබුණේ දහහතරවන සියවසේ දී ය. ඒ සිංහල භික්ෂූන් ප්‍රමුඛ කාම්බෝජ භික්ෂූන්ගෙනි. ඒ දාහතරවන සියවසේ දී ය.

දහඅටවන සියවසේ දී ලාඕසය තායිලන්තයට යටත් රාජ්‍යයක් බවට පත් විය. එහෙත් තායිලන්තය බෞද්ධ රටක් වූ බැවින් ලාඕසයේ බුදුදහම අඛණ්ඩව ම ඉදිරියට වර්ධනය විය. රාජ්‍ය අනුග්‍රහය මත ථෙරවාදී බුදු සමය ව්‍යාප්ත විය.

වර්තමාන ලාඕසයේ රාජ්‍ය ආගම වනුයේ බුදු දහමයි. කාම්බෝජ භික්ෂූන් අතර පවත්නා ධම්මයුක්තික හා මහානිකාය යන නිකාය දෙක ලාඕසයේ ද පවතී. එකී නිකාය දෙකෙහි සඟ රජවරුන් දෙනමකි. නිකායික භික්ෂූන්ගේ පූර්ණ පාලනය මේ සඟරජවරුන් මගින් සිදු වෙයි. ලාඕසියන් හා ප්‍රංශ භාෂාව කතා කරන ජන වර්ග දෙකක් රටෙහි වාසය කරති. ඔවුන්ට ථෙරවාදී බුදු දහම පැහැදිලි කරදීම සඳහා එම දෙබසින් ලියවුණු පොතපත සුලභ කිරීමට ලාඕස රජය මහත් උත්සාහයක් දරයි. රටෙහි බුදුදහමේ චිර පැවැත්ම ඇති කරනු සඳහා පාලි භාෂාවේ ඇති වටිනාකම වටහා ගෙන ඇත. පාලි උගතුන් සංඛ්‍යාව සීමාසහිත වන බැවින් පාසල් අධ්‍යාපනයේ දී ඒ සඳහා ප්‍රමුඛත්වය ලබාදී ඇත.

ලාඕස බෞද්ධ වැසියෝ ජාතක කතා කෙරෙහි දැඩි ඇල්මක් දක්වති. දස ජාතකය හා පනස් ජාතකය යන නම්වලින් හැඳින්වෙන ජාතක කතා පොත් දෙකක් රචනා කොට තිබෙනුයේ එහි ප්‍රතිඵලයක් ලෙස ය. බුරුමය, තායිලන්තය, කාම්බෝජය යන රටවල ඇති මේ පොත් කාම්බෝජය හරහා ලාඕසයට උරුම වන්නට ඇත. සුවිශේෂී ලක්ෂණයක් වනුයේ පනස් ජාතක පොතෙහි ඇති කතා අතුරෙන් විසි හතක් ම වෙනත් කිසිදු රටක දකින්නට නොලැබීම යි.

### ක්‍රියාකාරකම්

1. ලාඕසයට බුදුදහම ලැබුණේ කුමන කාලයේ ද?
2. ලාඕස බෞද්ධයින් ජාතක කතාවලට දක්වන සැලකිල්ල පෙන්නුම් කරන සාධක මොනවාද?



## 5.5 ඉන්දුනීසියාව

අග්නිදිග ආසියාවේ කුඩා දූපත් තුන්දහසකට ආසන්න ප්‍රමාණයකින් සමන්විත ප්‍රදේශය ඉන්දුනීසියාව ලෙස හැඳින්වේ. එහි ජාවා, සුමාත්‍රා, බෝර්නියෝ, සෙලිබීස් යන ප්‍රධාන දූපත් බුදුදහම පැතිරගිය කලාප ලෙස විශේෂ කොට දැක්විය හැකි ය. පැරණි බෞද්ධ නටබුන් රැසක් එකී දූපත්වලින් සොයාගෙන තිබේ. ඇතැම් බටහිර විචාරකයන්ගේ මතය අනුව ධර්මාශෝක රජු දවස සෝණ උත්තර දෙනම වැඩම කළ සුවණ්ණ භූමිය යනු ජාවා සුමාත්‍රා යන දූපත් ය. මේ මතය පිළිගනු ලබන්නේ නම් මේ ප්‍රදේශ බෞද්ධ ප්‍රදේශ බවට පත්ව තිබෙනුයේ අශෝක රජු සමයේ දී ය. එහෙත් එම සමයට අයත් කිසිදු පුරාවිද්‍යා සාක්ෂ්‍යයක් මෙතෙක් අනාවරණය කර ගෙන නැත.

### 5.5.1 ඉන්දුනීසියාවේ බුදුදහම පැතිරීම

ක්‍රි. ව. පස්වන සියවසේ ඉන්දුනීසියාවට පැමිණි පාහියන් භික්ෂූන් වහන්සේ එහි බුදුදහම පැවති බව සඳහන් කරයි. චීන වාර්තාවල දැක්වෙන කරුණු අනුව කාශ්මීරයේ සිට ජාවා දූපතට පැමිණි ගුණවර්මන් නම් භික්ෂුවක් එහි රජ පවුලට ධර්මය දේශනා කොට බුදුදහමේ ආශීර්වාදය ලබා දී ඇත. දකුණු ඉන්දියාවේ ථේරවාදී බුදුසමය පැතිරී පැවති තුන්වන හෝ හතරවන සියවස්වල දී මෙය සිදුවන්නට ඇතැයි අනුමාන කළ හැකිය. ජාවා සුමාත්‍රා වැනි දූපත්වලින් හමු වූ අමරාවතී ශෛලියේ බෞද්ධ ප්‍රතිමා ආදිය දෙවන

සහ තුන්වන සියවස්වලට අයත්වන ඒවා ලෙස පිළිගැනෙන හෙයින් මේ මතය වඩාත් තහවුරු වේ. ඉන්දියාවේ උතුරු හා දකුණු පෙදෙස්වලින් එහි වැඩමකළ ධර්මදූතයන් වහන්සේලාගෙන් බුදු සමය පිළිබඳ පණිවුඩය ඉන්දුනීසියාවට ලැබෙන්නට ඇත.

ගුණවර්මන් භික්ෂුව එහි සිටි කාලවකවානුව තුළ දී ධර්මගුප්ත නිකායට අයත් ග්‍රන්ථයක් පරිවර්තනය කළ බවක් චීන වාර්තාවල දැක්වෙන නිසා ථේරවාදයේ කොටසක් වූ සර්වාස්තිවාදී බුදුදහම එහි ප්‍රචලිත වන්නට ඇතැයි අනුමාන කෙරේ.

චීන වාර්තාවලට අනුව හතරවන සියවස වන විට ඉන්දුනීසියාවේ බාලි දූපතෙහි බුදුදහම ප්‍රචලිතව පැවතුණි. බාලි දූපතේ රජු බුදුන් වහන්සේගේ මෑණියන් වූ මහාමායා දේවිය තම රටේ කාන්තාවක ලෙස හඳුන්වා දීම මගින් බුදුදහමට ඔවුන් තුළ වූ ගෞරව හඟවන්නේ යැයි ඉතිහාසඥයෝ පවසති.

හත්වන සියවසේ ඉන්දියාවට යන ගමනේ දී සුමාත්‍රාවේ සය මසක් පමණ නැවතී සිටි ඉට්සිං භික්ෂුවගේ වාර්තාවලට අනුව සුමාත්‍රාවේ පැවති පැරණි ශ්‍රී විජය රාජ්‍යයේ අගනුවර වූ පලෙයිබාන් නගරය ථේරවාදී බුදුසමයේ බලකොටුවකි. එහි භික්ෂූන් දහසකට අධික පිරිසක් විසූ බවත් ඒ අවට දූපත් දහයක පමණ ජනයා අතර බුදුදහම ජනප්‍රියව පැවති බවත් උන්වහන්සේ තවදුරටත් සඳහන් කර ඇත.

සුමාත්‍රාවෙහි විසූ ජලනාග නම් ථේරවාදී බෞද්ධ රජෙකු පිළිබඳ තොරතුරු දැක්වෙන අභිලේඛනයක් හමුව තිබේ. එම අභිලේඛනය ඉට්සිංගේ ථේරවාදී බුදුසමය පිළිබඳ සඳහන සනාථ කරන්නක් ලෙස ගත හැකි ය. තවද එහි සිටි මහායාන බෞද්ධයින් වජ්‍රයාන, තන්ත්‍රයාන යන නම්වලින් හැඳින්වුණු තාන්ත්‍රික බුදුසමය අනුගමනය කළ බව මූලාශ්‍රය වලින් සනාථ වෙයි.

චීනයට තන්ත්‍රයානය හඳුන්වා දුන් වජ්‍රබෝධි හා ඔහුගේ ශිෂ්‍ය අමෝඝවජ්‍ර ලංකාව හරහා චීනයට යන අතරතුර සුමාත්‍රාවෙහි මාස පහක් නැවතී සිටි බව සටහන්ව ඇත.

අටවන සියවසේ සිට ඉන්දුනීසියාවේ බලයට පත් වූ ශෛලේන්ද්‍ර රාජ පරම්පරාවේ මූලිකත්වය යටතේ මහායාන ප්‍රබෝධයක් ඇති වූ බවට සාධක තිබේ.

වෙනත් රටවල ඇති බෞද්ධ ස්තූපවලට වඩා වෙනස් වූ මුහුණුවරකින් බෝරෝබුදූර් හෙවත් බහුබුද්ධ ස්තූප සංකීර්ණය නිම කොට ඇත්තේ ශෛලේන්ද්‍ර රාජ පරම්පරාවේ අනුග්‍රහයෙනි. මෑතකදී ලෝක උරුමයක් වශයෙන් යුනෙස්කෝව පිළිගත් මෙම ස්තූප ජාවා දූපතේ පිහිටා ඇත. බුදුරූ පන්සිය පණහක් තැන්පත්ව තිබෙන එය මහායාන බලපෑම මැනවින් විදහා දක්වයි.



රූපය 5.4 ජාවාහි බෝරෝබුදූර් විහාරය

ජාවා දිවයිනේ රතුවක සානුවෙන් හමු වූ වර්ෂ 714-792 කාලයට අයත් සකු සෙල්ලිපියක සඳහන්වන පරිදි ශෛලේන්ද්‍ර වංශික විජයෝත්තුංග රජු සිංහල භික්ෂූන් සඳහා අභයගිරි විහාරයජාවාහි කරවා ඇත.

ක්‍රි. ව. නවවන සියවසේ සිට ඉන්දුනීසියාවේ ක්‍රමිකව වර්ධනය වූ හින්දු ආගමික හා පහළොස්වෙනි සියවසේ සිට ඇරඹි මුස්ලිම් ආධිපත්‍යයත් නිසා බෞද්ධ බලය පිරිහෙන්නට වූ නමුදු වර්තමානයේ වුව ද ලක්ෂ සංඛ්‍යාත බෞද්ධ ජනතාවක් එහි වාසය කරති.

## ක්‍රියාකාරකම

බෝරෝබුදූර් විහාරය (බහුබුද්ධ රූප) පිළිබඳ ඓතිහාසික තොරතුරු එක් රැස් කර පොත් පිංචක් සකස් කරන්න.



### 5.5.2 ආසියාවේ මහායාන බෞද්ධ සංස්කෘතිය

බුදු සමය ඉන්දියාවෙන් බැහැර ලෝකයට බෙදා දුන් ප්‍රධාන අවස්ථා දෙකක් විය. අශෝක අධිරාජයාගේ කාලයේ පැවැත්වුණු තුන්වන ධර්ම සංගායනාවෙන් පසු ලංකාව ඇතුළු රටවල් නවයකට ධර්මදූතයන් වහන්සේලා වැඩම කිරීම ඉන් පළමු අවස්ථාව වේ.

පළමුවන ශතවර්ෂයේ දී කණිෂ්ක අධිරාජයාගේ අනුග්‍රහයෙන් පැවැත්වුණු ධර්ම සංගායනාවෙන් පසුව සංවිධානය වූ මහායාන හෙවත් උතුරු බුද්ධාගම නොයෙක් රටවලට පැතිරයාම දෙවන අවස්ථාව වශයෙන් දැක්විය හැකිය. මහායානයේ බලපෑම ආසියාව පුරාම දක්නට ලැබුණි.

ථේරවාදය මෙන් ම මහායානය ද එම සියවසෙන් පසුව මධ්‍ය ආසියාවේ රටවල් සියල්ලෙහි ම වගේ පැතිරී ගියේ ය. එසේ වුව ද වර්තමානය වන විට ඒවායේ ඉස්ලාම් ධර්මය පැතිරීම නිසා බුදුදහම අතීත ස්මාරකවලට පමණක් සීමා වී ඇත. බුදුදහම චීනය, කොරියාව හා ජපානය වැනි ඈත පෙරදිග රටවලට පැතිර යාමේදී මධ්‍ය ආසියාතික ප්‍රදේශවලින් සිදු වූ සේවය අනල්ප ය. පැරණි සේද මාවත ඔස්සේ ගමන් කළ බෞද්ධ ධර්මදූතයන්ගෙන් ඉටු වූ විශිෂ්ට සේවය වූයේ චීන මහා දේශයට බෞද්ධ සංස්කෘතියේ පණිවුඩය ලැබීම යි. ඉන්පසු එම පණිවුඩය චීනයෙන් කොරියාවටත් කොරියාවෙන් ජපානයටත් ගලා ගියේ ය.

## 5.6 චීනයේ බෞද්ධ සංස්කෘතිය

බුදුදහම හඳුන්වා දෙන විට චීනයේ ඉපැරණි ශිෂ්ටාචාරයක්, දියුණු ලේඛන කලාවක් හා අධ්‍යාපනික සම්ප්‍රදායක් ද පැවතුණි. චීනයට බුදුදහම හඳුන්වා දුන් ධර්මදූතයාණන් වහන්සේලාට මේ තත්වය අභියෝගයක් විය. චීන ජනතාව බුදුදහම හැදිනගන්නේ තමන්ට උරුමවූත් තමන්ට ආවේණික වූත් ඇදහිලි, විශ්වාස, චින්තන සහ දාර්ශනික සම්ප්‍රදායයන් පදනම් කොට ගෙනය. චීන දේශපාලන චින්තනය හා සමාජ චින්තනය හැඩ ගැස්වීමට පාදක වූයේ කොන්ෆියුසස් දහම යි.

චීනයට බුදුදහම පැමිණි ආකාරය වටහාගැනීමට පාදක වූ සාධක විරල ය. එහෙත් නොපැහැදිලි හා අනුමාන සාධක මත බොහෝ උගතුන් පිළිගෙන ඇත්තේ විවිධ වෙළඳුන් හා සංචාරකයින් මගින් බුදු දහම පැමිණි බව යි.

### චීනයේ බුදු දහම පැතිරී යාම

වර්තමානයේ පවතින පිළිගැනීම අනුව චීනයට බුදුදහම ගෙනාවේ මිං-කි (58-75) අධිරාජ්‍යයාගේ කාලයේ දී ය. එතුමා කාශ්‍යප-මාතංග හා ධර්මරක්ෂිත දෙනමට කළ ආරාධනාව පරිදි චීනයට පෙති පිළිම හා ධර්මග්‍රන්ථ රැගෙන වැඩම කළේ ය. උන්වහන්සේලා ධර්ම ග්‍රන්ථ චීන බසට පරිවර්තනය කළහ. එහෙත් පරම්පරාගත චීන ජනප්‍රවාද අනුව ඉන්දියාවේ අශෝක අධිරාජයාගේ සමයේ දී චීනයට බුදුදහම පැමිණි බවට ද මතයක් පවතී.

ක්‍රි.ව. 149 දී චීනයට පැමිණි මධ්‍ය ආසියාතික භූපාර්ථව නම් රජ කුලයක කුමරෙකු පැවිදිව ධර්මග්‍රන්ථ චීන බසට පරිවර්තනය කරවීය. ධර්ම ප්‍රචාරයෙහි යෙදුණු උන්වහන්සේ වෙතින් බොහෝ පිරිසක් පැවිදි උපසම්පදාව ලැබූහ.

පළමුවන සියවස මැද වන විට බුදුදහම පැතිරී තිබුණි. කොන්ෆියුසියුස් දහමට වඩා දියුණුව පැවතීම හා තාඕ දහමට වඩා එය නවතාවයකින් යුක්ත වීම බහුතර චීන වැසියන්ගේ සිත් ගැනීමට හේතු විය. එම සියවසේ ම ටාටර් වංශිකයන්ගෙන් ලැබුණු සහයෝගය ඉතා වැදගත් ය.

ක්‍රි.ව. 191 දී හැං වංශික චීන අධිරාජයාගේ නිලධාරියෙකු විසින් ප්‍රථම වරට උතුරු චීනයේ කියැ-ත්සු ප්‍රදේශයේ බෞද්ධ ආරාමයක් ආරම්භ කර සමාජ සේවා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළේ ය.

මේ අනුව හතරවන හා පස්වන සියවස් වන විට උතුරු චීනයේ බුදුදහම බෙහෙවින් ව්‍යාප්තව තිබුණි. චිං රාජවංශ අගනුවර වූ දැං ඇංහි ජීවත් වෙමින් බෞද්ධ ශාස්ත්‍රීය කටයුතුවල යෙදුණු කුමාරජීව හිමියෝ චීනයේ මෙතෙක් ප්‍රචාරය නොවූ බෞද්ධ දර්ශනයේ නවාංග එම රටට හඳුන්වාදීම සඳහා මහඟු සේවයක් කළහ. උන්වහන්සේ මධ්‍ය ආසියාතික භික්ෂුවකි.

405 වන විට උතුරු චීනයේ පවුල් දහයකින් නවයක් ම බෞද්ධයෝ වූහ. 500 වන විට මුළු චීනය ම බෞද්ධ රාජ්‍යයක් විය. මේ අවධියේ හැම ගමක ම බෞද්ධ ආරාමයක් ඉදිකොට තිබුණි. බෞද්ධ සූත්‍ර සජ්ඣායනයක් පැවැත්වීම සාමාන්‍ය දර්ශනයක් බවට පත්විය. භික්ෂු-භික්ෂුණීන් සුලභවීම මහත් ගෞරවයෙන් සලකන දර්ශනයක් විය.

දකුණු චීනයේ චෙයි රාජවංශයේ අධිරාජ ලියාං-වුති ශ්‍රේෂ්ඨතම චීන බෞද්ධ අධිරාජයා සේ සැලකේ. ඔහුගේ අනුග්‍රහය නිසා බුදුදහමට එල්ල වූ විරුද්ධවාදී බලවේග සියල්ල ම ජයගත හැකි විය.

චීන බෞද්ධ භික්ෂූන් වහන්සේලා ධර්ම ග්‍රන්ථ සොයා ඉන්දියාවට පැමිණීම වැදගත් ලක්ෂණයක් වේ. පස්වන සියවසේ ඉන්දියාවට වැඩම කළ පාහියන් හිමි ඒ අතර ප්‍රමුඛ වේ. උන්වහන්සේ පැමිණෙන විට ඉන්දියාවේ ථේරවාදී දහම පිරිහී තිබුණ ද මහායානය ප්‍රබල තත්වයෙන් පැවතුණි. වසර කීපයක් ඉන්දියාවේ සංචාරය කර ලංකාවට පැමිණි උන්වහන්සේ අනුරපුර අභයගිරි විහාරයේ නැවතී සිට ථේරවාද බුදුදහම උගත්හ. වසර පහක් ම පිට රටවල ජීවත් වූ පාහියන් හිමි බෞද්ධ පොත්පත් එකතු කරගෙන සිය රටට වැඩියහ. පාහියන් හිමියෝ එරට දකුණු චීන අගනුවර හැං කියුකි ආරාමයේ ජීවත්වෙමින් පොත්පත් චීන භාෂාවට පරිවර්තනය කිරීමට සිය ජීවිතයේ අවසාන කාලය කැප කළහ.

උන්වහන්සේ නැවත චීනයට වැඩම වීමෙන් පසුව ලංකාවේ භික්ෂුණීන් වහන්සේලා චීනයට වැඩම කොට එහි භික්ෂුණී උපසම්පදාව ඇති කළ බව චීන වාර්තාවල සඳහන් වේ. මෙම චීන භික්ෂුණීන් වහන්සේලා දකුණු නැංජින් නගරයේ වැඩ වාසය කළහ. ලාංකික

භික්ෂුණීන් වහන්සේලා චීනයට වැඩම කරන ලද්දේ ලාංකික වෙළෙඳෙකු වූ නන්දිගේ නැවකිනි. එම භික්ෂුණී කණ්ඩායමේ මූලිකත්වය ගන්නා ලද්දේ තියෝසරා නම් භික්ෂුණීන් වහන්සේ ය. තියොසරා යනු තිස්සා හෝ දේවසරා විය හැකිය.

නවවන ශතවර්ෂය අවසන් වන විට බුදුදහම චීනයේ ජාතික ආගම බවට පත් වී තිබුණි. විවිධ ථේරවාදී හා මහායාන ඉගැන්වීම් එම රටට හඳුන්වා දීමේ ප්‍රතිඵලයක් ලෙස ආචාර්යවාද රාශියක් බිහිවී තිබුණි. නිකාය ලෙස හැඳින්විය හැකි මෙකී ආචාර්යවාද අතර කිෂං තායි හා හු ආ-යෙං නිකාය දෙක ඉහළ සමාජය තුළ වඩාත් ජනප්‍රිය ව පැවතියේ ය.

චීනයේ ජනප්‍රිය වූ නිකායවලින් කැපී පෙනෙන එකක් වූයේ චාන් හෙවත් සෙන් බුදු සමය යි. එය බෝධිධර්ම නම් ඉන්දියානු භික්ෂුව හඳුන්වා දුන් බව පිළිගනී. ධ්‍යාන වැඩීමට ප්‍රමුඛත්වය දුන් මෙහි බුද්ධත්වය ලැබීමේ මාර්ගයක් ගැන දක්වන කරුණු මිථ්‍යාවක් ලෙස බැහැර කළ ද බොහෝ දෙනා අතර ජනප්‍රිය විය.

අමිතාභ බුදුන් වාසය කරන්නේ යැයි මහායානිකයන් සලකනු ලබන සුඛාවතිය හෙවත් පරම සුන්දර ලෝකය මුල් කර ගෙන බිහි වූ චං-කුං නිකාය චීනයේ මෙන් ම සෙසු මහායානික රටවල ද ජනප්‍රිය විය.

## ක්‍රියාකාරකම

චීන බෞද්ධයන් එදිනෙදා කටයුතුවල දී අනුගමනය කරන බෞද්ධ චාරිත්‍ර දෙකක් ගැන කෙටි තොරතුරු එක් රැස්කරන්න.

## 5.7 කොරියාවේ බෞද්ධ සංස්කෘතිය

වර්තමානයේ උතුරු කොරියාව හා දකුණු කොරියාව වශයෙන් බෙදී ඇති කොරියාව තුන් පැත්තකින් ම මහ මුහුදෙන් වට වී ඇති සුවිශාල රටකි. එහි උතුරු දේශ සීමාව වන්නේ චීනය හා රුසියාව යි. කොරියාව ලෝකයේ ප්‍රධාන බෞද්ධ රාජ්‍යයක් ලෙස එක් කලෙක පැවතුණි.

කොරියාව ගොඩබිමින් ආසියා මහද්වීපය හා සම්බන්ධ වී ඇති නිසා එහි ජනාවාස බිහිවීමේ දී මහද්වීපය ඔස්සේ සිදු වූ ජන සංක්‍රමණ වැදගත් වේ. බුදුදහමේ ආභාසය ලැබීමට පෙර කොරියාව විවිධ ජන කණ්ඩායම් මුල් කරගත් රාජ්‍ය කිහිපයකට බෙදී පැවතුණි. විවිධ භාෂා කතා කළ එම ජනතාවට පොදු ඇදහිලි ක්‍රමයක් හෝ සංස්කෘතියක් නොවීය.

### 5.7.1 කොරියාවට බුදුදහම පැමිණීම

කොරියානු අර්ධද්වීපයට බුදුදහම ලැබෙන අවධිය එනම් ක්‍රි. ව. හතරවන සියවස වන විට ශිල්ලා, ගෝර්යෝ, පෙක්චේ වශයෙන් ස්වාධීන රාජ්‍ය තුනකට බෙදී පැවතුණි.

ක්‍රි. ව. 372 දී ගෝර්යෝ රාජ්‍යයෙහි පාලකයා වූ සොසෙරිම් රජුගේ දෙවන රාජ්‍ය වර්ෂයේ දී සුන්දෝ නම් ඉන්දියානු භික්ෂුවක් බෞද්ධ සූත්‍ර ග්‍රන්ථ හා බුදු පිළිම කීපයක් රැගෙන වැඩම කළේ ය. අනතුරුව 381 දී තවත් ඉන්දියානු භික්ෂූන් වහන්සේ කෙනෙකු වූ මරකන්ද හිමි බෞද්ධ ධර්මයේ පණිවිඩය රැගෙන රාජ්‍යයට ඇතුළු විය. මෙසේ අවස්ථා දෙකක කොරියාවට බුදුදහම ලැබී ඇත. ඒ සඳහා යහපත් ප්‍රතිචාර ලැබීම වැඩි කල් යාමට පෙර බුදු දහමේ වර්ධනයට හේතු විය.

ශිල්ලා රාජ්‍යයට බුදුදහම හඳුන්වා දෙනු ලැබුවේ ගෝර්යෝ භික්ෂු නමක වූ මුක්හෝජා හිමි විසිනි. ඒ වන විට එහි පාලකයා වූයේ නූල්චි නම් රජු ය.

කොරියාවේ විවිධ රාජ්‍යයන්ට බුදුදහම ලැබුණු අවධියේ එම රාජ්‍යවල පැවතියේ භූතාත්ම වැනි විශ්වාස පදනම් කර ගත් ඇදහිලි ය. මහායානයේ ශාඛාවක් වූ තන්ත්‍රයානය මධ්‍ය ආසියාව හරහා චීනයට පැමිණෙන විට විවිධ ජන විශ්වාස හා සම්මිශ්‍රණය වී තිබිණ. මන්ත්‍ර සජ්ඣායනය හා බෝධිසත්ව වන්දනාවට එහි මූලිකත්වයක් හිමි වුණි. කොරියාවට හඳුන්වා දුන්නේ ද එම තන්ත්‍රයානයේ ම එක් අංගයකි.

කොරියාව තුළ බුදුදහම ජනප්‍රිය වූයේ ජනතාවටත් රටටත් සෞභාග්‍ය ලබා දෙන මන්ත්‍ර සජ්ඣායනය මුල් කර ගත් ආගමක් වශයෙනි. සමකාලීන ආසියානු මහද්වීපය හරහා එල්ල වූ සතුරු ගෝත්‍රික ආක්‍රමණවලින් පීඩිතව සිටි ජනතාවට ආක්‍රමණවලින් මිදීමේ මගක් ලෙස බෞද්ධ මන්ත්‍ර සජ්ඣායනය ඉතා ඉහළ තැනක් ගත්තේ ය.

ගෝර්යෝ රාජ්‍යයෙහි කොටු වූවන් රජු ක්‍රි. ව. 393 දී තම රාජ්‍යයේ සියලු දෙනා බුදුදහම ඇදහිය යුතු බවට ආඥාවක් නිකුත් කළේ ය. මීට අමතර රජෙකු ක්වාංකෙතෝ පියොංයැං නගරයෙහි බෞද්ධ විහාරස්ථාන නවයක් ඉදි කළ බවත් කොරියානු ජනප්‍රවාදවල සඳහන් වේ. මේ අවධියේ ගෝර්යෝ රාජ්‍යයෙහි භික්ෂූන් වැඩිදුර ධර්මය ඉගෙනීමට චීනයටත් චීන භික්ෂූන් ගෝර්යෝවලටත් නිතර නිතර පැමිණීමත් එහි ධර්ම ව්‍යාප්තියේ දී වැදගත් විය.

පෙක්චේ රාජ්‍යය බුදුදහම ශීඝ්‍රයෙන් පැතිරී ගිය රාජ්‍යයකි. කියුටික් නම් භික්ෂූන් වහන්සේ ඉන්දියාවට වැඩම කොට ධර්මය ප්‍රගුණ කොට නැවත පැමිණ ඇත්තේ සංස්කෘත බෞද්ධ ග්‍රන්ථ රාශියක් ද රැගෙන ය. ඒවා උන්වහන්සේ තවත් උගතුන් රැසකගේ සහාය ලබා ගෙන කොරියානු භාෂාවට පරිවර්තනය කළ අතර මෙකී කාර්යයන්ට පෙක්චේ රජුගෙන් ලැබුණු සහයෝගය ඉතා වැදගත් විය. ඔහු මාසාත ආඥාව පැනවූ බව වාර්තාවල දැක්වේ.

600-640 කාලයේ සිටි පෙක්චේ රජු විසින් ගොඩනංවා ඇති මීරුක් විහාරය එවකට ඈත පෙරදිග රටක වූ විශාලතම බෞද්ධ විහාරය විය. කළුගලින් නිමවා ඇති මෙය අදටත් ආරක්ෂිතව පවතී.



රූපය 5.5 කොරියාවේ මීරුක් විහාරය

හයවන සියවස මැද භාගය වන විට කොරියානු බෞද්ධ භික්ෂූහු ජපානයට ද බුදුදහමේ පණිවුඩය බෙදාදීමෙහි සමත් වූහ. ජපානයේ ෂෝතෙකු කුමාරයාගේ කාලයේ දී දක්නට ලැබෙන බෞද්ධ ප්‍රබෝධයට මුල පුරන ලද්දේ කොරියානු භික්ෂූන් වහන්සේ විසිනි.

කොරියානු බෞද්ධ සංස්කෘතියේ ස්වර්ණමය යුගය ඒකාබද්ධ ශිල්ලා රාජ්‍ය සමය ලෙස හැඳින්විය හැකි ය. 668 -935 දක්වා පැවති ඒකාබද්ධ ශිල්ලා රාජ්‍ය යුගයෙහි රජ පවුල, ප්‍රභූ පන්තිය හා පොදු ජනතාව බෞද්ධ ඉගැන්වීම්වලින් ශික්ෂිතව ගොඩනගා ගත් සාමකාමී දිවි පෙවෙත රටේ අභිවෘද්ධියට හා සෞභාග්‍යයට හේතු විය. මේ යුගයේ භික්ෂූන් වහන්සේලා මෙන් ම රජ පවුලේ උදවිය ද චීනයට ගොස් බුද්ධ ධර්මය ප්‍රගුණ කළහ.

ගෝර්යෝ බෞද්ධ යුගයේ වැදගත් ලක්ෂණ කීපයකි

- පොදු ජනතාව අතර සාමකාමී සහජීවනය සමානාත්මතාව වර්ධනය වීම.
- සිල්වත් ගුණවත් භික්ෂූන් රාජ්‍ය උපදේශක ලෙස කටයුතු කිරීම
- විහාරස්ථාන රාජ්‍ය බදුවලින් නිදහස්වීම
- රජ පවුලේ දරුවන් සසුන් ගතවීම

918-44 රජ කළ කොරියෝ රජ සියලු දෙනා පිළිපැදිය යුතු දසවිධ සමාජ ධර්ම පද්ධතියක් ප්‍රකාශයට පත් කළේ ය. බෞද්ධ වෙහෙර විහාර බහුල ව ඉදි වූ මේ අවධියේ දී ශෙන් හා කියෙන් භික්ෂු නිකාය සමගි විය. කොරියානු ත්‍රිපිටකය ලී පුවරුවල ලිවීම ද සිදු වූයේ මෙම අවධියේ දී ය. එකී ත්‍රිපිටකය වර්තමාන හේන්සා විහාරයේ තැන්පත් කර ඇත.

කොරියාවේ භික්ෂූන් වහන්සේලා තම රට ආරක්ෂා කර ගැනීම සඳහා සිදු කරන ලද සේවාව ඉතා වැදගත් ය. ජපානය, කොරියාව යටත් කරගෙන තිබූ සමයේ තම රට නිදහස් කර ගැනීම සඳහා භික්ෂූහු පෙරමුණ ගත්හ. එහි කැපී පෙනෙන චරිතය වූයේ මනේ භික්ෂූන් වහන්සේ ය. උන්වහන්සේ විවිධ ගැහැට මධ්‍යයේ ජනතාව ඒකරාශී කර නිදහස් අරගලයට දායකත්වය සැපයීය. උන්වහන්සේ නමින් එනම් මනේ පදනම නමින් අද ද සංවිධානයක් තිබේ. උන්වහන්සේ විසින් රචනා කරන ලද ග්‍රන්ථයක් පාසල් විෂය මාලාවට එක්කර තිබීම සුවිශේෂ කරුණකි. වර්තමානයේ භික්ෂු-භික්ෂුණී උභතෝ සංඝයා කොරියාවේ වැඩසිටින අතර ප්‍රධාන නිකාය චෝග්‍ය නිකාය යි. එය බොහෝදුරට ආරණ්‍ය නිකායක් වන අතර එහි භික්ෂූන් වහන්සේලා විවාහ දිවියට පත් නොවෙති.



**රූපය 5.6 හේන්සා විහාරය**

### 5.7.2 කොරියානු බුදුදහමේ වර්තමාන තත්වය

- ❖ බෞද්ධ ජනගහනය 25% පමණ වීම
- ❖ රාජ්‍යය අනාගමික වීම
- ❖ වෙහෙර විහාරවලට රාජ්‍ය අනුග්‍රහය නොලැබීම
- ❖ සමහර භික්ෂූන් වහන්සේලා වනගතව ධ්‍යාන වැඩීමට යොමුවීම
- ❖ තරුණ පරම්පරාව තුළ සිදුවී ඇති මතවාදී වෙනස්කම්
- ❖ බෞද්ධ සිරිත් දේශීය දේව වන්දනය සමග සම්මිශ්‍රණ වී තිබීම
- ❖ භික්ෂුණී ශාසනය වැදගත් තැනක පැවතීම

**කොරියාවෙන් බෞද්ධ සංස්කෘතියට සිදු වූ සේවාව**

- ත්‍රිපිටක කොරියානා ඇතුළු බෞද්ධ පොත්පත් රාශියක් බිහිවීම.
- කොරියානු භික්ෂූන්ගේ දාර්ශනික අදහස් ඈත පෙරදිග චින්තනයට බලපෑම් ඇති කිරීම.
- බෞද්ධ සංස්කෘතිය කොරියානු සංස්කෘතික උරුමය බවට පත්වීම
- බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පයක් බිහිවීම
- සෙන් භාවනා ක්‍රමය අපරදිග රටවල ව්‍යාප්ත කිරීම

**ක්‍රියාකාරකම්**

1. කොරියාවට බුදුදහම ලැබෙන අවධියේ එහි පැවති රාජ්‍යය නම් කරන්න.
2. කොරියාවේ බුදු සමයෙහි වර්තමාන තත්වය කුමක් ද?

## 5.8 ජපානයේ බෞද්ධ සංස්කෘතිය

ජපානය පැසිපික් සාගරයෙන් හා ජපන් මුහුදින් වට වූ ප්‍රධාන දූපත් හතරකින් සමන්විත වූ ආසියාවේ නැගෙනහිර මුහුදු තීරයේ පිහිටි රටකි.

### 5.8.1 ජපානයේ බුදුදහම ආරම්භ වීම

ජපානය කොරියාවේ පැවති පෙක්චේ රාජ්‍යයේ මිතුරු රටක් විය. චීන ශිෂ්ටාචාරයේ ආභාසය කොරියාව හරහා ජපානයට ද ළඟා විය. ජපන් වංශකතා අනුව ක්‍රි. ව. 552 දී පෙක්චේ රාජ්‍යයේ රජු බුදු පිළිමයක් හා බෞද්ධ සූත්‍ර ග්‍රන්ථ රාශියක් ඇතුළු තුටු පඬුරු දී දූත පිරිසක් ජපානයට යවා ඇත. මේ සමග භික්ෂු භික්ෂුණීන් පිරිසක් ද වූහ.

ජපානයට චීනයෙන් හා කොරියාවෙන් පැමිණි සංක්‍රමණිකයන් හා දූත පිරිස් නිසා හයවන සියවසේ මැද භාගය වන විට එහි සිටි ජන කොටස්වලින් හතරෙන් තුනක් ම විදේශික ප්‍රභවයක් ඇති අය වූහ. ඔවුන් සිය මවු රටේ දී බුදුදහම පිළිබඳ අවබෝධයක් ලබා සිටි බවට සැකයක් නැත. මෙම ආගම මහායානය වේ. නොයෙක් බුදුවරු එහි සිටිති. මේ සියලු බුදුවරුන්ගේ ඒකාබද්ධ ප්‍රතිමූර්තිය වූයේ ශාක්‍යමුනි හෙවත් ගෞතම බුදුන් වහන්සේ ය.

කොරියාවේ පෙක්චේ රාජ්‍යයෙන් එවන ලද බුදු පිළිමය එවකට සිටි ජපන් අධිරාජයාගේ ප්‍රසාදයට ලක් විය. එය සිය රාජ සභාවට ඉදිරිපත් කර තීරණයක් ගැනීමට සිදු විය. මොනෙබෙ හා නකතොමි කණ්ඩායම් පාරම්පරික ෂින්තෝ අනුගාමිකයෝ වූහ. බෞද්ධ ආගම පිළිගැනීම නිසා දේශීය දෙවිවරුන් කෝපයට පත් ව රටට විපතක් කරනු ඇතැයි ඔවුහු තර්ක කළහ. එහෙත් සෝගාවරු නව දහම පිළිගැනීම යෝග්‍ය යැයි තර්ක කළහ. ගැටලුවකට මැදි වූ අධිරාජයා, බුදු පිළිමය සෝගාවරුන්ට භාර කොට පුද පූජා කරන ලෙස උපදෙස් දුන්නේ ය. මෙහිදී බුදුපිළිමයට පූජා පවත්වන්නට භික්ෂුණීහු ද පටන් ගත්හ.

එකල ජපානය පුරා පැතිරී ගිය වසංගත රෝගයකින් මිනිස්සු විශාල වශයෙන් මරණයට පත් වූහ. මෙය ප්‍රයෝජනයට ගත් බුද්ධාගමට විරුද්ධ වූ පාරම්පරික රදලයෝ තමන් කී පරිදි ම දෙවියන් කෝපව මේ විපත් සිදු කරන්නේ යැයි රජුට පෙන්වා දුන්හ. එවිට බුදු පිළිමය ද විහාරය ද ගිනිබත් කෙරිණි. එහෙත් වසංගත රෝගය කෙළවර නොවීය. ඒ අතර රජ මාලිගයේ කොටසක් ද ගිනි බත් වූයේ ය. බුදු පිළිම හෝ බුදුදහම විපතට හේතු නොවී යැයි තේරුම් ගත් රජ පිළිමයට නැවතත් පුද පූජා කිරීමට සෝගාවරුන්ට අවස්ථාව සලසා දුන්නේ ය. මේ අතර සෝගාවරු සෙසු ගෝත්‍ර අභිබවා දේශපාලන වශයෙන් බලවත් වූහ. ජපානය පුරා බෞද්ධ වෙහෙර විහාර ඉදිකරන්නටත් කොරියාවෙන් තව තවත් භික්ෂු-භික්ෂුණීන් වහන්සේලා ගෙන්වා ගන්නටත් පටන් ගත්හ. බුදු සමය ජපානයට පිවිසියේ එපරිද්දෙනි.

### 5.8.2 ජපානයේ බුදුදහම ව්‍යාප්ත වීම

ජපානයට පිවිසි බුදුදහම ස්ථාවර වන්නට වූයේ හතරවන සියවසේ සුයිකෝ අධිරාජිනියගේ කාලයෙහි (592 - 628) ය. මේ අධිරාජිනිය යටතේ සියලු පරිපාලන කටයුතු කරගෙන ගියේ ෂෝතොකු කුමරු ය. භක්තිමත් බෞද්ධයෙකු වූ ඔහු බුදුදහම විෂයෙහි කළ උසස් මෙහෙවර නිසා ම ජපානයේ අශෝක ලෙස ද හැඳින්වෙයි. ජපන් ජාතිකයින් ත්‍රිවිධ රත්නයට භක්තිමත්ව ගෞරව කළ යුතු යැයි ඔහු නියෝග කළේ ය.

බුදුදහම ජපානයට හඳුන්වා දුන් අවදියේ එය ව්‍යාප්ත වූයේ ලෞකික සැප සම්පත් හා අපල උවදුරු දුරු කිරීමේ මහානුභාව සම්පන්න සූත්‍ර සමූහයක් වශයෙනි. එය ජීවන දර්ශනයකින් යුත් අගය කළ යුතු ආචාර ධර්ම පද්ධතියක් ලෙස ජපානයට හඳුන්වා දුන්නේ ෂෝතෙකු කුමරු විසිනි. බෞද්ධ විවරණ ග්‍රන්ථ කීපයක් ද රචනා කළ ඔහු විහාරාරාම රාශියක් ජපානය පුරා ඉදි කරවී ය. සුප්‍රසිද්ධ ෂී කෙන්තොජි (චතුර්වේද රාජ) විහාරය ෂෝතොකු කුමරුගේ උනන්දුවෙන් ගොඩනැගුණකි. වර්තමාන ඔසාකා නගරයේ ජනාකීර්ණ වීදි ප්‍රදේශ හඳුන්වනු ලබන්නේ මෙම විහාරයේ නමිනි. ෂෝතෙකු කුමරුගේ විශිෂ්ට සේවාව නිසා ජපන් බෞද්ධයින් විසින් ඔහු අදත් අවලෝකිතේශ්වර බුදුන්ගේ අවතාරයක් ලෙස පුදයි.

## ක්‍රියාකාරකම

ෂෝතොකු කුමරුගෙන් ජපන් බුදු දහමේ දියුණුවට ඉටු වූ සේවා දෙකක් ලියන්න

ජපන් බෞද්ධ ඉතිහාසයේ මීළඟ වැදගත් අවදිය එළඹියේ ක්‍රි. ව. අටවන සියවසේ හාරා යුගයේ දී ය. මේ යුගයේ වැදගත් අධිරාජයකු වූ ෂෝවූ බුදු සමය රාජ්‍ය ආගම බවට පත් කළේ ය. තව ද ඔහු විසින් හාරාහි තෝදයිජි ආරාමයේ යෝධ දයිබුත්සු බුද්ධ ප්‍රතිමාවක් ද කරවන ලදී.



රූපය 5.7 දයිබුත්සු බුද්ධ ප්‍රතිමාව

මෙම රජු දවස භික්ෂු-භික්ෂුණීන් උදෙසා රට පුරා කොකුබුන්ජි නමින් ආරාම පද්ධතියක් ද ඉදි කරවීය. මෙමගින් ජනතාව එකමුතු කිරීම රජුගේ අරමුණ වුවත් මේවාහි වැඩ විසූ භික්ෂු-භික්ෂුණීහු රාජ්‍ය අනුග්‍රහය නිසා ම විනය අතින් පිරිහුණු පිරිසක් බවට පත් වූහ. එය ඉඩම් හිමි ධනපති පන්තියක ස්වරූපයක් ඉසිලීය යි සඳහන් වේ.

මෙසේ බලවත් වූ භික්ෂු-භික්ෂුණීන් රාජ්‍ය පරිපාලනය කෙරේ ඇති කළ බලපෑම හේතු කොට ගෙන රාජධානිය කියෝතෝවට (ටෝකියෝ) ගෙන යන්නට පවා සිදු විය.

නව අගනුවර ආරාම ඉදි කිරීම පිළිබඳ ව සීමාවන් පනවා තිබුණ ද ජනතාව තුළ වූ ආගමික උද්ඝෝෂණ හේතුකොට ගෙන එය අසාර්ථක ප්‍රයත්නයක් විය. තරුණ භික්ෂූන් වහන්සේලා කියෝතෝව අසල ආරාම ඉදිකළ නමුත් ඊට රජුගේ විරෝධයක් එල්ල නොවී ය.

ජපානය තුළ කෙමෙන් වැඩී දියුණුවට පත් වූ බුදු සමයෙහි විශේෂ සිදුවීමක් ක්‍රි. ව. දහවන සියවසේ දී සිදු වූයේ ය. එකී විශේෂත්වය වූයේ ජපන් ජන ජීවිතය කෙරේ බලපෑමක් ඇති කළ සෙන් බුදු සමය බිහිවීම යි.

සෙන් බුදුදහම මුලින් ම බිහි වූයේ චීනයේ ය. එයට දායක වූයේ බෝධිධර්ම නම් ඉන්දීය භික්ෂුවයි. 1211දී චීනයට ගොස් සෙන් බුදුදහම මැනවින් හැදෑරූ එයිසයි සහ දෝගෙන් නම් භික්ෂූන් වහන්සේලා ජපානයට සෙන් දහම ගෙන ආහ. ''සෙන් බුදුදහම ආත්මාවබෝධය යි'' යන්න ථේරවාදී බුදුදහමේ ඉගැන්වෙන ස්වයං අවබෝධය යන්න හා තරමක් දුරට සැසඳෙන බව බොහෝ දෙනෙකුගේ විශ්වාසය වේ. ථේරවාදී ඣාන හෙවත් ධ්‍යාන යන්න සෙන් බවට පත් වී ඇත. වර්තමානයෙහි ජපානය පුරා පිහිටි සෙම්මොන් දෝපෝ නමින් හැඳින්වෙන සෙන් භාවනා මධ්‍යස්ථාන එහි ජනයා අතර අතිශයින් ම ජනප්‍රිය වී ඇත.

ජපානය තුළ වර්තමානය වන විට භික්ෂු නිකාය ගණනාවක් ඇත. මෙසේ ජපානයේ සංවර්ධනය වූ සෙන් බුදුදහම වර්තමාන කොරියාව ප්‍රමුඛ රටවල ප්‍රධාන ආගමික සංවිධානය බවට පත්ව ඇත.

## ක්‍රියාකාරකම

සෙන් බුදුදහම මගින් ජපන් සමාජයට ලබා දුන් දායාද පෙන්වා දෙන්න.